# ගුරු මාර්ගෝපදේශය
# ක්‍රිස්තියානි ධර්මය

(2026 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)

# 1
## පළමුවන ශ්‍රේණිය

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
www.nie.ac.lk

මුද්‍රණය හා බෙදාහැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

# ගුරු මාර්ගෝපදේශය

# ක්‍රිස්තියානි ධර්මය

**(2026 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)**

## 1 ශ්‍රේණිය

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
www.nie.ac.lk

ක්‍රිස්තියානි ධර්මය
ගුරු මාර්ගෝපදේශය
1 ශ්‍රේණිය

ප්‍රථම මුද්‍රණය 2026

©ජාතික අධ්‍යාපන ආයතනය
සියලු ම හිමිකම් ඇවිරිණි.
**ISBN**

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
වෙබ් අඩවිය : **www.nie.ac.lk**

# ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපන පරිවර්තනීය ප්‍රතිසංස්කරණ ප්‍රයත්නය සෑම ඉගෙනුම් ලාභියෙකුගේ ම අවශ්‍යතා සපුරාලීම සඳහා තීරණාත්මක මාවතක් අරමුණු කර ඇත.

නිපුණතා පාදක ඉගෙනුම, විචාරාත්මක චින්තනය, නිර්මාණශීලීත්වය, විසි එක් වන සියවසේ කුසලතා, තාක්ෂණික නැඹුරුව, සදාචාරාත්මක පුරවැසි භාවය, වැනි බොහෝ අංශ අවධාරණය කිරීමට හැකි වන පරිදි විෂයමාලාව, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම සහ තක්සේරු පිළිවෙත් යනාදිය නවීකරණය මෙම ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියෙහි පදනම විය.

අධ්‍යාපනඥයින්, අන්තර්වෛෂයික විද්වතුන්, ගුරුවරුන් සහ විවිධ පාර්ශ්වකරුවන් සමග සහයෝගී සංවාදයක් ඔස්සේ ජාතික අධ්‍යාපන ආයතනය මගින් 2026 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට යෝජිත විෂයමාලා හා අදාළ ඉගෙනුම් ද්‍රව්‍යවල ගුණාත්මක භාවය සහතික කිරීම සඳහා විශේෂ උනන්දුවක් ගෙන කටයුතු කළ ගරු අග්‍රාමාත්‍යතුමිය, අධ්‍යාපන ලේකම්තුමා, අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරුන්, විෂය භාර නිලධාරීන්, විභාග කොමසාරිස් ජනරාල් හා කාර්ය මණ්ඩලය, අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් හා කාර්ය මණ්ඩලය දැක්වූ දායකත්වය අති මහත් ය.

එමෙන්ම මෙම කාර්යයේදී විශේෂ කැපවීමක් සිදු කළ ජාතික අධ්‍යාපන ආයතනයේ පාලක සභාවේ හා ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ කැපවීම ද ගෞරව පූර්වක ස්තුතියෙන් සිහිපත් කරමි, මෙම කාර්යය සාක්ෂාත් කර ගැනීමට ඉමහත් ලෙස කැප වූ ජාතික අධ්‍යාපන ආයතනයේ සියලු කාර්ය මණ්ඩලයට ජාතියේ ගෞරවය හිමි විය යුතු බව සඳහන් කරමි.

**මහාචාර්ය මංජුලා විතානපතිරණ**
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය

සමස්ත පාසල් විෂයමාලාව සඳහා හඳුනා ගෙන ඇති පුළුල් ඉගෙනුම් ක්ෂේත්‍ර නිරන්තරයෙන් වෙනස් වන රටක සහ ලෝකයක තිරසර සංවර්ධනය කෙරෙහි වන අභියෝග ජය ගැනීමට එම ජාතියට ඇති හැකියාව පිළිබිඹු කරයි. එමෙන්ම කලින් කලට වෙනස් වන ඉල්ලුම්වලට ගැළපෙන සේ පුළුල් ඉගෙනුම් ක්ෂේත්‍ර ද හඳුනා ගෙන ඇත. එසේ ම පවතින පාසල් විෂයමාලාවෙහි විෂයයන් නවීකරණය වන අතර ම නව විෂයයන් පාසල් විෂයමාලාවට හඳුන්වා දීම සිදු කරයි. මෙම සිදු වන වෙනස්කම්වලට අනුරූප ව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ද කාලානුරූප ව සංවර්ධනය වෙයි. ඒ අනුව 2026 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන නව විෂයමාලාවට අදාළ ව සෑම පාසල් විෂයයක් සඳහා ම ඉගෙනුම් ද්‍රව්‍ය හඳුන්වා දී ඇත.

2026 වර්ෂයේදී 1 ශ්‍රේණිය සඳහාත් 2027 වර්ෂයේදී 2 ශ්‍රේණිය සඳහාත් 2028 වර්ෂයේදී 3 ශ්‍රේණිය සඳහාත් 2029 වර්ෂයේදී 4 ශ්‍රේණිය සඳහාත් 2030 වර්ෂයේදී 5 ශ්‍රේණිය සඳහාත් ප්‍රාථමික අධ්‍යාපන ශ්‍රේණි සඳහා නව විෂයමාලා හඳුන්වා දීමට නියමිත ය. ප්‍රාථමික අධ්‍යාපන අවධියේ සිසුන් සඳහා ක්‍රියාකාරකම් පොත් සකස් කර ඇති අතර ඒ සඳහා අවශ්‍ය මග පෙන්වීම ගුරුවරයාගෙන් සිදු කෙරෙයි. ගුරුවරුන්ට ලබා දෙන උපදෙස් ගුරු මාර්ගෝපදේශවල ඇතුළත් කර ඇති අතර සිසුන්ට අවශ්‍ය සංකල්ප පිළිබඳ දැනුම මෙන් ම ලබා ගත් දැනුම භාවිත අවස්ථාවලට යොමු කර සිසු හැකියා සංවර්ධනයට මෙම විෂයමාලාව බෙහෙවින් උපකාර වන බව අපගේ විශ්වාසයයි. විසි එක්වන සියවසේ කුසලතා සංවර්ධනයටත් එමගින් සිසු පෞරුෂය සංවර්ධනයටත් හඳුන්වා දෙනු ලබන විෂයමාලාවේ ඇතුළත් ක්‍රියාකාරකම් මනා පිටුබලයක් වනු ඇත.

නව විෂයමාලා ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට මූලික කටයුතු කළ අධ්‍යාපන අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරුන්ගේ හා ජාතික අධ්‍යාපන ආයතනයේ හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරුන්ගේ සේවාව ඉතා අගය කරමි. තව ද මෙම විෂයමාලා ද්‍රව්‍ය සකස් කිරීමේදී දායක වූ ආයතනයේ සියලු ම කාර්ය මණ්ඩලයට ද ගුරුවරුන්, ගුරු උපදේශකවරුන්, අධ්‍යක්ෂවරුන් මෙන් ම රාජ්‍ය සහ පෞද්ගලික ආයතනවල විවිධ ක්ෂේත්‍ර ඔස්සේ ලබා දෙන ලද දායකත්වය මෙම ඉගෙනුම් ද්‍රව්‍ය ගුණාත්මක ව ඉහළ මට්ටමකට සංවර්ධනය වීමට ඉවහල් වූ බව ඉතා සතුටින් සිහිපත් කරමි.

**ආචාර්ය එස්. ඒ. ඩී. සමරවීර**
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

## විෂයමාලා දායකත්වය

**උපදේශකත්වය :**

| | |
|---|---|
| මහාචාර්ය, මංජුලා විතානපතිරණ | අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය |
| ආචාර්ය, දර්ශන සමරවීර | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්,<br>භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය,<br>ජාතික අධ්‍යාපන ආයතනය |

**අධීක්ෂණය :**

| | |
|---|---|
| ආර්.එම්.කේ. ද සිල්වා | අධ්‍යක්ෂ, මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික<br>අධ්‍යාපන දෙපාර්තමේන්තුව<br>ජාතික අධ්‍යාපන ආයතනය |

**විෂයය සම්බන්ධීකරණය :**

| | |
|---|---|
| ලක්මාලි ආනන්දගොඩ | සහකාර කථිකාචාර්ය (අනුයුක්ත)<br>ජාතික අධ්‍යාපන ආයතනය |

**ලේඛක මණ්ඩලය :**

| | |
|---|---|
| ආචාර්ය එම්. රධිකා සමන්ති මෙන්ඩිස් | ගුරු සේවය ශා.තෝමස් විදුහල |
| එස්. පී. සී.ප්‍රනාන්දු | ගුරු සේවය වෙස්ලි විදුහල කොළඹ 06 |
| එම්. අයි. එන්. එෆ්. සේනාරත්න | ගුරු උපදේශක (ක්‍රිස්තියානි ධර්මය)<br>කලාප අධ්‍යාපන කාර්යාලය මීගමුව |
| සකුන්තලා කාමන් රොඩ්රිගෝ | ගුරු සේවය ශ්‍රී ජයවර්ධනපුර විද්‍යාලය කෝට්ටේ |
| හිරන්ති සජීවනි පෙරේරා | ගුරු සේවය, රදගුරු විදුහල කොළඹ 03 |
| අරුණි ඉන්දිකා පෙරේරා ජයතුංග | ගුරු සේවය, රදගුරු විදුහල කොළඹ 03 |

**සංස්කරණය :**

| | |
|---|---|
| ගරු රෝහිත ද සිල්වා දේවගැතිතුමා | බාහිර කථිකාචාර්ය<br>ලංකා දේවධර්ම ශාස්ත්‍රාලය, පිළිමතලාව |

**භාෂා සංස්කරණය :**

| | |
|---|---|
| ඩබ්ලිව්. කරුණාරත්න | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>ගුරු වෘත්තිය සංවර්ධන මධ්‍යස්ථානය, ගිරාගම |

**පිටකවරය හා චිත්‍ර නිර්මාණය :**

| | |
|---|---|
| ඩී.කේ.එම්.හෙට්ටිගේ | ගුරු සේවය වෙස්ලි විදුහල කොළඹ 06 |

**පරිගණක අක්ෂර සංයෝජනය :**

| | |
|---|---|
| කාංචනා ආර්. පද්මපෙරුම | ජාතික අධ්‍යාපන ආයතනය |

# පටුන


| | |
|---|---|
| ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය | iii |
| පෙරවදන | iv |
| විෂයමාලා දායකත්වය | v |
| පටුන | vii |
| හැඳින්වීම | viii |
| විෂය නිර්දේශය | vix |
| අන්තර්ගතය - පළමුවන වාරය | 1 |
| අන්තර්ගතය - දෙවන වාරය | 20 |
| අන්තර්ගතය - තුන්වන වාරය | 42 |

# ආගම් හා සාරධර්ම අධ්‍යාපනය ප්‍රාථමික අධ්‍යාපනය

## හැඳින්වීම

සංස්කෘතික වශයෙන් විවිධ වූ සමාජයක ආගම ඉගැන්වීම සංවේදී කාරණයකි. විවිධ ආගම්වල දාර්ශනික හා ප්‍රායෝගික අංශවල විවිධ වෙනස්කම් තිබේ. එබැවින් ප්‍රධාන වශයෙන් ඔවුන්ගේ ම ආයතනික සැකැස්ම තුළ විවිධ ආගමික ක්‍රියාකාරකම් හේතුවෙන් ඔවුන්ව තනි වේදිකාවකට ගෙන ඒම අපහසු ය. ජාතික ආර්ථිකයට, සංවර්ධනයට සහ සංහිඳියාවට ද එය අහිතකර අයුරින් බලපා ඇත. එමනිසා වෙනස් ප්‍රවේශයකින් දරුවකුගේ වයසට සරිලන ආගමික අධ්‍යාපනය නිවැරදිව ලබා දීමෙන් සුචරිතවත් පුද්ගලයකු කටයුතු කිරීම ජාතික අවශ්‍යතාවක් ව පවතී. ඒ අනුව, ආගම් සහ සාරධර්ම අධ්‍යාපනය සඳහා වූ ජාතික විෂයමාලා රාමුවේ ප්‍රධාන අරමුණ වන්නේ ජාතික අධ්‍යාපනයට ආගම් සහ සාරධර්ම අධ්‍යාපනය උපකාර වන ආකාරය පෙන්වීමයි.

ආගම් සහ සාරධර්ම අධ්‍යාපනයේ අවසාන අරමුණ වන්නේ දරුවෙකුගේ වයසට සරිලන පරිදි ආගමික අධ්‍යාපනයක් ලබා දීමයි. කුමන ආගමකට අයත් වුව ද හිස, හදවත, අත, මනස සමග සමපාත වන පරිදි ආකල්ප සංවර්ධනය කිරීම තුළින් අනාගත ලෝකය ජයගත හැකි විනය ගරුක නිර්මාණශීලී පුද්ගලයකු සමාජයට දායාද කිරීම අවශ්‍යය වේ.

ප්‍රධාන සමාජ-ආගමික සංකල්ප පහක් යටතේ ගොඩනගා ඇති මෙම ආගම් සහ සාරධර්ම අධ්‍යාපනය සඳහා වන විෂයමාලා රාමුවෙන් ආධ්‍යාත්මික සංවර්ධනයට මෙන් ම පුද්ගල සංවර්ධනයට ද අවශ්‍ය මූලික කුසලතා ගොඩනැඟීම අපේක්ෂා කෙරේ. ඒ අනුව මෙම විෂයමාලා රාමුවෙන් බලාපොරොත්තු වන්නේ අනාගත අභියෝගවලට උද්යෝගයෙන් සහ ධෛර්ය සම්පන්නව මුහුණ දිය හැකි කාර්යක්ෂම නව්‍ය පුද්ගලයන් සමාජයට දායාද කිරීම සඳහා අවශ්‍ය පදනම ප්‍රාථමික අධ්‍යාපනයේ සිට ම ගොඩනැඟීමයි.

ප්‍රාථමික අධ්‍යාපනය සඳහා ක්‍රිස්තියානි ධර්මය විෂය නිර්දේශ සැකසීමේදී අදාළ ශ්‍රේණියේ ඉගෙනුම ලබන සිසුන්ගේ වයස් මට්ටම, පරිණතිය, භාෂා හැකියා, රුචිකත්ව හා ළැදියා කෙරෙහි සැලකිලිමත් වී තිබේ. අදාළ ඉගෙනුම් පල අත්පත් කර ගැනීම සඳහා ප්‍රායෝගික ජීවිතයේදී අද්දැකීම් ලද හැකි ආකාරයේ ක්‍රියාකාරකම්වල නිරතවීමට අවස්ථා සම්පාදනය කර දී ඇත.

ආගම් හා සාරධර්ම අධ්‍යාපන - ප්‍රාථමික අධ්‍යාපනයේ කිතුනු දරුවෙකුගේ ආගමික හැඟීම්වල හරය විය යුත්තේ ඇදහිල්ල ප්‍රීතිය ක්‍රිස්තුස්වහන්සේට අයිති වීමයි. සියලු යහපත් දේ දෙවි පියාණන් වහන්සේගෙන් ලැබෙන බව දැන ගැනීමෙන් ඇදහිල්ල හා ප්‍රීතිය ජනිත වේ. මෙහිදී නිරායාසයෙන් දෙවි පියාණන්ට ස්තුති කිරීමට හා යාච්ඤා කිරීමට යොමු විය යුතුය. මෙම අරමුණ කෙරෙහි මෙන් ම දේව නිර්මාණ වන අවට පරිසරය සුරැකීම ආගමික වතාවන්ට හුරු වීම සහ ආචාර ධර්ම ජීවිතවලට එකතු කර ගැනීම වැනි කරුණු කෙරෙහි ද අවධානය යොමු කරමින් මෙම විෂය නිර්දේශය සැකසී ඇත.

සිසුන්ගේ ජීවිතවලට ආදර්ශයක් වන පරිදි තමා ද ක්‍රිස්තුස්වහන්සේ තුළ ජීවිත ගොඩනගා ගැනීම ගුරුවරුන්ගේ වගකීමකි. සැම ගුරුවරයකු විසින් ම නම්‍ය කාල සටහනක් ක්‍රියාත්මක කිරීම මගින් සිසුන්ට වඩාත් හිතකර ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කරගත හැකි ය.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

ප්‍රාථමික ශ්‍රේණිවල කිතු දහම ඉගැන්වීමේදී කුඩා දරුවන් ප්‍රිය කරන ආගමික ජීවිතය හා සමීප ක්‍රියාකාරකම් බහුල ලෙස යොදා ගත යුතු වේ. දෙවි පියා දුන් දීමනා හා ලෝකය මෙන් ම ආදරය රැකවරණය අද්දැකීමට සැලැස්විය යුතු වේ. එසේම දෙව් මැදුරට යාම ආගමික කටයුතුවල යෙදීම කිතුනු පවුලක් ගොඩනැඟීම මේ අතර ප්‍රධාන තැනක් ගනී. බයිබල් කථා ආශ්‍රිත ව ජේසුස්වහන්සේගේ ජීවිත ගුණාංග ආදර්ශය ගැනීමට මෙන් ම ශුද්ධාත්මයාණන්ගේ ගුණාංග බෙදා ගැනීමට යොමු කිරීම ද කළ යුතුය.

මේ හා සම්බන්ධ ගායනා, රංගන, චිත්‍ර ඇඳීම වැනි සෞන්දර්ය මුසු ක්‍රියාකාරකම්වල සිසුන් නිරත කරවීමට ද නිරන්තරයෙන් අවධානය යොමු කළ යුතු වෙයි. එවිට ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය වින්දනයක් ගෙන දෙන ඉතා ම සුන්දර අද්දැකීමක් වෙමින් ක්‍රිස්තියානි ධර්මය ඉගෙනීමේ දැඩි ආශාවක් දරුවන් තුළ ඇති වනු නොඅනුමාන ය.

### පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන්

පාසල් සංස්කෘතිය හා සම්බන්ධ වැඩසටහන්වලින් ක්‍රිස්තියානි ධර්මය විෂයට අදාළ සංකල්ප බොහොමයක් ගොඩනැගිය හැකි ය. පාසල් සංස්කෘතිය තුළ මෙම සංකල්ප ගොඩනැගෙන නව අංග නිර්මාණය කෙරෙහි විදුහල්පතිවරුන්ගේ සුවිශේෂ අවධානය යොමු කිරීම අපේක්ෂා කෙරේ. ප්‍රාථමික පාසල සඳහා ක්‍රියාත්මක වන උදය ආගමික වැඩසටහන් මේ අතර ප්‍රධාන තැනක් ගනියි. මෙම වැඩසටහන පළමුවන ශ්‍රේණියේදී ඉතා සරල ව අරඹා පස්වන ශ්‍රේණිය තෙක් ක්‍රමයෙන් දියුණු කරමින් විවිධ අංග එක් කළ හැකි යි.

ගුරුවරයා විසින් තම සිසුන් වාරයකට එක් වතාවක් හෝ දේවස්ථානයට රැගෙන යා යුතු ය. එහිදී කෙරෙන වතාවත් ඇසුරින් සිසුන් තුළ ශ්‍රද්ධාව ජනිත වෙයි. මෙම ක්‍රියාකාරකම් මගින් ගිහි - පූජක සම්බන්ධතාව ද වර්ධනය වී යහපත් සමාජයක් බිහි වීමට එය ද හේතුපාදක වනු ඇත.

පුද්ගල පවිත්‍රතාව, විනීත බව, කරුණාව, දයාව, ආශීර්වාද ඇසුරෙන් ගොඩනැගෙන සමානාත්මතාව, සුහදත්වය, සහයෝගය ආදි ලක්ෂණවලින් පාසල් සංස්කෘතිය පෝෂණය වී ඇත. එවැනි සංස්කෘතියක් තුළ ආගම් හා සාරධර්ම විෂයයෙන් අපේක්ෂිත අත්‍යවශ්‍ය ඉගෙනුම් සංකල්ප තහවුරු කිරීම ඉතා පහසු වේ. එවැනි වාතාවරණයක් ඇති කල්හි විෂය තුළදී ඉගෙන ගන්නා සියල්ල ප්‍රායෝගික භාවිතයට ද අවස්ථා උදා වේ.

## තක්සේරු කිරීම

ප්‍රාථමික ශ්‍රේණිවලදී ප්‍රමුඛත්වය දිය යුතු වන්නේ ලිඛිත පරීක්ෂණ වැනි ඇගයීම්වලට වඩා ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරු කර ගත් ඇගයීම්වලට ය. නිරීක්ෂණය, ගවේෂණය, ක්ෂේත්‍ර චාරිකා, අභිනය, නාට්‍ය, රූකඩ, සාකච්ඡා, වාචික ප්‍රශ්න වැනි ඇගයීම් ක්‍රම ශිල්ප මේ සඳහා උචිත වෙයි.


## ආගම් හා සාරධර්ම විෂයයේ අරමුණ

තිරසාර සාම සංවර්ධනයක් සාක්ෂාත් කර ගැනීම සඳහා පුළුල් අවබෝධයක් ඇති විවිධත්වයට ගරු කරන චිත්තවේගීය ව සමතුලිත, ප්‍රජාතන්ත්‍රවාදී සහ විනයගරුක ගෝලීය පුරවැසියකු නිර්මාණය කිරීම

## ආගම් හා සාරධර්ම විෂයය ඉගෙනීමේ අභිමතාර්ථ

1. දැහැමි, විනයගරුක සහ චිත්තවේගීය වශයෙන් සමතුලිත වූ පුරවැසියන් බිහි කිරීම
2. මානව වටිනාකම් මත පදනම් වූ විවිධ චාරිත්‍ර වාරිත්‍ර පිළිවෙත් සහ සම්මතයන් අගය කිරීම
3. අප අවට ඇති වෙනස්කම් තාර්කික ව පිළිගනිමින් සහ ගරු කරමින් සමාජ සහජීවනය ශක්තිමත් කිරීම
4. අභ්‍යන්තර සාමය සහ ආධ්‍යාත්මික සතුට භුක්ති විඳීම සහ බෙදා ගැනීම
5. පුද්ගල සහ විවිධ සමාජ අතර සෞඛ්‍ය සම්පන්න සබඳතා ප්‍රවර්ධනය කිරීම
6. සමාජ-සංස්කෘතික සහ පාරිසරික සංවේදිතාවන්ට දායක වෙමින් අභියෝග සමග ධනාත්මක ලෙස කටයුතු කිරීම

## ආගම් හා සාරධර්ම විෂයයේ අත්‍යවශ්‍ය ඉගෙනුම් සංකල්ප



| ආගම් හා සාරධර්ම අධ්‍යාපනයේ අත්‍යවශ්‍ය මූලික සංකල්ප | |
|---|---|
| චරිත සංවර්ධනය | ඕනෑම අභියෝගයක්ජය ගැනීමේ හැකියාවකින් යුතු ධනාත්මක ආකල්ප පෝෂණය කිරීම මෙන් ම ශාරීරික, මානසික, සමාජීය හා චිත්තවේගීය වශයෙන් මනා පෞරුෂයකින් යුතු පුද්ගලයෙකුගේ පදනම සැකසීම |
| සමාජීය හා සංස්කෘතික සංවේදීතාව | ආගම් හා සංස්කෘතික භේදයෙන් තොරව සැම දෙනා සමග ම සුහදශීලීත්වයෙන් හා දැනුවත් බවෙන් අවබෝධයෙන්, පිළිගැනීමෙන් මෙන් ම වෙනස් සමාජ සංස්කෘතික පසුබිම් පිළිබඳ සංවේදී වෙමින් කටයුතු කිරීමේ හැකියාව |
| පාරිසරික සංවේදීතාවය | පාරිසරික සංවේදීතාව මගින් පුද්ගලයෙකුට ඔවුන්ගේ පරිසරය පිළිබඳ තොරතුරු අවබෝධ කර ගැනීමට සහ සැකසීමට ඇති හැකියාව විස්තර කෙරේ. එය සැම ආගමික දර්ශනයක ම පාහේ දක්නට ලැබෙන මූලික ලක්ෂණයකි. එය තීරණාත්මක සාධකයක් වන්නේ එය පුද්ගලයෙකුට විවිධ පාරිසරික තත්ත්වයන්ට අනුවර්තනය වීමට ඉඩ සලසන බැවිනි. |
| ආචාරධර්ම, සාරධර්ම හා සම්මතයන් | තිරසර සමාජ යහපැවැත්මකට අත්‍යවශ්‍ය වන පිළිගත් සමාජ, සංස්කෘතික හා ආගමික වටිනාකම්, ප්‍රතිපත්ති, ආචාරධර්ම, සාරධර්ම හා සම්මත ඇසුරෙන් ජීවිතය හැඩගස්වා ගැනීම |
| සතිමත්බව සෞඛ්‍යය හා යහපැවැත්ම | ශාරීරික හා මානසික සමබරතාව පවත්වා ගනිමින් ආතතියකින් තොරව නිරෝගි ජීවිතයක් සඳහා නිරන්තරයෙන් යහපත් සිහිය පවත්වා ගැනීම. |

| ආගම් හා සාරධර්ම<br>ප්‍රාථමික අධ්‍යාපනය සඳහා මූලික සංකල්පවලට අදාළ විස්තර වාක්‍ය | |
|---|---|
| චරිත සංවර්ධනය | ගුරුවරුන්ගේ හා වැඩිහිටියන්ගේ මග පෙන්වීම යටතේ 'ආගම' යන සංකල්පය හඳුනා ගනිමින් සිය චරිතය හා හැසිරීම් නිවැරදි ව හැඩගස්වනු ලබන සරල ආගමික ක්‍රියාකාරකම්වල නියැළේ. |
| සමාජයීය හා සංස්කෘතික සංවේදීතාව | තමා ජීවත් වන බහු ආගමික වටපිටාව තුළ පවතින ආගම් මත පදනම් වූ උත්සව, ඇඳුම් පැලඳුම්, ආචාර සමාචාර ආදිය පිළිබඳ අද්දැකීම් ලබමින් සංස්කෘතික විවිධත්ව පිළිබඳ අවබෝධයෙන් යුතු ව සියලු දෙනා සමග සහයෝගයෙන් කටයුතු කරයි |
| පාරිසරික සංවේදීතාව | ජීවිතය පරිසරය සමග අන්‍යෝන්‍ය වශයෙන් බැඳී පවතින ආකාරය ආගම මගින් තේරුම් ගනිමින් පරිසරය කෙරෙහි සංවේදී ව කටයුතු කරයි. |
| ආචාරධර්ම, සාරධර්ම හා සම්මත | ආගම්වලට අදාළ ව සිදු කරන වත්පිළිවෙත්, වන්දනාමාන හා භාවිත කරන සුවිශේෂ වචන පිළිබඳ අවබෝධයෙන් යුතු ව කටයුතු කරයි.<br>ආගමික ස්ථානවලට සුදුසු ඇඳුම් පැලඳුම් භාවිතයටත්, නිවැරදි හැසිරීම් පවත්වා ගැනීමටත් කටයුතු කරයි.<br>යහපත් දරුවකු ලෙස පිළිපැදිය යුතු යහපුරුදු, සිරිත් විරිත් අනුගමනය කරමින්, ආචාර ධර්ම සාරධර්ම සම්මතයන් මත පිහිටමින් අන්‍යයන් සමග සහයෝගයෙන් හා ගෞරවයෙන් කටයුතු කරයි. |
| සතිමත්බව සෞඛ්‍යය හා යහපැවැත්ම | එදිනෙදා කාර්යයන් සතිමත් ව (Mindfully) කිරීමට පුරුදු පුහුණු වෙමින්, තම කටයුතු නිරවුල් ව හා ප්‍රීතිමත් ව සිදු කරයි. හිතකර දෛනික චර්යා රටාවක් සඳහා යහපත් සෞඛ්‍ය පුරුදු අනුගමනය කරයි. |

## 1 ශ්‍රේණිය  ආගම් හා සාරධර්ම විෂය නිර්දේශය

| සංකල්පය | ඉගෙනුම් පල | කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක |
|---|---|---|---|
| චරිත සංවර්ධනය | 1. චරිත සංවර්ධනයට අදාළ මූලික ආගමික ඇවතුම් පැවතුම් වාග් මාලාව සංකේත හා ආගමික පාඨ ඇසුරින් තම ආගම පිළිබඳ සංකල්පය හඳුනා ගනියි. | 1.1 ආගමට සුවිශේෂ වූ අවස්ථාවන්වලට සහභාගි වී අද්දැකීම් ලබයි. | 1.1.1 සහභාගි වීම |
| | | 1.2 ආගමට සුවිශේෂ වූ වදන් උචිත අවස්ථාවන්හිදී භාවිත කරයි. | 1.2.1 සුවිශේෂ ආගමික වදන් හඳුනා ගැනීම<br><br>1.2.2 උචිත අවස්ථාවන්හිදී භාවිත කිරීම |
| | | 1.3 ආගමට අදාළ මූලික සංකේත හඳුනා ගනියි. | 1.3.1 සංකේත හඳුනා ගැනීම |
| | | 1.4 ආගමික පාඨ හඳුනාගෙන භාවිත කරයි. | 1.4.1 ආගමික පාඨ හඳුනා ගැනීම<br><br>1.4.2 ආගමික පාඨ භාවිත කිරීම |
| | 2. ආගමික ශාස්තෘවරයා/ නිර්මාතෘවරයා පිළිබඳ කතන්දර/ ආගමික කතන්දර හා උපදේශ කාව්‍ය ඇසුරෙන් චරිත සංවර්ධනයට අදාළ සුවිශේෂ ගුණාංග හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | 2.1 ආගමික කතන්දරවලට කැමැත්තෙන් සවන් දෙයි. | 2.1.1 ආගමික කතන්දරවලට සවන්දීම |
| | | 2.2 ආගමික කතන්දර ඇසුරෙන් ආගමික ශාස්තෘවරයාගේ සුවිශේෂ ගුණාංග ප්‍රකාශ කරයි. | 2.2.1 සුවිශේෂ ගුණාංගයක් ප්‍රකාශ කිරීම |
| | | 2.3 ආගමික කතන්දර ඇසුරෙන් ලබා ගත හැකි ආදර්ශ ප්‍රකාශ කරයි. | 2.3.1 ආදර්ශ ප්‍රකාශ කිරීම |
| | | 2.4 උපදේශ කාව්‍යකට සවන් දී තාලයට ගායනා කරයි. | 2.4.1 උපදේශ කාව්‍යකට සවන්දීම<br><br>2.4.2 තාලයට ගායනා කිරීම |

| | | | |
|---|---|---|---|
| | | 2.5 උපදේශ කාව්‍යක් ඇසුරෙන් ලබා ගත හැකි ආදර්ශ ප්‍රකාශ කරයි | 2.5.1 ආදර්ශ ප්‍රකාශ කිරීම |
| **සමාජයීය හා සංස්කෘතික සංවේදීතාවය** | 3. ආගමික සිද්ධස්ථාන හඳුනාගෙන එම ස්ථානවලදී ගෞරවාන්විත ව හැසිරෙයි | 3.1 තම ආගමික ස්ථානය හඳුනාගෙන නම් කරයි. | 3.1.1 ස්ථානය හඳුනා ගැනීම<br>3.1.2 ස්ථානය නම් කිරීම |
| | | 3.2 ආගමික සිද්ධස්ථානවලදී ආගමානුකූල ව හැසිරෙයි. | 3.2.1 ආගමානුකූල ව හැසිරීම |
| | | 3.3 සුදුසු ඇඳුම, නිවැරදි කතාබහ භාවිත කරයි | 3.3.1 නිවැරදි කතාබහ<br>3.3.2 නිවැරදි ඉරියව් භාවිතය |
| | 4. ආගමික හා සංස්කෘතික උත්සවවලට සහභාගී වී අත්දැකීම් ලබයි | 4.1 සුවිශේෂ ආගමික උත්සවයකට ක්‍රියාකාරී ව සහභාගී වෙයි | 4.1.1 ක්‍රියාකාරීව සහභාගීවීම |
| | | 4.2 සුවිශේෂ සංස්කෘතික උත්සවයකට ක්‍රියාකාරී ව සහභාගී වෙයි | 4.2.1 ක්‍රියාකාරීව සහභාගීවීම |
| | | 4.3 සුවිශේෂ ආගමික හෝ සංස්කෘතික උත්සවයක් ආදර්ශනය කරයි | 4.3.1 ක්‍රියාකාරකම්වල නිරත වීම<br>4.3.2 අදහස් ප්‍රකාශ කිරීම<br>4.3.3 නිර්මාණශීලී බව<br>4.3.4 උපකරණ භාවිතය |

| | | | |
|---|---|---|---|
| ආචාරධර්ම, සාරධර්ම හා සම්මතයන් | 5. පූජනීය ස්ථානවලදී නිවැරදි වත්පිළිවෙත් හා සිරිත් විරිත් අනුගමනය කරයි. | 5.1 පූජනීය ස්ථානවලදී අනුගමනය කළ යුතු නිවැරදි වත්පිළිවෙත් හා සිරිත් විරිත් හඳුනා ගනියි. | 5.1.1 නිවැරදි වත්පිළිවෙත් ප්‍රකාශ කිරීම<br><br>5.1.2 නිවැරදි සිරිත්විරිත් ප්‍රකාශ කිරීම |
| | | 5.2 නිවැරදි වත්පිළිවෙත් හා සිරිත් විරිත් වලට අනුව කටයුතු කරයි. | 5.2.1 කටයුතු කිරීම |
| | 6. ආගමික වතාවත්වල නිරතවීමේදී නිවැරදි වත්පිළිවෙත් සිරිත් විරිත් හා ඉරියවු ප්‍රදර්ශනය කරයි. | 6.1 ආගමික වතාවත්වල නිරතවීමේදී නිවැරදි වත් පිළිවෙත්වල යෙදෙයි. | 6.1.1 නිවැරදි වත් පිළිවෙත්වල යෙදීම |
| | | 6.2 ආගමික වතාවත්වල නිරතවීමේදී නිවැරදි සිරිත්විරිත් අනුගමනය කරයි. | 6.2.1 නිවැරදි සිරිත්විරිත් අනුගමනය කිරීම |
| | | 6.3 ආගමික වතාවත්වල නිරතවීමේදී නිවැරදි ඉරියවු ප්‍රදර්ශනය කරයි. | 6.3.1 නිවැරදි ඉරියවු ප්‍රදර්ශනය කිරීම |
| | | 6.4 ආගමික කටයුතුවලදී අදාළ වචන භාවිත කරයි. | 6.4.1 නිවැරදි වචන භාවිත කිරීම |
| | 7. යහපත් දරුවෙකු ලෙස පිළිපැදිය යුතු ගුණ ධර්ම/ සිරිත් විරිත් අනුගමනය කරයි. | 7.1 යහපත් දරුවෙකු ලෙස පිළිපැදිය යුතු ගුණ ධර්ම හඳුනා ගනියි. | 7.1.1 නිවැරදි ව හඳුනා ගැනීම |
| | | 7.2 යහපත් දරුවෙකු ලෙස පිළිපැදිය යුතු සිරිත්විරිත් හඳුනා ගනියි. | 7.2.1 නිවැරදි ව හඳුනා ගැනීම |
| | | 7.3 යහපත් දරුවෙකු ලෙස කටයුතු කරයි. | 7.3.1 නිවැරදි හැසිරීම |
| පාරිසරික සංවේදීතා වය | 8. තමා අවට පරිසරය පිරිසිදුවට හා පිළිවෙළකට තබා ගැනීමට ක්‍රියා කරයි. | 8.1 තමා අවට පරිසරය පිරිසිදු කිරීමට දායක වෙයි. | 8.1.1 ක්‍රියාකාරී ව සහභාගීවීම |

| | | | |
|---|---|---|---|
| | | 8.2 අවට පරිසරය අලංකාර ව පිළිවෙළකට තබා ගැනීමට කටයුතු කරයි. | 8.2.1 අදහස් ප්‍රකාශ කිරීම<br>8.2.2 නිර්මාණශීලීබව<br>8.2.3 උපකරණ භාවිතය<br>8.2.4 අගය කිරීම |
| | 9. ආගමික ශාස්තෘන් වහන්සේලා සොබාදහමේ වටිනාකම ඉස්මතු කළ ආකාරය පිළිබඳව දැනුවත් වෙමින් ක්‍රියා කරයි. | 9.1 කතන්දර/කවි ඇසුරෙන් සොබාදහමේ වටිනාකම හඳුනා ගනියි. | 9.1.1 අවධානයෙන් සවන්දීම<br>9.1.2 අවබෝධ කර ගැනීම<br>9.1.3 අදහස් ප්‍රකාශ කිරීම |
| | | 9.2 පරිසර සම්පත් අරපිරිමැස්මෙන් භාවිත කරයි. | 9.2.1 අරපිරිමැස්මෙන් භාවිත කිරීම |
| | | 9.3 සතුන්ට ආදරය කරයි. | 9.3.1 ආදරය කිරීම |
| | | 9.4 සතුන්ට ආහාරපාන ලබා දෙයි. | 9.4.1 ආහාරපාන ලබා දීම |
| **සතිමත් බව සෞඛ්‍යය හා යහපැවැත්ම** | 10. හිතකර දෛනික චර්යා රටාවක් සඳහා යහපත් සෞඛ්‍ය පුරුදු අනුගමනය කරයි. | 10.1 යහපත් දින චර්යාවක අනුපිළිවෙළ ප්‍රකාශ කරයි. | 10.1.1 අනුපිළිවෙළ ප්‍රකාශ කිරීම |
| | | 10.2 යහපත් සෞඛ්‍ය පුරුදු අනුගමනය කරයි. | 10.2.1 යහපත් සෞඛ්‍ය පුරුදු අනුගමනය කිරීම |
| | 11. දෛනික ක්‍රියාකාරකම්වලදී මනා සිහියෙන් යුතුව කටයුතු කරයි. | 11.1 ඇවිදීමේදී මනා සිහියෙන් යුතුව ඇවිදියි. | 11.1.1 සිහියෙන් ඇවිදීම |
| | | 11.2 ඇවිදීමේදී යටි පතුලට දැනෙන රළු- සිනිඳු, තෙත- වියළි, උණුසුම-සිසිල්බව හඳුනා ගනිමින් ඇවිදියි. | 11.2.1 රළු- සිනිඳු, තෙත- වියළි, උණුසුම-සිසිල්බව හඳුනා ගැනීම |
| | | 11.3 සරල භාවනාවක (Meditation) යෙදෙයි. | 11.3.1 නිවැරදි ඉරියවු අනුගමනය කිරීම<br>11.3.2 භාවනා කිරීම |

# අන්තර්ගතය
## පළමුවන වාරය


**සංකල්පය  චරිත සංවර්ධනය**

1 වන පාඩම - දෙවිඳුන් මැවූ ලෝකය 01
2 වන පාඩම - සාම කුමරු ජේසුස් 04
3 වන පාඩම - සුදතුම් වැඩීම 06

**සංස්කෘතිය, ශිෂ්ටාචාරය සහ සමාජ සංස්කෘතික සංවේදීතාව**

4 වන පාඩම - මේ අපේ දෙව් මැදුරයි 09

**සංකල්පය  පරිසර සංවේදිතාව**

5 වන පාඩම - ලොව රැක ගනිමු 11

**සංකල්පය  ආචාර ධර්ම, සාරධර්මයන් හා සම්මතයන්**

6 වන පාඩම - ජේසුස්වහන්සේට කතා කරමු 14
7 වන පාඩම - දෙවිඳුන් දුන් මගේ පවුල 16

**සංකල්පය  මානසික සෞඛ්‍ය හා යහපැවැත්ම**

8 වන පාඩම - දෙවිඳුන් යදිමු - දෙව් වදන් කියවමු 18

# සංකල්පය  චරිත සංවර්ධනය
# 01 පාඩම - දෙවිඳුන් මැවූ ලෝකය

දෙවියන්වහන්සේ මේ මුළු විශ්වයේ මැවුම්කරුවාණන් හා රැකවරණයාණන් බව තහවුරු කර ගනිමින් දේව මැවිල්ල හඳුනා ගැනීම සහ ඊට ස්තුතිවන්ත වෙමින් එය රැක ගැනීමට යොමු කරවීම මෙහි අරමුණ වේ.

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්යසාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 2. ආගමික ශාස්තෘවරයා/ නිර්මාතෘවරයා පිළිබඳ කතන්දර හා උපදේශ කාව්‍ය ඇසුරෙන් චරිත සංවර්ධනයට අදාළ සුවිශේෂ ගුණාංග හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | මැවුම්කාර දෙවියන් වහන්සේ | 2.1 ආගමික කතාන්දරවලට කැමැත්තෙන් සවන් දෙයි. | 2.1.1 ආගමික කතන්දරවලට සවන් දීම |
| | | 2.3 ආගමික කතන්දර ඇසුරෙන් ලබාගත හැකි ආදර්ශ ප්‍රකාශ කරයි. | 2.3.1 ආදර්ශයක් ප්‍රකාශ කිරීම |

**ඉගෙනුම් සම්පත් :**

- ශුද්ධ බයිබලය උත්පත්ති 1:1-3/දෙවියන්වහන්සේ මැවූ ලෝකයේ විවිධ දේ දැක්වෙන රූප කිහිපයක් හෝ රූප ඇතුළත් ළමා බයිබලයක්/පාට පැන්සල්/A4 කොළ/කතුරු/ගම්/



**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**ක්‍රියාකාරකම 1**

පියවර 1

- සිසුන් පාසල් වත්තට කැඳවා ගෙන යන්න. සිසුන් සමග පාසල් වත්තේ ගමන් කරමින් අවට පරිසරයේ දක්නට ලැබෙන දෑ සාකච්ඡා කරන්න. මෙහිදී අහස, පොළොව, අව්ව, හිරු අවට ගස් වැල්, මල්, කුරුල්ලන් යන සතුන් ඈඳ දක්නට ඇති දෑ පිළිබඳ වැඩි අවධානයක් යොදමින් සාකච්ඡා කරන්න.
- මේ හැම අවස්ථාවකදී ම අහස, පොළොව, සාගරය, ගංගා ආදියේ එම අවස්ථාවට පාසල් භූමියේ හා අවට නොලැබෙන දේ පෙන්වීමට ගුරුවරයා ළඟ රූප තබා ගනිමින් පෙන්වීම යෝග්‍ය වේ.
- දෙවියන්වහන්සේ මේ දේවල් මැවීමට පෙර පොළොව හිස් ව පාළුව තිබුණ බවත් අන්ධකාර ව පැවති බවත් සඳහන් කරන්න.
- අහස පෙන්වමින් එහි දක්නට ලැබෙන දෑ සාකච්ඡා කරන්න.
- රාත්‍රි අහසේ ඇති දෑ සාකච්ජා කරන්න. (සඳ, තරු ආදිය)
- පොළොව පෙන්වමින් අප ජීවත් වන මේ පොළොවේ ඇති දේ ගැන සාකච්ඡා කරන්න. (භූමිය, කඳු, ගස්, වැල්, මල්, වනාන්තර, ගංගා, ඇළ දොළ යනාදිය ගැන)
- පොළොවේ ඇති ගස් වැල්, ගංගා ආදිය නැති ව අපට ජීවත් වීමට අපහසුබවත් ඒවායින් අපට ජීවත් වීමට ආහාර හා ජලය, හුස්ම ගැනීමට වායුව ආදිය ලැබෙන බවත් කෙටියෙන් සඳහන් කරන්න.
- ගංගා, ඇළදොළ සාගරය ඇති බවත් එහි ජලයේ ජලජ ජීවීන් ජීවත් වන බවත් සාකච්ඡා කරන්න.
- ගංගා, ඇළදොළ හා සාගරයෙන් සතුන්ට හා මිනිසුන්ට ජලය ලැබෙන බවත් සඳහන් කරන්න.
- ගුවනේ පියාඹන පක්ෂීන් හා පොළොවේ බඩගා යන උරගයන් ද ඇති බව සඳහන් කරන්න.
- මේ හැම මවන ලද්දේත් සපයන ලද්දේත් දෙවියන්වහන්සේ බවත් සඳහන් කරන්න.

පියවර 2

- ඉහත විස්තර කළ ලෝකය මැවීමේ පුවත බයිබලයේ සඳහන් වී ඇති අයුරු සවන් දීමට සලස්වමින්, සිසුන්ව සුදුසු ආසන සපයා එළිමහනේ ම අසුන් ගැනීමට සලස්වන්න.
- බයිබලයේ උත්පත්ති 1:1-3 දක්වා සිසුන්ට ඇසෙන සේ කියවන්න.

පියවර 3

- දෙවියන්වහන්සේ මේ සියල්ල දින 6කින් මවා නිම කරන ලද බවත්, උන්වහන්සේ මැවූ සියල්ල මනහර බවත් බයිබලයේ සඳහන් බව අවධාරණය කරන්න.
- ඉහත සවන් දුන් කතාන්දරය ආශ්‍රයෙන් කෙටි ප්‍රශ්න කිපයක් අසන්න.

පියවර 4

- දෙවියන්වහන්සේ මැවූ ලෝකය ගැන කියවෙන ගීතිකාවක් ගායනා කරන්න.
- උන්වහන්සේ මැවූ ලෝකය හා ඉන් ලැබෙන සියලු ප්‍රයෝජන ගැන ස්තුතිවන්ත වෙමින් සාමූහික ව යාච්ඤාවක් කරන්න.

තක්සේරු කිරීම

| කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක අංකය | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | මට්ටම 4 | මට්ටම 3 | මට්ටම 2 | මට්ටම 1 |
| 2.1 ආගමික කතාන්දරවලට කැමැත්තෙන් සවන්දෙයි. | 2.1.1 | මැවීමේ කතාවට අදාළ වාචික ප්‍රශ්න 03ට පිළිතුරු දෙයි. | මැවීමේ කතාවට අදාළ වාචික ප්‍රශ්න 02ට පිළිතුරු දෙයි. | මැවීමේ කතාවට අදාළ වාචික ප්‍රශ්න 01ට තවත් සිසුවෙකුගේ සහය ඇතිව පිළිතුරු දෙයි. | ප්‍රශ්න එකකටවත් පිළිතුරු ලබා දීමට දුෂ්කරතා දක්වයි. |
| 2.3 ආගමික කතාන්දර ඇසුරෙන් ලබා ගත හැකි ආදර්ශ ප්‍රකාශ කරයි. | 2.3.1 | මා වෙනුවෙන් දෙවියන් වහන්සේ මනහර ලෝකයක් මවා ඇති බව ප්‍රකාශ කරයි. | දෙවියන් වහන්සේ ලෝකය මැවූ බව තරමක් දුරට ප්‍රකාශ කරයි. | දෙවියන් වහන්සේ ලෝකය මැවූ බව තවත් සිසුවෙකුගේ සහය ඇතිව ප්‍රකාශ කරයි. | දෙවියන් වහන්සේ ලෝකය මැවූ බව ප්‍රකාශ කිරීමට අපොහොසත් වෙයි. |

# සංකල්පය චරිත සංවර්ධනය
# 02 පාඩම - සාම කුමරු ජේසුස්

**ජේසුස්වහන්සේ සාම කුමාරයා ලෙස ලොව පහළ වූ ආකාරය හඳුන්වා දීම මෙම පාඩමේ අරමුණ වේ.**

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්යසාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 2. ආගමික ශාස්තෘවරයා/ නිර්මාතෘවරයා පිළිබඳ කතාන්දර හා උපදේශ කාව්‍ය ඇසුරෙන් චරිත සංවර්ධනයට අදාළ සුවිශේෂ ගුණාංග හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | දෙවියන් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය | 2.1 ආගමික කතන්දරවලට කැමැත්තෙන් සවන් දෙයි | 2.1.1 ආගමික කතන්දරවලට සවන්දීම |
| | | 2.3 ආගමික කතන්දර ඇසුරෙන් ලබා ගත හැකි ආදර්ශ ප්‍රකාශ කරයි. | 2.3.1 ආදර්ශයක් ප්‍රකාශ කිරීම |

**ඉගෙනුම් සම්පත් :**

- ශු.බයිබලයේ ශුලූක් 1ඃ 26-38 ගවලෙන නිර්මාණයට අවශ්‍ය පිදුරු/රෙදි/කඩදාසි/ගවහලේ රූපය



**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**ක්‍රියාකාරකම 1**
**ජේසුස් උපත භූමිකා රංගනයක් මගින් රඟ දක්වයි.**
**භූමිකා රංගනයට පෙර සූදානම.**

- කිතු උපත රඟ දැක්වීමට අදාළ චරිත සිසුන් කිහිප දෙනෙකු අතර බෙදා දෙන්න. (මරිය තුමිය, ජෝසෙප් තුමා, එඬේරුන්, පඬිවරු, දේව දූතයන්)
- තමන්ට ලැබුණ චරිතයට අදාළ සුදුසු ඇඳුමක් සපයා ගෙන ඒමට සිසුන්ට පෙර දින උපදෙස් දෙන්න.
- කිතු උපතට අදාළ ගීතයන් හෝ ගීතිකාවක් දරුවන්ට ගායනා කිරීමට පුහුණු කරන්න. ක්‍රිස්තියානි ගීතිකා පොතේ 592 හෝ වෙනත් සුදුසු ගීතිකාවක් හෝ බෙත්ලෙහෙම් පුරේ දිළිඳු ගවලෙනේ ඔරුව තුළේ සිසිලෙ නිදයි ජේසු බිළින්දා යන ගීතය.

- එසේ නැති නම් ගීතය පටිගත කර, එය ඕඩියෝ පටියක් මගින් සිසුනට ඇසෙන්නට සලස්වන්න. සුදුසු උපකරණ සූදානම් කර තබන්න.

පියවර 1

- ඉහත ගීතයන් හෝ එකක් (පටිගත කළ) ඇසෙන්නට සලස්වන්න. නැතහොත් සිසු කණ්ඩායමකට ගායනා කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- එම ගීතය ගයන අතරතුර අදාළ චරිතවලට රංගනයේ යෙදීමට අවස්ථාව ලබා දෙන්න.
- ගවහල තුළ මරියා, ජෝසෙප් සහ ගව ඔරුවේ ජේසු කුමරුගේ රුව තිබෙයි. ගීතයේ සඳහන් වන අන්දමට පළමු ව එඬේරුන් ද, අනතුරුව පඬිවරු ද පැමිණ ජේසු කුමරුට නමස්කාර කරන ආකාරය රංගනයේ යෙ දී මට මඟ පෙන්වන්න.
- මෙම භූමිකා රංගන හා සිසු ක්‍රියාකාරකම් පොතෙහි ඇති ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.

පියවර 2

- ජේසුස්වහන්සේගේ උත්පත්තියට අදාළ පහත සඳහන් බයිබල් පාඨය සිසුන්ට ඇසෙන සේ කියවන්න. ශු.ලූක් 1:26-38
- ඒ ඇසුරෙන් සිසුන් සමග ජේසුස්වහන්සේගේ උපතට අදාළ සාකච්ඡාවක් මෙහෙයවන්න. එම සාකච්ඡාවේදී පහත සඳහන් කරුණු ඉස්මතු වීමට ඉඩ සලස්වන්න.
  ජේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයා බව
  මරිය තුමියගේ පුතු ලෙස ජේසුස්වහන්සේ මෙලොවට උපන් බව
  එතුමාණන් සාමයේ කුමරුන බව
  එතුමාණන් පාරිශුද්ධබව. (උපදින පරිශුද්ධ දරුවා දෙවියන්වහන්සේගේ පුත්‍රයාණෝ යැයි කියනු ලබන සේක.) ශු.ලූක් 1:35

තක්සේරු කිරීම

| කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක අංකය | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | මට්ටම 4 | මට්ටම 3 | මට්ටම 2 | මට්ටම 1 |
| 2.1 ආගමික කතන්දරවලට කැමැත්තෙන් සවන් දෙයි. | 2.1.1 | ජේසු උපත කතාවට සවන් දීමෙන් පසු ක්‍රියාකාරකම් පොතේ යා කිරීම් 5ක් නිවැරදි ව යා කරයි. | ජේසු උපත කතාවට සවන් දීමෙන් පසු ක්‍රියාකාරකම් පොතේ යා කිරීම් 3ක් නිවැරදි ව යා කරයි. | ජේසු උපත කතාවට සවන් දීමෙන් පසු ක්‍රියාකාරකම් පොතේ යා කිරීම් 2ක් නිවැරදි ව යා කරයි. | ජේසු උපත කතාවට සවන් දීමෙන් පසු ක්‍රියාකාරකම් පොතේ යා කිරීම් 1 ක් නිවැරදි ව යා කරයි. |
| 2.3 ආගමික කතන්දර ඇසුරින් ලබා ගත හැකි ආදර්ශ ප්‍රකාශ කරයි. | 2.3.1 | ජේසුස් වහන්සේ සාමයේ කුමාරයාණන් බව ප්‍රකාශ කරයි. | ජේසුස් වහන්සේ සාමයේ කුමාරයාණන් බව තරමක් දුරට ප්‍රකාශ කරයි. | ජේසුස් වහන්සේ සාමයේ කුමාරයාණන් බව තවත් සිසුවෙකුගේ සහය ඇතිව ප්‍රකාශ කරයි. | ජේසුස් වහන්සේ සාමයේ කුමාරයාණන් බව ප්‍රකාශ කිරීමට අපොහොසත් වෙයි. |

# සංකල්පය චරිත සංවර්ධනය
# 03 පාඩම - සුදතුම් වැඩීම

ශුද්ධාත්මයාණන්වහන්සේගේ ලොව පහළ වීම ජේසුස්වහන්සේගේ පොරොන්දුවක් ඉටුකරනු වස් බව අවබෝධ කරවීමත් පෙන්තකොස්ත දින එය සිදු වූ බව තහවුරු කරගනිමින් ශුද්ධාත්මයාණන්වහන්සේ අප සමග නිරන්තරයෙන් වැඩ වසන බව අවබෝධ කරවීමත් අරමුණු වේ.

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්යසාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 2. ආගමික ශාස්තෘවරයා/ නිර්මාතෘවරයා පිළිබඳ කතන්දර හා උපදේශ කාව්‍ය ඇසුරෙන් චරිත සංවර්ධනයට අදාළ සුවිශේෂ ගුණාංග හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | ශුද්ධාත්මයාණන්ගේ ශ්‍රේෂ්ඨත්වය | 2.1 ආගමික කතාන්දර වලට කැමැත්තෙන් සවන් දෙයි. | 2.1.1 ආගමික කතන්දරවලට සවන්දීම |

**ඉගෙනුම් සම්පත්:**

- ශුද්ධ බයිබලය
- ක්‍රියා. 2 ඃ 1- 4, පෙන්තකොස්ත දින සිදුවීම් දැක්වෙන පිංතූර
- පාට පැන්සල්
- A4 කොළ
- කතුරු
- ගම්
- බ්‍රිස්ටල් බෝඩ්
- සුළඟ ලබා දෙන්න විදුලි පංකාවක්
- ඇමුණුම 1 හා 2

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ඃ**

**ක්‍රියාකාරකම 1**

පියවර 1

- කිතුනු අප සමරන මංගල්‍යයන් පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.
- සිසුන් දන්නා ශුද්ධ බයිබලයේ සඳහන් මංගල්‍යයන් පිළිබඳ අදහස් විමසන්න.
- පන්ති කාමරය තුළ සැඩ සුළඟක් හමන ආකාරය අත්විඳින්න ඉඩ සලසවන්න.
- සිසුන්ගේ අද්දැකීම ගැන සාකච්ඡා කරන්න.

පියවර 2

- ඇමුණුමෙහි ඇති ඡායාරූප සූදානම් කරගන්න.
- සිසුන්ට ඡායාරූප නිරීක්ෂණයට අවස්ථාව දෙන්න.
- සිසුන් දුටු දේ පිළිබඳ අදහස් විමසන්න.
- එම අදහස් පෙළ ගස්වන්න.
- බයිබල් පාඨය සිසුන්ට ඇසෙන සේ කියවන්න.
- සවන් දුන් බයිබල් පාඨය පිළිබඳව සිසුන් සමග සාකච්ඡා කරන්න.
- සුළඟින් ඔවුන් ලද අද්දැකීම හා බයිබල් කොටසහි සඳහන් සිදුවීම ගැන සිසු අදහස් ලබා ගන්න.

පියවර 3

- නැවත සිසුන්ට ඡායාරූප නිරීක්ෂණයට අවස්ථාව දෙන්න.
- ඉහත සාකච්ඡාවෙන් පසුව නැරඹූ ඡායාරූප හා ඇසූ බයිබල් පාඨය පිළිබඳ පහත සඳහන් කෙටි වාචික ප්‍රශ්න කිහිපය සිසුන්ගෙන් විමසා පිළිතුරු ලබා ගන්න.

1) ගෝලයන් ඇතුළු පිරිස රැස් වුණේ කොහේ ද?
2) ඔවුන් කරමින් සිටියේ කුමක් ද?
3) එවිට සිදු වූයේ කුමක් ද?

- ඉහත කරුණු ඉස්මතු වන සේ ඔවුන් ඇසු දුටු දේ සිසු ක්‍රියාකාරම් පොතෙහි සඳහන් වන පරිදි චිත්‍රයට නගා පංතියට ඉදිරිපත් කරන්න.

පියවර 4

- සිසු ක්‍රියාකාරකම් පොතෙහි සඳහන් රූපය බලා පාට කිරීම සඳහා සිසුන්ට සහය වන්න.

පියවර 5

- සිසු ක්‍රියාකාරකම් පොතෙහි සඳහන් රූපය පාට කර කපා අලවා සම්පූර්ණ කිරීමට ඔබට දී ඇති උපදෙස් අනුව සිසුන් සමග ක්‍රියාකාරකමෙහි නිරත වන්න.

**තක්සේරු කිරීම**


| කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක අංකය | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | මට්ටම 4 | මට්ටම 3 | මට්ටම 2 | මට්ටම 1 |
| 2.1 ආගමික කතාන්දරවලට කැමැත්තෙන් සවන් දෙයි. | 2.1.1 | පෙන්තකොස්ත දින සිදුවීම ගැන නිවැරදි ව අදහස් ප්‍රකාශ කරයි. | පෙන්තකොස්ත දින සිදුවීම ගැන තරමක් දුරට අදහස් ප්‍රකාශ කරයි. | පෙන්තකොස්ත දින සිදුවීම ගැන තවත් සිසුවෙකුගේ උදව්වෙන් අදහස් ප්‍රකාශ කරයි. | පෙන්තකොස්ත දින සිදුවීම ගැන නිවැරදි ව අදහස් ප්‍රකාශ කිරීමට අපොහොසත් වෙයි. |

ඇමුණුම 01





ඇමුණුම 02
පාට කරමු. කපා ගනිමු. අලවමු. නළල් පටියක් හදමු. පලඳිමු.




ශුද්ධාත්මයාණන්වහන්සේ ඔබ කෙරෙහි පැමිණි කල,
ඔබ බලය ලබන්නහුය.

ගුරුවරයාට උපදෙස් :
1. ගිනි දල්ල නිසි ලෙස පාට කර, බ්‍රිස්ටල් බෝඩ් එකක අලවා කපා ගන්න.
2. නළල් පටිය ද බ්‍රිස්ටල් බෝඩ් එකක අලවා කපා ගන්න.
3. පහත දැක්වෙන පරිදි ගිනි දැල්ල අලවා/ස්ටේප්ල් කර හෝ ඉලාස්ටික් පටියක් උපයෝගි කර ගෙන පලඳින්න.



# සංකල්පය සංස්කෘතිය. ශිෂ්ටාචාරය සහ සමාජ සංස්කෘතික සංවේදිතාව
## 04 පාඩම - මේ අපේ දෙව් මැදුරයි

කිතුනු ආගමේ ආගමික සිද්ධස්ථානය දෙව් මැදුර බව හඳුනා ගෙන දෙව් මැදුරට යාමේදී සුදුසු ඇඳුම් පැලඳුම් භාවිතයටත් හැසිරීම් හා වත්පිළිවෙත් අනුගමනය කිරීමටත් අන්‍යයන් සමග සහයෝගයෙන් හා ගෞරවයෙන් යුතු ව කටයුතු කිරීමටත් අවශ්‍ය ප්‍රායෝගික දැනුම ලබා දීම මෙම පාඩමේ මූලික අරමුණ වේ.

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්යසාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 3. ආගමික සිද්ධස්ථාන හඳුනාගෙන එම ස්ථානවලදී ගෞරවාන්විත ව හැසිරෙයි | මේ අපේ දෙව් මැදුර | 3.2 ආගමික සිද්ධස්ථානවලදී ආගමනාකූල ව හැසිරෙයි. | 3.2.1 ආගමානුකූල ව හැසිරීම |
| | | 3.3 සුදුසු ඇඳුම, නිවැරදි කතාබහ භාවිත කරයි. | 3.3.1 නිවැරදි කතාබහ<br>3.3..2 නිවැරදි ඉරියවු භාවිත කරයි |

**ඉගෙනුම් සම්පත් :**
- දේවස්ථානයට ගෙන යාමට අවශ්‍ය ද්‍රව්‍ය
- පාසලේ උදෑසන ආගමික වතාවත් සිදු කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**
**ක්‍රියාකාරකම 1**
**අපි දෙව් මැදුරට යමු**
**දෙව් මැදුරට යාමට පෙර සූදානම :**
- විදුහල්පතිතුමා/තුමිය සමග සාකච්ඡා කර දෙව් මැදුරට යන ගමන සංවිධානය කරගන්න.
- දෙව් මැදුරට දරුවන් රැගෙන ඒම පිළිබඳ එහි සභාව පාලක දේවගැතිතුමාව දැනුවත් කර අවසර ලබා ගන්න.
- සුදුසු ඇඳුමකින් සැරසී පැමිණීමට ශිෂ්‍ය/ශිෂ්‍යයාවන්ට උපදෙස් දී ඒ පිළිබඳ දෙමාපියන්ද දැනුවත් කරන්න.
- දෙව් මැදුරට යාමට පෙර දිනයේ දෙව් මැදුරේදී හැසිරිය යුතු ආකාරය (අල්ප ශබ්දතාවය රැකීම) ගැන දැනුවත් කරන්න.
- සුදුසු ආකාරයට දෙව් මැදුරට පිටත්ව යන්න.

**දෙව් මැදුරට ගිය පසු :**
**පියවර 1**
- දෙව් මැදුරට ඇතුල්වන ස්ථානයේදී හිස්වැසුම්/ පාවහන් ගලවා ඇතුල්වන්න.
- සන්සුන්ව දෙව් මැදුරට ඇතුළු වී සුදුසු පරිදි අසුන් ගැනීමට සලස්වන්න.
- සැම විට ම ගුරුතුමා/තුමිය ආදර්ශයක් වන පරිදි එම කටයුතු සිදු කරන්න.
- දෙව් මැදුර තුළ අල්ප ශබ්දතාව රැකීම පාසලේදී මතක් කර දුන් පරිදි ම කළ යුතු බව දරුවන්ට පහදා දෙන්න.
- ගීතිකා ගායනා කිරීමේදී තමන් හිඳි අසුනින් නැගිට සුදුසු ලෙස ප්‍රශංසා කරමින් ගායනයේ යෙදීමට උපදෙස් දෙන්න.
- යාච්ඤාවට සහභාගි වීමට උපදෙස් දෙන්න.

- යාච්ඤා කිරීමේදී දණ ගසා (බිම හෝ දණ බංකුව මත), දෑත් එක්ව තබා, ඇස් වසා ගෙන යාච්ඤාවට සහභාගිවීමට උපදෙස් දෙන්න.
- යාච්ඤාව අවසානයේ 'ආමෙන්' යනුවෙන් පැවසීමට මතක් කරන්න. ගුරුතුමා/තුමිය ශබ්දනඟා 'ආමෙන්'යනුවෙන් පවසන්න.
- කෙටි දේශනයට/දේව පණිවිඩයකට සවන් දීමට උපදෙස් දෙන්න.
- නැවත යාච්ඤා කර සන්සුන් ව, නිශ්ශබ්දතාව රකිමින් පෙළට දෙව් මැදුරෙන් පිටව යාමට උපදෙස් දෙන්න.

පියවර 2
- දෙව් මැදුරට යාම පිළිබඳ තම අද්දැකීම් ප්‍රකාශ කරන්නට සිසුන්ට අවස්ථාව දෙන්න.
- දෙව් මැදුරට යාමේ දී හා ගිය විට කළ නොකළ දේවල් පිළිබඳ සාකච්ජා කරන්න.

**තක්සේරු කිරීම**

| කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක අංකය | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | මට්ටම 4 | මට්ටම 3 | මට්ටම 2 | මට්ටම 1 |
| 3.2 ආගමික සිද්ධස්ථානවලදී ආගමානුකූල ව හැසිරෙයි. | 3.2.1 | දෙව් මැදුර තුළදී ප්‍රශංසා කරමින් ගායනයේ යෙදෙයි. | තව සිසුවෙකු සමග ප්‍රශංසා කරමින් ගායනයේ යෙදෙයි. | ප්‍රශංසා කිරීමට හෝ ගායනයේ යෙදීමට මැළි කමක් දක්වයි. | ප්‍රශංසා කිරීමට හා ගායනයේ යෙදීමට අකමැති වෙයි. |
| 3.3 සුදුසු ඇඳුම, නිවැරදි කතාබහ භාවිත කරයි. | 3.3.1<br>3.3.2 | යාච්ඤාව අවසානයේ ශබ්දනඟා ආමේන් යනුවෙන් සෙමෙන් පවසයි. | යාච්ඤාව අවසානයේ ආමේන් යනුවෙන් සෙමෙන් පවසයි. | යාච්ඤාව අවසානයේ ආමේන් යනුවෙන් පැවසීමට මැළි වෙයි. | යාච්ඤාව අවසානයේ ආමේන් යනුවෙන් නොපවසයි. |

# සංකල්පය පරිසර සංවේදිතාව
# 05 පාඩම - ලොව රැක ගනිමු

දෙවිඳුන් මැවූ සුන්දර ලෝකය රැක ගනිමින්, වර්ධනය කර, එහි ප්‍රයෝජන භුක්ති විඳීමට යොමු කරවීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්යසාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 8. තමා අවට පරිසරය පිරිසිදුව හා පිළිවෙළට තබා ගැනීමට ක්‍රියා කරයි. | දෙවිඳුන් මැවූ සුන්දර ලෝකය | 8.1 තමා අවට පරිසරය පිරිසිදු කිරීමට දායක වෙයි. | 8.1.1 ක්‍රියාකාරීව සහභාගී වීම |
| | | 8.2 අවට පරිසරය අලංකාර ව පිළිවෙළකට තබා ගැනීමට කටයුතු කරයි. | 8.2.1 අදහස් ප්‍රකාශ කිරීම<br>8.2.2 නිර්මාණශීලිබව<br>8.2.3 උපකරණ භාවිතය<br>8.2.4 අගය කිරීම |

**ඉගෙනුම් සම්පත් :**

- ශුද්ධ බයිබලය උත්පත්ති 1 : 28 - 29 දක්වා/පාඩමට අදාළ පින්තූර
- අපතේ දමන බඳුනක පැළයක් සිටුවීමට අවශ්‍ය ද්‍රව්‍ය සූදානම් කර ගෙන එන්න හෝ එවැනි පින්තූරයක් සිසුන්ට පෙන්වන්න.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**ක්‍රියාකාරකම 1**

පියවර 1

**(පසුගිය පාඩම ''මැවුම්කාර දෙවියන්වහන්සේ'' මතකයට නංවමින් සාකච්ඡා කරන්න)**

- උදාහරණ ලෙස, පසුගිය පාඩමෙන් ඉගෙන ගත් දේව මැවිල්ලේ මැවුම්කරුවාණන් කවුද? දෙවි පියාණන්වහන්සේ
  **(සිසුන්ට අවට පරිසරයේ සුන්දරත්වය, මල්පෙතිවල ඇති වර්ණවත්බව, ක්‍රෝටන් වැනි කොළයක ඇති වර්ණවත්බව, පළතුරු, පලා වර්ග, කුරුලු හඬ, පියාසර කරන පක්ෂීන්, ආදිය දකින්න සලස්වන්න. නැතහොත් පින්තූර මගින් දකින්න සලස්වන්න)**

පියවර 2

- ඒ ඇසූ දුටු දේ ගැන සාකච්ඡාවක් ගොඩනගන්න.
- එහි මනහරබව, සතුට, ප්‍රීතිය ගැන තව දුරටත් සාකච්ඡා කරන්න.
  - දෙවිපියාණන්වහන්සේ, මේ සුන්දර ලෝකය රැක ගැනීමත්, වැඩි වර්ධනය කිරීමේ වගකීමත් මිනිසාට භාර දුන්නා.
  - මිනිසාව ඒදන් උයනෙ පදිංචි කරලා, එම උයනෙහි සතුටින් ජීවත් වීමටත්, එය රැකගෙන වගා කිරීමටත් භාර දුන්නා.

- ඒ විතරක් නොවෙයි එය වගා කර, ලබා ගන්නා වූ මැවිල්ලෙන් නිසි ප්‍රයෝජන ගන්නත් උන්වහන්සේ මිනිසාට පැවරුවා. බයිබලයේ උත්පත්ති පොතේ තමයි මේ බව සඳහන් වෙන්නේ. (උත්පත්ති 1 : 28, 29 වන පද ගුරුවරයා ශබ්ද නගා කියවයි.)

**දෙවියන්වහන්සේ ඔවුන්ට ආසිරි පතමින්,**
**''නුඹලා දරුසම්පත් ලබා, වැඩි වර්ධනය වී,**
**පොළොව පුරා පැතිර එය යටත් කර ගන්න.**
**මුහුදේ මසුන් කෙරෙහිද, අහසේ පක්ෂීන් කෙරෙහිද,**
**පොළොවේ සැරි සරන සියලු සතුන් කෙරෙහිද බලය පවත්වන්න''යි**
**ඔවුන්ට වදාළ සේක. තවද උන් වහන්සේ,**
**"මුළු පොළෝ තලයෙහි ධාන්‍ය දරන සියලු පැළෑටි ද**
**බීජ සහිත එල දරන සියලු ගස් ද නුඹලාගේ ආහාරය පිණිස වේවා''**

පියවර 3

- සාකච්ඡාවක් ගොඩනගන්න.
  - එසේ නම් මිනිසා, දෙවිඳුන් මැවූ සුන්දර ලෝකය හැම අතින් ම ආරක්ෂා කර ගත යුතුයි නේද?
  - කොහොම ද අපි සුන්දර ලෝකය ආරක්ෂා කරල, ඒ වගකීම ඉටු කරන්නෙ?
  - පුංචි අපිටත් සුන්දර ලෝකය ආරක්ෂා කරන්න දායක වෙන්න පුළුවන්.
  - අපි දෙවිඳුන්ට යාච්ඤා කරමු, හැම දෙනාට ම සුන්දර ලෝකය ආරක්ෂා කරන්න කැමැත්ත ලබා දෙන්න කියලා.

පියවර 4

- සුන්දර ලෝකය ආරක්ෂා කර ගැනීමට පහත ක්‍රියාමාර්ග අනුගමනය කළ හැකි බව පවසන්න.
  - අපේ නිවස, නිවස අවට පරිසරය පිරිසිදු කිරීම
  - පාසල හා පාසල අවට පරිසරය පිරිසිදු කිරීම
  - පොලිතීන් බෑග් පාසලට හෝ නිවසට ගෙන ඒම අවම කිරීම
  - දිරා නොයන පොලිතීන් වැනි දෑ වෙන ම බඳුනකට බහාලීම
  - ජලය, අරපිරිමැස්මෙන් භාවිත කිරීම
  - අපට රිසි සේ ආහාර බෙදා ගෙන අපතේ නොහැර භුක්ති විඳීම
  - මල්පැලවලට වතුර දැමීමට උදව් කිරීම
  - පරිසරය ගැන තුති දෙමින් යාච්ඤා කිරීම

**සිසු ක්‍රියාකාරකම් පොත සඳහා උපදෙස් :**

- දෙවිඳු මැවූ සුන්දර ලෝකයට අදාළ වර්ණවත් පින්තූරය පෙන්වන්න.
- එවැනි චිත්‍රයක් සිසුන්ට ද අඳින්න සලස්වන්න.
- ඉවතලන බඳුනක පලා වර්ගයක් හෝ මල් පැළයක් සිට වූ පින්තූරයක් පෙන්වන්න හෝ සිසුන් සමග එවැනි දෙයක් සජීවී ව නිර්මාණය කරන්න.
- සිසු ක්‍රියාකාරකම් පොතෙහි ඇති බයිබල් පාඨය ගුරුතුමිය සමග කියවීමට සලස්වන්න.

ගීතය අංගචලනය සහිතව ගායනා කරන්න.

1. හිරු නැග එනවා සුළං හමනවා
වැහි වැහැලා ඇළ දොළ ගංගා බැස යනවා
දෙවිඳු මැවූ දේ ලොවට සිරිය දේ //

2. ගස් වැල් වැවිලා පල බර වෙනවා
මී මැස්සොයි සමනලයොයි මල් පැණි බොනවා.
දෙවිඳු මැවූ දේ ලොවට සිරිය දේ //

3. මල් පුබුදිනවා රොන් ඉහිරෙනවා
මලිති බටිති කොවුල් ගිරා රැන් ඇදෙනවා
දෙවිඳු මැවූ දේ ලොවට සිරිය දේ //

ක්‍රිස්තියානි ගීතිකා සංග්‍රහය -582
- ශ්‍රී ලංකා ක්‍රිස්තියානි පොත් සමාගම

තක්සේරු කිරීම

| කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක අංකය | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | මට්ටම 4 | මට්ටම 3 | මට්ටම 2 | මට්ටම 1 |
| 8.1 තමා අවට පරිසරය පිරිසිදු කිරීමට දායක වෙයි. | 8.1.1 | පාසල අවට පරිසරය පිරිසිදු කිරීමට දායක වෙයි. | පාසල අවට පරිසරය පිරිසිදු කිරීමට තරමක් දුරට දායක වෙයි. | පාසල අවට පරිසරය පිරිසිදු කිරීමට සුලු වශයෙන් දායක වෙයි. | පාසල අවට පරිසරය පිරිසිදු කිරීමට දායක නොවෙයි. |
| 8.2 අවට පරිසරය අලංකාර ව පිළිවෙළකට තබා ගැනීමට කටයුතු කරයි | 8.2.1<br>8.2.2<br>8.2.3<br>8.2.4 | පාසල අවට පරිසරය මල්පැළ වවා වතුර පොහොර දමමින් අලංකාර කරයි. | පාසල අවට පරිසරය තවත් සිසුවෙකුගේ සහය ඇතිව මල්පැළ වවා වතුර පොහොර දමමින් අලංකාර කරයි. | පාසල අවට පරිසරය මල්පැළ වවා වතුර පොහොර දමමින් අලංකාර කිරීමට මැළිවෙයි. | පාසල අවට පරිසරය මල්පැළ වවා වතුර පොහොර දමමින් අලංකාර නොකරයි. |

# සංකල්පය ආචාර ධර්ම, සාරධර්මයන් හා සම්මතයන්
# 06 පාඩම - ජේසුස්වහන්සේට කතා කරමු

නිවැරදි ඉරියව් යොදාගනිමින් යාච්ඤා කිරීමත්, යාච්ඤාව තම ජීවිතයට ඕනෑම අවස්ථාවකදී යොදා ගැනීමට පුරුදු කරවීමත් මෙම පාඩමෙන් අපේක්ෂිතය.

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්යසාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 6. ආගමික වතාවත්වල නිරතවීමේදී නිවැරදි වත්පිළිවෙත් සිරිත් විරිත් හා ඉරියවු ප්‍රදර්ශනය කරයි. | යාච්ඤාවේ ජීවිතයක් | 6.1 ආගමික වතාවත්වල නිරතවීමේදී නිවැරදි වත්පිළිවෙත් යෙදෙයි. | 6.1.1 නිවැරදි වත් පිළිවෙත්වල යෙදීම |
| | | 6.3 ආගමික වතාවත්වල නිරතවීමේදී නිවැරදි ඉරියවු ප්‍රදර්ශනය කරයි. | 6.3.1 නිවැරදි ඉරියවු ප්‍රදර්ශනය කිරීම |

### ඉගෙනුම් සම්පත්:

- ශුද්ධ බයිබලය
- පාඩමට අදාළ පින්තූර (යාච්ඤා කරන දෑත් සහිත පින්තූරයක් සිසු ක්‍රියාකාරකම් පොතෙහි ඇත.)
- ''යාච්ඤාව'' පිළිබඳ දැක්වෙන ගීතිකාවක එක් පදයක් සූදානම් කර ගායනා කරන්න.
- අදාළ බයිබල් පාඨය - ශු. මාර්ක් 6: 46
  ''උන්වහන්සේ ඔවුන්ගෙන් වෙන් වූ පසු යාච්ඤා කරනු වස් කන්දට නැගුණු සේක''
- බයිබල් පාඨයට අදාළව කන්දක සිට ජේසුස්වහන්සේ යාච්ඤා කරන පින්තූරයක් ප්‍රදර්ශනය කරන්න. (සිසු ක්‍රියාකාරකම් පොතෙහි ඇත.)

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :
### ක්‍රියාකාරකම 1
### පියවර 1

- ක්‍රිස්තියානි ධර්මය සිසු ක්‍රියාකාරකම් පොතෙහි ඇති පාඩමට අදාළ පින්තූරය සොයා ගැනීමට අවස්ථාව දෙන්න.
- එම පින්තූරය ගැන අදහස් ඉදිරිපත් කිරීමට සලස්වන්න.
- සැම සිසුවෙකුට ම තම අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න. මෙලෙස පවසන්න.
  - දේවස්ථානයකදී තමන්ගේ අත් දෙක එකට එකතු කරල, ඇස් දෙක පියාගෙන, දණ ගහල යාච්ඤා කරන්න ඕනෙ.
  - අපි බලමු අපට යාච්ඤා කරන්න ස්ථානයක් අවශ්‍යය ද කියලා.

පියවර 2

- ගුරුතුමා/තුමිය බයිබල් පාඨය සිසුන්ට ඇසෙන සේ ශබ්ද නගා කියවන්න.
  **'ජේසුස්වහන්සේ ඔවුන්ගෙන් වෙන් වූ පසු යාච්ඤා කරනු වස්, කන්දට නැගුණු සේක.''**
  (කන්දක සිට ජේසුස්වහන්සේ යාච්ඤා කරන පින්තූරය ප්‍රදර්ශනය කරන්න.)
- යාච්ඤාව අපේ ජීවිතයේ ඕනෑම තැනක සිට කළ හැකි බව දැනුවත් කරන්න.
  **(දණ ගහන්නෙ නැතිව, නිශ්චලව සිතෙන් උන්වහන්සේට යාච්ඤා කරන්න හැකි බව දැනුවත් කරන්න. උදාහරණ කිහිපයක් ගෙන ඊට අදාළ ව යාච්ඤා කරන ආකාරය සිසුන්ට ඉතා සරල ලෙස පැහැදිලි කරන්න.)**

උදාහරණ :

| | |
|---|---|
| **එළිමහන** | මේ ලස්සන ලෝකය මැවූ දෙවියන්වහන්ස, ඔබ වහන්සේට ස්තුතියි. |
| **බසයක් ඇතුළෙ** | බසය පදවන රියදුරාගේ- නැණ බෙලෙන් අප රැකෙන්නේ දෙව්පියාණෙනි, රියදුරාහට - දෙනු මැනේ නැණ කුළුණිනේ |
| **ගමනකදී** | මේ ගමනට අපිටත් යන්න ලැබීම ගැන ස්තුතියි දෙවිඳුනි අපව රැකබලා ගන්න නිසා ස්තුතියි |
| **පාසලෙදී** | පාසලේදී යාළුවන්ට උදවු කරන්න පුළුවන්කම දෙන්න දෙවිඳුනි |
| **නිවසෙදී** | දෙවි සමිඳුනි, අම්මට තාත්තට වැඩිහිටි අයට කීකරුව හොඳ දේ කරන්න අපට උදවු කරන්න. ස්තුතියි |

පියවර 3

මෙලෙස යාච්ඤාවන් අපේ ජීවිතයට ඕනෑම අවස්ථාවක එකතු කරගන්න පුළුවන් බව සඳහන් කරන්න.

1. පළමුවෙන් ම ස්තුති ප්‍රශංසා කිරීම
2. අපෙන් සිදු වූ වැරදි මතක් කරගෙන, දෙවිඳුන්ගෙන් කමාව ඉල්ලීම
3. අපව කරදරවලින් රැකගන්නා ලෙස ඉල්ලා දෙවිඳුන්ට යාච්ඤා කිරීම
4. අපේ දවසේ අවශ්‍යතාවයන් අපට ලබා දෙන ලෙස ඉල්ලා දෙවිඳුන්ට යාච්ඤා කිරීම
5. අසනීප වූ අය වෙනුවෙන් යාච්ඤා කිරීම

පියවර 4

- සිසු ක්‍රියාකාරකම් පොතෙහි පාඩමට අදාළ ක්‍රියාකාරකමට යොමු කරවන්න.

**සිසු ක්‍රියාකාරකම් පොත සඳහා උපදෙස් :**

පාඩමට අදාළ ක්‍රියාකාරකම් සොයා ගැනීමට මග පෙන්වන්න.

''උන්වහන්සේ ඔවුන්ගෙන් වෙන් වූ පසු යාච්ඤා කරනු වස් කන්දට නැගුණු සේක.''

(කන්දක සිට ජේසුස්වහන්සේ යාච්ඤා කරන පින්තූරය සිසු ක්‍රියාකාරකම් පොතෙහි ඇත)

''යාච්ඤාව'' පිළිබඳ දැක්වෙන ගීතිකාවක එක් පදයක් සූදානම් කර ගායනා කරන්න. (සිසු ක්‍රියාකාරකම් පොතෙහි ඇත.)

**තක්සේරු කිරීම**

| කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක අංකය | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | මට්ටම 4 | මට්ටම 3 | මට්ටම 2 | මට්ටම 1 |
| 6.1 ආගමික වතාවත්වල නිරතවීමේදී නිවැරදි වත් පිළිවෙත්වල යෙදෙයි. | 6.1.1 | යාච්ඤා කරයි. | තව සිසුවෙකුගේ සහය ඇතිව යාච්ඤා කරයි. | යාච්ඤා කිරීමට උත්සාහ කරයි. | යාච්ඤා නොකරයි. |
| 6.3 ආගමික වතාවත්වල නිරතවීමේදී නිවැරදි ඉරියවු ප්‍රදර්ශනය කරයි. | 6.3.1 | ■ අත් එකතු කොට<br>■ දෑස් පියාගෙන<br>■ දණ නමා .... යාච්ඤා කරන නිවැරදි ඉරියවු 03 ප්‍රදර්ශනය කරයි. | ■ අත් එකතු කොට<br>■ දෑස් පියාගෙන දණ නමා .... යාච්ඤා කරන නිවැරදි ඉරියවු 02 ප්‍රකාශ කරයි. | ■ අත් එකතු කොට<br>■ දෑස් පියාගෙන දණ නමා .... යාච්ඤා කරන නිවැරදි ඉරියවු 01 ප්‍රකාශ කරයි. | ■ අත් එකතු කොට<br>■ දෑස් පියාගෙන දණ නමා .... යාච්ඤා කරන නිවැරදි ඉරියවු කිසිවක් ප්‍රකාශ නොකරයි. |

## සංකල්පය ආචාරධර්ම, සාරධර්ම හා සම්මතයන් මානව ගරුවත්වය

# 07 පාඩම - දෙවිඳුන් දුන් මගේ පවුල

තමා ජීවත් වන පවුලේ සාමාජිකයන් හඳුනා ගෙන ඔවුන් තමන්ට දක්වන ආදරය හා රැකවරණය අවබෝධ කරගනිමින් ඔවුන්ට ද තමන් විසින් කළයුතු දේ අවබෝධ කරගනිමින්, යහපත් දරුවකු ලෙස කටයුතු කිරීමට පුරුදු වීම මේ පාඩමෙන් අපේක්ෂිත වේ.

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්යසාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 7. යහපත් දරුවෙක් ලෙස පිළිපැදිය යුතු ගුණ ධර්ම/ සිරිත් විරිත් අනුගමනය කරයි. | නිවසේ පවුල | 7.1 යහපත් දරුවෙකු ලෙස පිළිපැදිය යුතු ගුණ ධර්ම හඳුනා ගනී. | 7.1.1 නිවැරදි ව හඳුනා ගැනීම |
| | | 7.3 යහපත් දරුවෙකු ලෙස කටයුතු කරයි. | 7.3.1 නිවැරදි ව හැසිරීම |

**ඉගෙනුම් සම්පත්:**
දෙමාපියන් දරුවන් සතුටින් ප්‍රීතියන් කතා කරමින් සිටින වර්ණවත් රූපයක්



**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**
**ක්‍රියාකාරකම** 1
**පියවර** 1

- මව, පියා, දරුවන් සතුටින් ප්‍රීතියන් කතා කරමින් සිටින රූපය පෙන්වමින් අප ජීවත් වන පවුල පිළිබඳ කුඩා සාකච්ජාවක් මෙහෙයවන්න.
- දෙමාපියන්/රැකබලා ගන්නන් තමා කෙරෙහි ඇති ආදරය, රැකබලා ගැනීම තමා වෙනුවෙන් කරන කැපකිරීම් ගැන සිසුන් සමග සාකච්ජාවක යෙදෙන්න.
- දෙමාපියන්/රැකබලා ගන්නන් වෙනුවෙන් තමන්ට කළහැකි උදවු උපකාර පිළිබඳ විමසන්න.
- තම දෙමාපියන්ට ගරු කළ යුතු බව බයිබලයේ සඳහන් බවත් එය දේව අඥාවක් බවත් සරලව විස්තර කරන්න.
- කුඩා කල පටන් දෙමාපියන්ට ගරු කළ හැකි අයුරු විමසන්න.

පියවර 2

- තමාට ආදරය රැකවරණය ලබා දෙන සහෝදර සහෝදරියන් දෙවිඳුන් දුන් ත්‍යාගයක් බව සඳහන් කරමින් සාකච්ඡා කරන්න.
- තම සහෝදර සහෝදරියන්ගෙන් උදවු ඉල්ලන්නට සිදු වන අවස්ථා ගැන විමසන්න.
- එම අවස්ථා ප්‍රයෝජනයට ගනිමින් සහෝදර සහෝදරියන්ගේ ආදරය හා රැකවරණය අගය කරන්නට හුරු කරන්න.
- තම සහෝදර සහෝදරියන් හා ඥාති සහෝදරයන් වෙනුවෙන් කළ හැකි දේ සාකච්ඡා කරන්න.

පියවර 3

- මව්පිය තම සහෝදර සහෝදරියන් ගැන තුති පුදමින් ගීතිකාවක් සාමූහිකව ගැයීමට අවස්ථාව දෙන්න.

උදා :- අප ලත් ගේ දොර ද
මව්පියන් ද පෙමැති
නංගිලා මල්ලිලා ද
ගැන තුති පුදමු.

**තක්සේරු කිරීම**

| කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක අංකය | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | මට්ටම 4 | මට්ටම 3 | මට්ටම 2 | මට්ටම 1 |
| 7.1 යහපත් දරුවෙකු ලෙස පිළිපැදිය යුතු ගුණ ධර්ම හඳුනා ගනී. | 7.1.1 | දෙමාපියන් රැකබලා ගන්නන් වෙනුවෙන් තමන්ට කළහැකි උදවු උපකාර 03ක් ප්‍රකාශ කරයි. | දෙමාපියන් රැකබලා ගන්නන් වෙනුවෙන් තමන්ට කළහැකි උදවු උපකාර 02ක් ප්‍රකාශ කරයි. | දෙමාපියන් රැකබලා ගන්නන් වෙනුවෙන් තමන්ට කළහැකි උදවු උපකාර 01ක් ප්‍රකාශ කරයි. | දෙමාපියන් රැකබලා ගන්නන් වෙනුවෙන් තමන්ට කළහැකි උදවු උපකාර ප්‍රකාශ නොකරයි. |
| 7.3 යහපත් දරුවෙකු ලෙස කටයුතු කරයි. | 7.3.1 | තම සහෝදර සහෝදරියන් වෙනුවෙන් කළහැකි දේවල් 03ක් ප්‍රකාශ කරයි. | තම සහෝදර සහෝදරියන් වෙනුවෙන් කළහැකි දේවල් 02ක් ප්‍රකාශ කරයි. | තම සහෝදර සහෝදරියන් වෙනුවෙන් කළහැකි දේවල් 01ක් ප්‍රකාශ කරයි. | තම සහෝදර සහෝදරියන් වෙනුවෙන් කළහැකි දේවල් ප්‍රකාශ නොකරයි. |

# සංකල්පය මානසික සෞඛ්‍ය හා යහපැවැත්ම
# 08 පාඩම - දෙවිඳුන් යදිමු - දෙව් වදන් කියවමු

හිතකර දෛනික චර්යා රටාවක් සඳහා යහපත් සෞඛ්‍ය පුරුදු අනුගමනය කරයි.

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්යසාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 10. හිතකර දෛනික චර්යා රටාවන් සඳහා යහපත් සෞඛ්‍ය පුරුදු අනුගමනය කරයි. | උදෑසන දෙවිඳුන් යදිමු - දෙව් වදන් කියවමු. | 10.1 යහපත් දින චර්යාවක අනුපිළිවෙළ ප්‍රකාශ කරයි. | 10.1.1 අනුපිළිවෙළ ප්‍රකාශ කිරීම |

**ඉගෙනුම් සම්පත් :**

- ශුද්ධ බයිබලය
- කුඩා දරුවන් දණින් සිට යාච්ඤා කරන ආකාරය දැක්වෙන පින්තූරයක් (සිසු ක්‍රියාකාරකම් පොතෙහි ඇත.)
- 1 තෙසලෝනික 5 :17-18 /ගීතාවලිය 119:105 වන පදය, එපීස 6:2,
  ''නොකඩවා යාච්ඤා කරන්න.''
  ''සියල්ලෙහිදී ස්තුති දෙන්න.''
  ''ඔබේ පියාටත් මවටත් ගෞරව කරන්න.''
- පැදුරු කිහිපයක් හෝ බිම වාඩිවී සිටීම සඳහා හෝ සුදුසු ක්‍රමයක් භාවිත කරන්න.
- මිහිරි නාදයක් ලබා ගත හැකි භාණ්ඩයක්. (මවුත් ඕගන්, බටනලාව වැනි දෙයක්)

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**ක්‍රියාකාරකම 1**

**පියවර 1**

සිත් සැහැල්ලු කර ගැනීමේ ක්‍රියාකාරකම සඳහා පංති කාමරය තුළ, දේවස්ථානය තුළ හෝ එළිමහනක සුදුසු ස්ථානයක් සූදානම් කර ගන්න. (කෙටි මෙනෙහි කිරීමේ කාලය)

- සිසුන්ගේ අවධානය මිහිරි නාදය වෙතට යොමු කරන්න (මෙමගින් සියලු සිසුන්ගේ අවධානය ගුරුතුමිය/ගුරුතුමා වෙත රඳවා තබා ගත හැකිය)
- ශරීරය සැහැල්ලුවෙන් තබා ගෙන දෑස් වසා ගන්න උපදෙස් දෙන්න.
- දැන් ඔයාලගේ සිත හුස්ම වැටෙන දිසාවට අරගෙන එන්න.
- වෙනත් කිසිදෙයක් ගැන නොසිතා, හුස්ම ගැනීම ගැන පමණක් හිතන්න. (විනාඩි 2ක් හෝ 3ක් පමණ මෙසේ හුස්ම ඉහළ පහළ ගැනීම සිසුන් කරන අතර ගුරුවරයා ඒ බව ශබ්ද නඟා ප්‍රකාශ කළ යුතුයි.
- පසුව සංඥා නාදය නවත්වන්න. දෑස් විවෘත කරීමට පවසන්න.
- ඔවුනට දැනුණ දේ පිළිබඳ සිසුන් හා සාකච්ඡා කරන්න.

**පියවර 2**

**දෙවිඳුන් නමස්කාර කරමු.**

- මනා සිහියෙන් යුතු ව දෙවිඳුන් නමස්කාර කිරීම සඳහා සිසුන් දෑස් පියා ගෙන සිටියදී ම දෛනික යහපත් චර්යා රටාවන්, විනයානුකූල යහපැවැත්ම හා සරල වදන් කිහිපයක් ඔවුනට ඇසෙන්නට සලස්වන්න. උදාහරණ කිහිපයක් පහත දැක්වේ.

උදා:
- ''ජේසුතුමා අපිට කියල දීල තියන ආකාරයට අසල්වැසියන්ට ප්‍රේමය දක්වමු. අපි සමග සිටින අපේ ම යහළුවන්ට උදවු කරමු.''
- ''මව්පියන්ට කීකරු වෙමු. අම්මා, තාත්තා, වැඩිහිටි අයට කීකරුව, උදෙන් ම නැගිටලා පල්ලියට යමු.
- ''දෙවිඳුන්ට නමස්කාර කරමු.''
- ''නොකඩවා යාච්ඤා කරමු.'' අපි යාච්ඤා කරන කොට දණින් සිට අත්දෙක එකට එකතු කරගෙන ඇස් දෙක පියා ගෙන යාච්ඤා කරමු.''
- ''ජේසුස්වහන්සේ ඔබත් එක්ක ඉන්නවා. ඔබට ගොඩක් ආදරෙයි.''
- ''අපි සබත් පාසලට (දහම් පාසලට) ගිහින් බයිබලය කියවන්න පුරුදු වෙමු.''
- ''ජේසුස්වහන්සේ ඉගැන්වූ කතන්දර අහගෙන අපිත් ඒ හොඳ වැඩ කරන්න පුරුදු වෙමු.''

■ දෑස් විවෘත කරන්න සලස්වන්න.

පියවර 3

■ සිසු ක්‍රියාකාරකම් පොතෙහි ඇති පාඩමට අදාළ පින්තූරය සොයා ගන්න අවස්ථාව දෙන්න.
■ සිසුන්ට සිතුන දේ ගැන කතා කරන්න අවස්ථාව දෙන්න.
■ යාච්ඤා කරන ආකාරයේ පින්තූරය පෙන්වමින් අපිත් එසේ කළ යුතු බව පවසන්න.
■ බයිබල් පාඨ කිහිපයකට ඇහුම්කන් දෙන්න සලස්වන්න.

''නොකඩවා යාච්ඤා කරන්න.''
''අසල්වැසියන්ට ප්‍රේම කරන්න.''
''මව්පියන්ට කීකරු වෙමු.''
සිසුන් සමග සහ කියවීමට යොමුවන්න.

පියවර 4

**සිසු ක්‍රියාකාරකම් පොත සඳහා උපදෙස් :**

■ සිසු ක්‍රියාකාරකම් පොතෙහි පාඩමට අදාළ ක්‍රියාකාරකමට යොමු කරවන්න.
■ ගුරුවරයා සමග පින්තූරය දෙස බලා ශබ්ද නඟා කියවන්න.
■ උදාහරණ ලෙස -
- ''නොකඩවා (යාච්ඤා) කරන්න.''
- ''(වැඩිහිටියන්හට) කීකරු වෙමු.''
- ''(අන් අයට) ප්‍රේමය දක්වමු.''

**තක්සේරු කිරීම**

| කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක අංකය | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | මට්ටම 4 | මට්ටම 3 | මට්ටම 2 | මට්ටම 1 |
| 10.1 යහපත් දින චර්යාවක අනුපිළිවෙල ප්‍රකාශ කරයි | 10.1.1 | දවස ආරම්භයේදී දෙවිඳුන්ට නමස්කාර කළ යුතු බව පිළිගනිමින් ප්‍රකාශ කරයි. | දවස ආරම්භයේදී දෙවිඳුන්ට නමස්කාර කළ යුතු බව තරමක් දුරට පිළිගනිමින් ප්‍රකාශ කරයි. | දවස ආරම්භයේදී දෙවිඳුන්ට නමස්කාර කළ යුතු බව තව සිසුවෙකුගේ උදවු ඇතිව පිළිගනිමින් ප්‍රකාශ කරයි. | දවස ආරම්භයේදී දෙවිඳුන්ට නමස්කාර කළ යුතු බව පිළිගැනීමට හෝ ප්‍රකාශ කිරීමට දුෂ්කරතා දක්වයි. |

# අන්තර්ගතය
## දෙවන වාරය

**සංකල්පය චරිත සංවර්ධනය**

1 වන පාඩම - දයානුකම්පාව 21
2 වන පාඩම - ප්‍රේමය 23
3 වන පාඩම - ප්‍රීතිය නමැති තෑග්ග 25

**සංස්කෘතිය, ශිෂ්ටාචාරය සහ සමාජසංස්කෘතික සංවේදීතාව**

4 වන පාඩම - අපේ පූජනීය ග්‍රන්ථය 28

**සංකල්පය පරිසර සංවේදිතාව**

5 වන පාඩම - දෙවිඳුන් හා කතා කරමු 30

**සංකල්පය ආචාර ධර්ම, සාරධර්මයන් හා සම්මතයන්**

6 වන පාඩම - අපි ජීවත් වන පොළොව සුරකිමු 33
7 වන පාඩම - බෙදා ගැනීම 36

**සංකල්පය මානසික සෞඛ්‍ය හා යහපැවැත්ම**

8 වන පාඩම - ජේසුස්වහන්සේට බැති සිතින් ළං වෙමු 39

# සංකල්පය - චරිත සංවර්ධනය
# 01 පාඩම - දයානුකම්පාව

බයිබලීය පාඨ ඇසුරින් තම චරිත සංවර්ධනයට, දෙවියන්වහන්සේගේ ගුණාංග හඳුනා ගෙන, ඒවා තම ජීවිතයට අදාල කර ගැනීම මෙයින් අපේක්ෂිත ය.

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්යසාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 2. ආගමික ශාස්තෘවරයා/ නිර්මාතෘවරයා පිළිබඳ කතාන්දර හා උපදේශ කාව්‍ය ඇසුරෙන් චරිත සංවර්ධනයට අදාළ සුවිශේෂ ගුණාංග හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | දෙවියන්වහන්සේගේ ගුණාංග | 2.2 ආගමික කතන්දර ඇසුරෙන් ආගමික ශාස්තෘවරයාගේ සුවිශේෂ ගුණාංග යක් ප්‍රකාශ කරයි. | 2.2.1 සුවිශේෂ ගුණාංග යක් ප්‍රකාශ කිරීම |
| | | 2.3 ආගමික කතාන්දර ඇසුරින් ලබා ගත හැකි ආදර්ශ ප්‍රකාශ කරයි. | 2.3.1 ආදර්ශයක් ප්‍රකාශ කරයි. |

**ඉගෙනුම් සම්පත් :**

- ශුද්ධ බයිබලය
- පින්තූරයක් ගොඩනැඟීම සඳහා අවශ්‍ය වර්ණවත් කොළ කැබලි (කෙසෙල් වියළි කොළ)
- ගම්, කතුරක්, පැන්සලක්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**ක්‍රියාකාරකම** 1

**පියවර** 1

- පළමු වාරයේ ඉගෙනගත් ලෝකය මැවීමේ කතා පුවත පිළිබඳ උගත් කරුණු සිහි ගන්වමින් පෙර දැනුම විමසීමේ ප්‍රශ්න සිසුන්ගෙන් අසමින් සාකච්ඡාවක් මෙහෙය වන්න.

  උදා: ලෝකය මැවූ මැවුම්කරුවාණන් වහන්සේ කවුද කියලා. දෙවියන්වහන්සේ දින කීයකින් ද? ලෝකය මැව්වේ? (දින හයකින්)

  හයවෙනි දවසෙ මැව්වෙ මොනව ද? (ජීවමාන සතුන් - විවිධාකාර සතුන් මැව්වා ඊළඟට **මිනිසා** මැව්වා)

  මිනිසා මැව්වෙ කවුරු වගේද? (දෙවියන්වහන්සේගේ ස්වරූපයට අනුව)

- ආදරය, කරුණාව, එඩිතරකම ........ වැනි ගුණාංග සිසුන් පහදා දීම පිණිස පහත උදාහරණ ලෙස දක්වා ඇති ආකාරයට සිසුන්ගෙන් ප්‍රශ්න අසමින් සාකච්ඡා කරන්න.

  උදා: ස්වරූපයට අනුව කියල අපි කියන්නේ, මගේ අම්මා වගේ, මගේ තාත්ත වගේ කියල, එහෙම නේද? අම්මා වගේ කියල කියන්නෙ, අම්මගෙ කොණ්ඩෙ, අම්මාගේ මූණ, අත පය නො වෙයි.

  තාත්තා වගේ කියල කියන්නෙත් තාත්තාගේ කොණ්ඩෙ, මූහුණ, අත පය නො වෙයි.

  අම්මාගේ, තාත්තාගේ ගුණාංග මොනව ද? ආදරය, කරුණාව, එඩිතරකම, උත්සාහය. (මෙය සරල ව පහදා දෙන්න.)

  දෙවියන්වහන්සේගේ ම ස්වරූපය කියන්නේ, උන්වහන්සේගේ ගුණාංගවලට අනුව අපි එක් එක්කෙනාව මවලා තියන නිසයි.

- දෙවියන්වහන්සේ ඒ තරමට මිනිසාට දයානුකම්පාව දක්වන බව අපි ඉගෙන ගනිමු යැයි පවසන්න.

පියවර 2

- ශුද්ධ බයිබලයේ උත්පත්ති 1 ː 27 පාඨය ගුරුතුමා/තුමිය ශබ්ද නගා කියවන්න.
  **"දෙවියන්වහන්සේ තම ස්වරූපය අනුව මිනිසා මැවූ සේක; දෙවියන්වහන්සේගේ ම ස්වරූපය අනුව ඔවුන් මවා වදාළ සේක; පුරුෂයා ද ස්ත්‍රිය ද වශයෙන් ඔවුන් මැවූ සේක."**
- සිසුන්ගෙන් ප්‍රශ්න අසන්න.
  පුරුෂයාගේ නම මතකද ? ''ආදම්''
  ස්ත්‍රියගෙ නම ? ''ඒව''

පියවර 3

දෙවියන්වහන්සේගේ දයානුකම්පා ගුණය විස්තර කරනු පිණිස ඉහත බයිබල් පාඨය ඇසුරෙන් ආදම් හා ඒවාට වස්ත්‍ර හැඳවූ සිද්ධිය තුළින් ඉස්මතු වන ලෙස තවදුරටත් සිසුන් ට පැහැදිලි කර දෙන්න.

උදාඃ මේ දෙන්නට ම අඳින්න වස්ත්‍ර තිබුණෙ නෑ. කොළ අතු තමයි ඇඳගෙන හිටියේ.

- අපි හැම දෙනාට ම දයානුකම්පාව, ආදරය දක්වන දෙවියන්වහන්සේ ''ආදම්'' සහ ''ඒව'' ට 'හම්' වස්ත්‍ර අඳින්න සැලැස්වූ බවත් ශුද්ධ බයිබලයේ සඳහන් වෙන බව පවසන්න.
- උත්පත්ති 3 ː 21 පාඨය සිසුන් සමග කියවන්න.
  ''දෙවි සමිඳාණන්වහන්සේ හම් වස්ත්‍ර සාදා ආදම්ට සහ ඔහුගේ භාර්යාවට හැඳවූ සේක.''

**සිසු ක්‍රියාකාරකම් පොත සඳහා උපදෙස් ː**

- පාඩමට අදාළ ක්‍රියාකාරකම සොයා ගැනීමට මග පෙන්වන්න.
- ශු. බයිබලයේ උත්පත්ති 1ː 27 වන පදය ගුරුභවතා සමග සහකියවන්න.
- "ආදම්" සහ "ඒව" ගේ පින්තූරවලට වියලා ගත් කෙසෙල් කොළ ඉරා අලවා ඇඳුම ඇලවීමට මග පෙන්වන්න.
- සිසුන් සමග ගීතයක එක පදයක් ගායනය කරන්න. (සිසු ක්‍රියාකාරකම් පොතෙහි සටහන්ව ඇත.)

දේව පියා අප සලකා
කරුණ ගුණ හඳුනා දුන්නා
අප දිරියත් සවි බලයත්
සතුටින් බෙදා ගමූ
දැහැමින් කල් යවමූ. //

**තක්සේරු කිරීම**

| **කාර්ය සාධන ප්‍රමිතිය** | **තක්සේරු නිර්ණායක අංකය** | **ප්‍රවීණතාවට පැමිණ ඇත.** | | **ප්‍රවීණතාවට දුරස්ථ ය.** | |
|---|---|---|---|---|---|
| | | **මට්ටම 4** | **මට්ටම 3** | **මට්ටම 2** | **මට්ටම 1** |
| 2.2 ආගමික කතන්දර ඇසුරෙන් ආගමික ශාස්තෘවරයාගේ සුවිශේෂ ගුණාංග යක් ප්‍රකාශ කරයි. | 2.2.1 | දෙවියන් වහන්සේ දයාවෙන් යුතු බව ප්‍රකාශ කරයි. | දෙවියන් වහන්සේ දයාවෙන් යුතු බව තරමක් දුරට ප්‍රකාශ කරයි. | දෙවියන් වහන්සේ දයාවෙන් යුතු බව තවත් සිසුවෙකුගේ සහය ඇතිව ප්‍රකාශ කරයි. | දෙවියන් වහන්සේ දයාවෙන් යුතු බව ප්‍රකාශ කිරීමට අපොහොසත් වෙයි. |
| 2.3 ආගමික කතන්දර ඇසුරින් ලබා ගත හැකි ආදර්ශ ප්‍රකාශ කරයි. | 2.3.1 | දේව දයාව අප තුළද ඇති කර ගත යුතු බව පවසයි. | දේව දයාව අප තුළ ද ඇති කර ගත යුතු බව තරමක් දුරට පවසයි. | දේව දයාව අප තුළ ද ඇති කර ගත යුතු බව තවත් සිසුවෙකුගේ සහය ඇතිව පවසයි. | දේව දයාව අප තුළද ඇති කර ගත යුතු බව ප්‍රකාශ කිරීමට අපොහොසත් වෙයි. |

# සංකල්පය - චරිත සංවර්ධනය

## 02 පාඩම - ප්‍රේමය

ප්‍රේමය ජේසුස්වහන්සේ තුළ පැවති උතුම් ගුණාංගයක් බව හඳුනා ගෙන එම ගුණාංගය තමා තුළ ද වර්ධනය කර ගනිමින් උන්වහන්සේට ප්‍රතිප්‍රේමය දක්වමින් එකිනෙකාට ප්‍රේමය දැක්වීමට ස්වයං පෙලඹවීමක් ඇති කිරීම පාඩම අරමුණු වේ.

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්යසාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 2. ආගමික ශාස්තෘවරයා/ නිර්මාතෘවරයා පිළිබඳ කතාන්දර හා උපදේශ කාව්‍ය ඇසුරෙන් චරිත සංවර්ධනයට අදාළ සුවිශේෂ ගුණාංග ප්‍රකාශ කරයි. | ජේසුස්වහන්සේගේ ගුණාංග | 2.2 ආගමික කතන්දර ඇසුරෙන් ආගමික ශාස්තෘවරයාගේ සුවිශේෂ ගුණාංග යක් ප්‍රකාශ කරයි. | 2.2.1 සුවිශේෂ ගුණාංගයක් ප්‍රකාශ කිරීම |
| | | 2.3 ආගමික කතාන්දර ඇසුරින් ලබාගත හැකි ආදර්ශ ප්‍රකාශ කරයි. | 2.3.1 ආදර්ශයක් ප්‍රකාශ කරයි. |

**ඉගෙනුම් සම්පත් :**

- ශුද්ධ බයිබලය ශු. මාර්ක් 10 ඃ 13-16
- ප්ලැනල් පුවරු රූප, පාට පැන්සල්/ පාට කුරු

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**ක්‍රියාකාරකම 1**

**පියවර 1**

- සිසුන් සමග ගුරුතුමිය සුහද කතාබහේ යෙදෙමින් කුඩා සාකච්ඡාවක යොදවන්න.
  උදා: දුවලා පුතාලා වැඩියෙන් ම ආදරේ කාට ද? (අම්මට/ තාත්තට හෝ වෙනත් කෙනෙකුගේ නම සදහන් කරන්නට පුළුවන්) එසේම දුවලා පුතාලගෙ අම්මා, තාත්තා වැඩියෙන් ම ආදරේ කාට ද?
- සිසුන්ගේ විවිධ පිළිතුරු සාකච්ඡා කරන්න.

**පියවර 2**

- මම අද කතාන්දරයක් කියන්න යන්නේ යනුවෙන් පවසමින් ශු. මාක් 10 ඃ 13 - 16 අදාල සිද්ධිය කතන්දරයක් ආකාරයෙන් පැනල් පුවරුවේ රූප අලවමින් සිසුන්ට කියා දෙන්න.

**කතන්දරයට පසුබිම**

- ජේසුස්වහන්සේ ජීවත් වූ එදා සමාජයේ දරුවන් එතරම් විශේෂ වූ පිරිසක් ලෙස නොසැලකූ බව පවසන්න.

**කතාන්දරය**

පහත කරුණුවලට වැඩි අවධානයක් ලබා දෙන්න.

- දිනක් ජේසුස්වහන්සේ උන්වහන්සේ ශ්‍රාවකයන් සමග සිටි මොහොතක, සමහර අය තමන්ගේ ළදරුවන් ජේසුස්වහන්සේගෙන් අත් තබවා ආශිර්වාද ලබා ගැනීමට උන්වහන්සේ වෙත ගෙන ආ බව
- ශ්‍රාවකයන් ඔවුන්ට ළදරුවන් ජේසුස්වහන්සේ වෙත නොගෙන එන ලෙස තරවටු කළ බව
- ජේසුස්වහන්සේ ඒ දැක අමනාප වුණා උන්වහන්සේගේ ශ්‍රාවකයන් කළ ක්‍රියාව ජේසුස්වහන්සේ අනුමත කළේ නැති බව.

- "ළදරුවන්ට මා වෙත එන්න ඉඩ හරින්න. ඔවුන්ව නොවළක්වන්න දෙවියන්වහන්සේගේ රාජ්‍යය මෙබඳු අය සන්තක ය." යනුවෙන් ජේසුස්වහන්සේ ශ්‍රාවකයන්ට පැවසූ බව
- ජේසුස්වහන්සේ දරුවන් තුරුලු කර ගෙන ඔවුන් පිට අත් තබා ඔවුන්ට ආශීර්වාද කළ බව

පියවර 3
- ශු: මාර්ක් 10:13-16 සිසුන්ට ඇසෙන සේ ශබ්ද නඟා කියවන්න.

පියවර 4
ඉහත කියාදුන් බයිබල් කතන්දරය ඇසුරෙන් සිසුන්ගෙන් කෙටි ප්‍රශ්න කිහිපයක් අසමින් කුඩා සාකච්ඡාවක් මෙහෙයවන්න.

01) වැඩිහිටියන් තම දරුවන් වඩාගෙන ආවේ කා වෙතට ද?
02) ඔවුන් දරුවන් වඩාගෙන පැමිණියේ කුමක් පිණිස ද?
03) එවිට සිදුවූ සිදුවීම කුමක් ද?
04) ජේසුස් වහන්සේ එවිට කුමක් කළේ ද?

පියවර 5
- සිද්ධි ඇසුරෙන් ජේසුස්වහන්සේගේ ආදරය ප්‍රේමය කෙබඳුදැයි සිසුන් සමග සාකච්ඡා කරන්න.
- එදා වගේ ම අදත් ජේසුස්වහන්සේ දරුවන් ට ආදරේ බව කියා දෙන්න.
- උන්වහන්සේගේ ප්‍රේමයට සීමාවක් නැති බව පහදන්න.
- ජේසුස්වහන්සේගේ ප්‍රේමයේ ගුණාංග තම ජීවිතාදර්ශය කර ගනිමින් අපට අන් අයට ප්‍රේමය පෙන්විය හැකි ආකාරය විමසන්න.

පියවර 6
- සිසුන් සමග පහත සඳහන් ගීතය අංගචලන සහිත ව ගායනා කරන්න.

ජේසුස් ඔබට ආදරෙයි
මමත් ඔබට ආදරෙයි
විය යුතු එලෙසයි

**තක්සේරු කිරීම**

| කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක අංකය. | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | මට්ටම 4 | මට්ටම 3 | මට්ටම 2 | මට්ටම 1 |
| 2.2 ආගමික කතන්දර ඇසුරෙන් ආගමික ශාස්තෘවරයාගේ සුවිශේෂ ගුණාංගයක් ප්‍රකාශ කරයි. | 2.1.1 | ජේසුස් වහන්සේ දරුවන්ට ප්‍රේම කළ බව ප්‍රකාශ කරයි. | ජේසුස් වහන්සේ දරුවන්ට ප්‍රේම කළ බව සුළු අඩුපාඩු සහිත ව ප්‍රකාශ කරයි | ජේසුස් වහන්සේ දරුවන්ට ප්‍රේම කළ බව තවත් සිසුවෙකුගේ සහය ඇති ව ප්‍රකාශ කරයි. | ජේසුස් වහන්සේ දරුවන්ට ප්‍රේම කළ බව ප්‍රකාශ කිරීමට නොහැකි වෙයි. |
| 2.3 ආගමික කතන්දර ඇසුරින් ලබා ගත හැකි ආදර්ශ ප්‍රකාශ කරයි. | 2.3.1 | ජේසුස් වහන්සේගේ ප්‍රේමයේ ආදර්ශය අනුව අප ද ක්‍රියා කළ යුතු බව පවසයි. | ජේසුස් වහන්සේගේ ප්‍රේමයේ ආදර්ශය අනුව අප ද ක්‍රියා කළ යුතු බව සුළු අඩුපාඩු සහිත ව පවසයි. | ජේසුස් වහන්සේගේ ප්‍රේමයේ ආදර්ශය අනුව අප ද ක්‍රියා කළ යුතු බව තවත් සිසුවෙකුගේ සහය ඇති ව පවසයි. | ජේසුස් වහන්සේගේ ප්‍රේමයේ ආදර්ශය අනුව අප ද ක්‍රියා කළ යුතු බව ප්‍රකාශ කිරීමට අපොහොසත් වෙයි. |

# සංකල්පය චරිත සංවර්ධනය
# 03 පාඩම - ප්‍රීතිය නමැති තෑග්ග

යහපත් වටිනාකම් ඇති කරන ශුද්ධාත්මයාණන්වහන්සේ ජීවිතයට පිළිගනිමින් ශුද්ධාත්ම ඵල වන ප්‍රීතිය තම ජීවිතය තුළ ක්‍රියාකාරී ව පෙන්වීම මෙම පාඩමේ අරමුණ වේ.

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්යසාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 2. ආගමික ශාස්තෘවරයා/ නිර්මාතෘවරයා පිළිබඳ කතන්දර හා උපදේශ කාව්‍ය ඇසුරෙන් චරිත සංවර්ධනයට අදාළ සුවිශේෂ ගුණාංග ප්‍රකාශ කරයි. | ජේසුස්වහන්සේගේ ගුණාංග | 2.2 ආගමික කතන්දර ඇසුරෙන් ආගමික ශාස්තෘවරයාගේ සුවිශේෂ ගුණාංග යක් ප්‍රකාශ කරයි. | 2.2.1 සුවිශේෂ ගුණාංග යක් ප්‍රකාශ කිරීම |
| | | 2.3 ආගමික කතාන්දර ඇසුරින් ලබා ගත හැකි ආදර්ශ ප්‍රකාශ කරයි. | 2.3.1 ආදර්ශයක් ප්‍රකාශ කරයි. |

**ඉගෙනුම් සම්පත් :**

- ශුද්ධ බයිබලය හා පාඨ - ගලාති 5:22 /පිලිප්පි 4:4
- අලංකාරව ඔතා ගත් තෑග්ගක්
- තෑගි ලෙස ලැබෙන විවිධ දේවල් වල පින්තූර
- පාට කූරු A4 කොළයක්
- ගම්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පියවර 1**

දෙවියන්වහන්සේ මිනිසාට දැක් වූ ප්‍රේමය නිසා දුන් උතුම්ම ත්‍යාගය ජේසුස්වහන්සේව මේ ලෝකයට එවීම බව සිසුනට පහදා දෙනු පිණිස පහත ප්‍රශ්න අසමින් සාකච්ඡාව ගොඩ නඟන්න.

- අපිට ගොඩක් ආදරය කරන්නේ කවුද? අම්මා, තාත්තා, ආච්චි, සීයා, ගුරුතුමී, පියතුමා, යාළුවෝ
- ඒ වගේම අපිට ගොඩක් ආදරය කළා "ජේසුස්වහන්සේ" අපිට කොතරම් ආදරෙයි ද? මොනව ද අපි වෙනුවෙන් කළේ එතුමා? සමාව දුන්නා, හොඳ දේවල් කියලා දුන්නා, ආදරය කළා, අපි කරපු වැරදිවලට කුරුසියේ දුක් වින්දා.

**පියවර 2**

- සකස් කර ගෙනෙන ලද ගුරුතුමී ළඟ ඇති තෑග්ග මේසය මත තබන්න. ඒ ඇසුරෙන් ත්‍යාගය පිළිබඳ සිසුන්ගේ කුතුහලය ඇති කරවන ආකාරයේ ප්‍රශ්න කිහිපයක් අසන්න.
- උදා: මොකක් ද මේ දරුවනේ? තෑග්ගක්. මොනවගේ තෑග්ගක් වෙන්න ඇති ද?
- අපිට තෑගි ලැබුණම මොක ද හිතෙන්නේ?
- අපි තෑගි ලැබෙනවට කැමතියි නේද?
- අපිට ආස ම තෑගි ලැබෙනවට අපි ගොඩක් කැමති බව පවසන්න.
- අපි ඒ ප්‍රීතිය සතුට සැමදාට ම පවත්වා ගැනීමට තෑග්ග පරිස්සම් කරමින් හා පිරිසිදු කරමින් තබා ගන්නා බව පවසන්න.

පියවර 3

- සිසුන් ඉදිරියට කැඳවන්න. ඒ ඇසුරෙන් සාකච්ඡාව තවදුරටත් කරන්න.
- පෙට්ටිය තුළ මුහුණ බලන කණ්ණාඩියක් තබා තෑග්ගක් ලෙස ඔතා තබන්න.
- හොඳයි අපි තෑග්ග බලමු යැයි කියමින්, ත්‍යාගය ලෙස ඇති පාර්සලය/පෙට්ටිය ලිහිමින් සිසුන් එක් එක් කෙනාට එහි ඇතුළත බලන්නට අවස්ථාව සපයන්න.
- දෙවියන්වහන්සේ එම තෑග්ග අම්මා, තාත්තා අතේ එවා තිබෙන බව පවසන්න.
- තනි තනිව සිසුන් ගෙන්වා තෑග්ග බලන්න දෙන්න.
- සිසුන් එවිට ඔවුන්ගේ මුහුණ දකින විට "ඔයා තමයි අපි ලබපු ලොකුම තෑග්ග. ඔයා අපිට වටිනා තෑග්ගක්. අපේ ප්‍රීතිය සතුට ඔයයි චූටි දුවේ, පුතේ." යැයි පවසන්න.

පියවර 4

- බයිබල් පාඨය සිසුන්ට ඇසෙන සේ කියවන්න. ගලාති 5 : 22
- "එහෙත් ආත්මයාණන් කරණ කොටගෙන ඇතිවන ප්‍රතිඵල නම්ඃ ප්‍රේමය, ප්‍රීතිය... යන මේවා ය."
- ක්‍රියාකාරකම් පොතෙහි සඳහන් තෑගි දීමෙන් හා ලැබීමෙන් ඇතිවන සතුට පහදා දෙන්න.
- කෙටි ගීතිකාවක්, රංගනය සමග ගායනා කරන්න.

    ඔබට ප්‍රීති නම් අත්පුඩි ගසන්න ///
    ඔබ ප්‍රිය දෙවිතුමා ආදරෙන් බලා සිටී
    ඔබට ප්‍රීති නම් අත්පුඩි ගසන්න ...
    ඔබට ප්‍රීති නම් උඩපනින්න ///
    ඔබට ප්‍රීති නම් ආමෙන් කියන්න///"

පියවර 5

- ප්‍රීතිය ගෙන දෙන්නේ ශුද්ධාත්මයාණන් බව පවසන්න.
- ඉහත සවිතර කෙරුණ ප්‍රීතිය ඇතිවන්නේ තමන් තුළ ශුද්ධාත්මයාණන් සිටින නිසා බව සරලව විස්තර කරන්න.
- තමා කළ ශුද්ධාත්මයාණන් සිටින හෙයින් ප්‍රීතිමත්ව ජීවත්විය යුතු බව පෙන්වාදෙන්න.
- ඉහත කෙටි ගීතිකාව වඩා ප්‍රීතිමත්ව නැවත රංගනය සමඟ ගයනයේ යෙදෙන්න.

**සිසු ක්‍රියාකාරකම් පොත සඳහා උපදෙස් :**

- ප්‍රීතිය නැමති ගස පාට කරන්න.
- ප්‍රීතිය ගස තුළ ඇලවීම සඳහා පහත සඳහන් රූප 3 ගුරුවරයා විසින් සකස් කර ගන්න. නැතහොත් ඇඳීමට අවස්ථාව දෙන්න.
  (යහළුවන්/ ගායනා කරනවා/ වැඩිහිටියන්/සෙල්ලම් කරනවා/ජේසුස්වහන්සේ)
- ප්‍රීතිය නමැති ගස තුළ, ඉහත සඳහන් පින්තූර කපා ඇලවීමට සිසුන් යොමු කරන්න.

තක්සේරු කිරීම

| කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක අංකය. | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | මට්ටම 4 | මට්ටම 3 | මට්ටම 2 | මට්ටම 1 |
| 2.2 ආගමික කතන්දර ඇසුරෙන් ආගමික ශාස්තෘවරයාගේ සුවිශේෂ ගුණාංගයක් ප්‍රකාශ කරයි. | 2.1.1 | ප්‍රීතිය ශුද්ධාත්මයාණන් වහන්සේගේ ඵලයක් බව ප්‍රකාශ කරයි. | ප්‍රීතිය ශුද්ධාත්මයාණන් වහන්සේගේ ඵලයක් බව තරමක් දුරට ප්‍රකාශ කරයි. | ප්‍රීතිය ශුද්ධාත්මයාණන් වහන්සේගේ ඵලයක් බව තවත් සිසුවෙකුගේ උපකාර ඇතිව ප්‍රකාශ කරයි. | ප්‍රීතිය ශුද්ධාත්මයාණන් වහන්සේගේ ඵලයක් බව ප්‍රකාශ නො කරයි. |
| 2.3 ආගමික කතන්දර ඇසුරින් ලබා ගත හැකි ආදර්ශ ප්‍රකාශ කරයි. | 2.3.1 | ශුද්ධාත්මයාණන් වහන්සේගේ ඵලයක් වූ ප්‍රීතිය තම ජීවිතයට ආදර්ශයක් කර ගනිමින් රංගනයේ හා ගායනයේ යෙදේ. | ශුද්ධාත්මයාණන් වහන්සේගේ ඵලයක් වූ ප්‍රීතිය තම ජීවිතයට ආදර්ශයක් කර ගනිමින් රංගනයේ හා ගායනයේ තරමක් දුරට යෙදේ. | ශුද්ධාත්මයාණන් වහන්සේගේ ඵලයක් වූ ප්‍රීතිය තම ජීවිතයට ආදර්ශයක් කර ගනිමින් තවත් සිසුවෙකුගේ උපකාර ඇතිව රංගනයේ හා ගායනයේ යෙදේ. | ශුද්ධාත්මයාණන් වහන්සේගේ ඵලයක් වූ ප්‍රීතිය තම ජීවිතය තුළ නො පෙන්වයි. |

# සංකල්පය චරිත සංවර්ධනය
# 04 පාඩම - අපේ පූජනීය ග්‍රන්ථය

කිතුනුවන්ගේ පූජනීය ග්‍රන්ථය බයිබලය බව හඳුන්වා දීමත් එහි සැකස්ම පිළිබඳ සරල අවබෝධයක් ලබා දීම මෙයින් අපේක්ෂිත ය.

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්යසාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 1. චරිත සංවර්ධනයට අදාළ මූලික ආගමික ඇවතුම් පැවතුම් වාග් මාලාව සංකේත හා ආගමික පාඨ ඇසුරින් තම ආගම පිළිබඳ ප්‍රකාශ කරයි. | ශුද්ධ බයිබලය හා ඉගැන්වීම් | 1.2 ආගමට සුවිශේෂ වූ වදන් උචිත අවස්ථාවන්හිදී භාවිත කරයි. | 1.2.1 සුවිශේෂ ආගමික වදන් හඳුනා ගැනීම. |
| | | 1.3 ආගමට අදාළ මූලික සංකේත හඳුනා ගනියි. | 1.3.1 සංකේත හඳුනා ගැනීම. |


**ඉගෙනුම් සම්පත් :**
- ශුද්ධ බයිබලය
- පාඩමට අදාළ පින්තූර
- පාට පැන්සල්/ A4 පාටකොළ/ කතුරු/ ගම්/ බ්‍රිසිල්ඩ් බෝඩ්
- කෝටු හෝ බට කැබලි 2ක්, රෙදි කැබැල්ලක් ආශ්‍රිතව සැකසූ හැකුලුම් පත්
- රෙදි කැබැල්ලක්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**
**ක්‍රියාකාරකම 1**
**පියවර 1**
- බයිබලය කිතුනු අපේ පූජනීය ග්‍රන්ථය බව පෙන්වමින් සිසුන් සමග සාකච්ඡාවකට පිවිසෙන්න.

**පියවර 2**
- ශු. බයිබලය අතට ගෙන පහත සඳහන් කෙටි ප්‍රශ්නවලට සිසුන්ගෙන් වාචික ව පිළිතුරු විමසන්න.
  උදා: මේ පොතේ තියෙන්නේ මොනවා ද? (දේව මග පෙන්වීම තුළ ලියවුණු දේව වචනය බව)
- එහි කොටස් 2ක් ඇති බව කියා දෙන්න.
- එම කොටස් 2ක නම් කරන්නේ පරණ ගිවිසුම හා අලුත් ගිවිසුම යනුවෙන් බව පවසන්න.
- මේ එක පොතක් ඇතුලේ පොත් හා කතන්දර ගොඩක් තියෙන බව පවසන්න.
- මෙය ලියුවේ මිනිසා වුවත් දේව අනුහසින් බව කියා දෙන්න.
- පරණ ගිවිසුම පොත් ඇතුළේ දෙවියන්වහන්සේ ලොව මැවීම හා උන්වහන්සේ කළ අනිකුත් ක්‍රියාවන් බව පවසන්න.
- ජේසුතුමන්ගේ උපත හා උන්වහන්සේගේ ඉගැන්වීම් නව ගිවිසුමේ ලියා ඇති බව පවසන්න.


පියවර 3

- බයිබලය මුලින් ම ලියවී තිබුණ මුලාශ්‍ර ගැන පහදමින් එම පින්තූර පෙන්වන්න.




ගල් පුවරු 2





හැකුලුම් පත්

- එය මනා ලෙස නිරීක්ෂණය කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.

පියවර 4

- රෙදි කැබැල්ලක් හෝ දිග කඩදාසියක් භාවිත කර කෝටු හෝ බට කැබලි 2 ඇසුරෙන් හැකුලුම් පත ගුරුතුමිය විසින් නිර්මාණය කර සිසුන්ට පෙන්වන්න.
- සිසු ක්‍රියාකාරකම් පොතෙහි සටහන් කර ඇති මෝසෙස්තුමා සහ ගල් පුවරුව පාට කිරීමට මඟ පෙන්වන්න.
- ක්‍රියාකාරකම් පොතෙහි සඳහන් මෙම ගීතිකාව සිසුන් සමඟ ගායනා කරන්න.

**තක්සේරු කිරීම**

| කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක අංකය. | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | මට්ටම 4 | මට්ටම 3 | මට්ටම 2 | මට්ටම 1 |
| 1.2 ආගමට සුවිශේෂ වූ වදන් | 1.3.1 | ශුද්ධ බයිබලය කිතුනුවන්ගේ පූජනීය ග්‍රන්ථය බව ප්‍රකාශ කරයි. | ශුද්ධ බයිබලය කිතුනුවන්ගේ පූජනීය ග්‍රන්ථය උදව් ඇති බව ප්‍රකාශ කරයි | තව කිසිවෙකුගේ ආධාර ඇතිව කිතුනුවන්ගේ පූජනීය ග්‍රන්ථය බයිබලය බව ප්‍රකාශ කරයි | කිතුනුවන්ගේ පූජනීය ග්‍රන්ථය බයිබලය බව කීමට අපොහොසත් වෙයි |
| | 1.2.1 | එහි පරණ ගිවිසුම සහ අලුත් ගිවිසුම කොටස් දෙකකින් සමන්විත බව කියයි. | එහි ප්‍රධාන කොටස් දෙක පරණ ගිවිසුම හා අලුත් ගිවිසුම බව තරමක් දුරට ප්‍රකාශ කරයි | එය අලුත් ගිවිසුම යන කොටස් දෙකක් සමන්විත බවත් උදව් ඇතිව ප්‍රකාශ කරයි. | එහි අනුකොටස් වූ පරණ ගිවිසුම් පිළිබඳ කිසිදු අදහස් ප්‍රකාශ කිරීමට අපොහොසත් වෙයි. |

# සංකල්පය චරිත සංවර්ධනය

# 05 පාඩම - දෙවිඳුන් හා කතා කරමු

චරිත සංවර්ධනයට අදාළ මූලික කිතුනු ඇවතුම් පැවතුම් හා බයිබල් පාඨ ඇසුරින් සුවිශේෂ ගුණාංග වන යාච්ඤාවේ වැදගත්කම හඳුනා ගැනීම අපේක්ෂිත ය.

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්යසාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 1. චරිත සංවර්ධනයට අදාළ මූලික ආගමික ඇවතුම් පැවතුම් වාග් මාලාව සංකේත හා ආගමික පාඨ ඇසුරින් තම ආගම පිළිබඳ ප්‍රකාශ කරයි. | යාච්ඤාව | 1.1 ආගමික සුවිශේෂ වූ අවස්ථාවන්වලට සහභාගි වී අද්දැකීම් ලබයි | 1.1.1 සහභාගි වීම |
| | | 1.2 ආගමට සුවිශේෂි වූ වදන් උචිත අවස්ථාවන්හි දී භාවිත කරයි. | 1.2.2 උචිත අවස්ථාවන්හිදී භාවිත කරයි |

**ඉගෙනුම් සම්පත් :**

- ශුද්ධ බයිබලය 1 සාමුවෙල් 1 : 10 - 28,
- ගීතාවලිය 50 වන ගීතය 15 පදය මුල් කොටස
- හන්නා, එල්කානා හා ඒලී පූජකතුමාගේ අත් රූකඩ හෝ දඬු රූකඩ සහිත පින්තූර
- සිසු නිර්මාණ සඳහා ඝන කඩදාසි, වර්ණ ගැන්වීමට අවශ්‍ය ද්‍රව්‍ය, ගම්, කතුර ආදිය

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**ක්‍රියාකාරකම 1**

**පියවර 1**

- ගුරුතුමිය, සිසුන් සමග යාච්ඤාවක් කරමින් පාඩමට පිවිසෙන්න.
- ශුද්ධ බයිබලයේ ඇති කතන්දරයක් ඇසීමට යන බව පවසන්න.
- ඒ කතන්දරයට දෙවියන්වහන්සේ සමග චරිත 4 ක් ඇති බව කියන්න.
- එනම්, හන්නා, එල්කානා, ඒලී පූජකතුමා සහ සාමුවෙල්.
- (හන්නා, එල්කානා සහ ඒලී පූජකතුමාගේ කලින් සූදානම් කර ගත් තරමක් විශාල ප්‍රමාණයේ අත් රූකඩ හෝ දඬු රූකඩ භාවිත කරමින් කථාව ගොඩනගන්න.)
- හන්නාගේ ස්වාමි පුරුෂයා එල්කානා බවත්, ෂිලෝහි දෙවියන්වහන්සේගේ මැදුරෙහි සිටින පූජකතුමා ඒලී බවත් හඳුන්වා දෙන්න.

**පියවර 2**

- අත් හෝ දඬු රූකඩ ඇසුරෙන් ගුරුතුමිය පහත දෙබස් සමග කතාව කියන්න.
- හන්නාගේ පින්තූරය සමගින් ඔබගේ හඬ අවදි කරන්න. ඒ ඒ චරිතයට අනුව හඬ වෙනස් කරමින් කතන්දරය ගොඩනගන්න.

**(දවසක් දුකින් අඬමින් සිටින හන්නා ව එල්කානා දකිනවා.**

එල්කානා : හන්නා ඔබ ඇයි අඬන්නේ ? මම ඔබට ගොඩක් ආදරෙයි. ඔයාටත් මාව වටිනවා නේද? කෑම කාලා ශක්තිමත්ව ඉන්න.

හන්නා : (දේව මැදුරෙහි ගොඩාක් දුකින් අඬමින්) ''මට පිරිමි දරුවෙකු ලබා දෙන්න කියල, මම සමිඳාණන්වහන්සේට යාච්ඤා කළා''

හන්නා : ''අනේ සමිඳාණෙනි, ඒ දරුවා මම ඔබවහන්සේට කැප කරනවා.'' (මෙලෙස හන්නා නිශ්ශබ්ද ව දිගට ම යාච්ඤා කළා.)

**(ඒ හන්නාගේ යාච්ඤාව ඒලී පූජකතුමාට ඇහෙනවා. ඔහු දෙවියන්වහන්සේගේ නියෝජිතයෙක්)**

ඒලී පූජකතුමා :''හන්නා ශාන්ත සිතින් යන්න.'' ඉශ්‍රායෙල්වරුන්ගේ දෙවියන්වහන්සේගෙන් ඔබ කළ ඉල්ලීම, උන්වහන්සේ ඔබට ඉෂ්ඨ කර දෙන සේක.

හන්නා :''ඔබේ දාසිය වන මා හට ඔබ ඉදිරියේ කරුණාව ලැබේවා''
(සමිඳාණන්වහන්සේට යාච්ඤා කළ හන්නාගේ මුහුණ ප්‍රීතියට පත් වූවා ය. ඈ ගොස් කෑම කෑවා ය.)

පියවර 3

- කතාවේ සඳහන් වූ පහතින් දක්වන විශේෂිත කරුණු පහදා දෙන්න.
  උදා: එල්කානා සහ හන්නා සමිඳාණන්වහන්සේට ස්තුති නමස්කාර කළබව.
  දෙවිඳුන්ට **යාච්ඤා** කළ, දෙවිඳුන්ට කතා කළ හන්නාට සහ එල්කානාට පුතෙකු ලැබුණු බව, ඒ දරුවාගෙ නම **සාමුවෙල්**.
  සාමුවෙල් තම දෙමව්පියන් ළඟ ඇති දැඩි වූ පසු සමිඳාණන් වහන්සේගේ මාලිගාව වන ඒලී පූජකතුමා සිටි දෙව් මැදුරට ගියේ පොරොන්දුව ඉටු කරන පිණිස බව.
- ඔවුන් සතුටින්, ප්‍රීතියෙන් පුංචි සාමුවෙල්ව ඒලී පූජකතුමාගේ දෙව් මැදුරට කැප කරන ලද බව කියා දෙන්න.


පියවර 4

- බයිබල් කතාන්තරයට අදාළ ව සිසුන් සමග පහත කරුණු ඉස්මතු වන ලෙස සාකච්ඡා කරන්න.
  උදා: හන්නා සහ එල්කානා ප්‍රීතියට පත් වුණා ද? ඔව්. මොනව ද ඒ අය කළේ?
  හන්නා අඬමින් දෙවිඳුන්ට යාච්ඤා කළ බව හා දෙවියන්වහන්සේ පිළිතුරු දුන් බව.
- දෙවියන්වහන්සේ දුන් පිළිතුර ලෙස හන්නාට පුතෙකු ලැබුණු බව පවසන්න.
- දෙවිඳුන්ට යාච්ඤා කළ, දෙවිඳුන්ට කතා කළ හන්නාට සහ එල්කානාට ලැබුණු දරුවා සාමුවෙල් බව පවසන්න.
- ඔවුන් ප්‍රීතියෙන් සාමුවෙල්ව ඒලී පූජකතුමාගේ දෙව් මැදුරට කැප කරන ලද බව කියා දෙන්න.
- අපිත් දෙවිඳුන්ට කතා කරන්න අවශ්‍ය බව පවසා අපේ සතුට, ප්‍රීතිය වගේ ම දුක් කරදර උන්වහන්සේට යාච්ඤාවෙන් පැවසීමට යොමු කරන්න. (දෙවිඳුන් අප සමගයි)

**සිසු ක්‍රියාකාරකම් පොත සඳහා උපදෙස් :**

- ශුද්ධ බයිබලයේ 1 සාමුවෙල් 1: 17 වන පදය ගුරුවරයා සමඟ පහත බයිබල් පදය පැහැදිලිව ලියා ප්‍රදර්ශණ කරයි. කියවීමට යොමු කරන්න.
  **''ශාන්ති සිතින් යන්න, ඉශ්රායෙල්වරුන්ගේ දෙවියන්වහන්සේගෙන් ඔබ කළ ඉල්ලීම උන්වහන්සේ ඔබට ඉෂ්ට කර දෙන සේක්වා''යි කීවේය.**

- කටපාඩම් කළ යුතු බයිබල් පාඨය ගීතාවලිය 50 වන ගීතය 15 පදය මුල් කොටස
  **''විපත්තියේදී මට යාච්ඤා කරන්න. මම නුඹ මුදන්නෙමි.''**



**තක්සේරු කිරීම**

| කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක අංකය. | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | මට්ටම 4 | මට්ටම 3 | මට්ටම 2 | මට්ටම 1 |
| 1.2 ආගමට සුවිශේෂි වූ වදන් උචිත අවස්ථාවන්හි දී භාවිත කරයි. | 1.2.1 | තමා කරන යාච්ඤාවේදී ආමේන් ජේසුස් වහන්සේගේ නාමයෙන් .... ආදී වදන් භාවිත කරයි. | යාච්ඤාවේදී ආමේන් ජේසුස් වහන්සේගේ නාමයෙන් .... ආදී වදන් ගුරුවරයෙකුගේ මගපෙන්වීම මත භාවිතා කරයි. | යාච්ඤාවේදී ආමේන් ජේසුස් වහන්සේගේ නාමයෙන් .... ආදී වදන් භාවිත කිරීමට අතපසු වෙයි. | යාච්ඤාවේදී ආමේන් ජේසුස් වහන්සේගේ නාමයෙන් .... ආදී වදන් භාවිත කිරීමට හැකියාවක් නැත. |
| 1.2 ආගමට සුවිශේෂි වූ වදන් උචිත අවස්ථාවන්හි දී භාවිත කරයි. | 1.2.2 | කුඩා යාච්ඤාවක් පවසයි. | කුඩා යාච්ඤාවක් අඩුපාඩු සහිතව පවසයි. | තව සිසුවෙකුගේ සහය ඇතිව කුඩා යාච්ඤාවක් පවසයි. | කුඩා යාච්ඤාවක් කිරීමට අපොහොසත් වෙයි. |

# සංකල්පය පාරිසරික සංවේදීත්වය
# 06 පාඩම - අපි ජීවත්වන පොළොව සුරකිමු

ජීවිතය හා පරිසරය බැඳී පවතින ආකාරය දේව වචනය මගින් තේරුම් ගනිමින්, අප ජීවත් වන පොළොව කෙරෙහි සංවේදී වීම. මෙම පාඩමෙන් අපේක්ෂිතය.

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්යසාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 8. තමා අවට පරිසරය පිරිසිදුවට හා පිළිවෙළකට තබා ගැනීමට ක්‍රියා කරයි. | සොබා දහම | 8.1 තමා අවට පරිසරය පිරිසිදු කිරීමට දායක වෙයි. | 8.1.1 ක්‍රියාකාරී සහභාගි වීම |
| | | 8.2 අවට පරිසරය අලංකාර ව පිළිවෙළකට තබා ගැනීමට කටයුතු කරයි. | 8.2.3 උපකරණ භාවිකය |

**ඉගෙනුම් සම්පත් :**

- ශුද්ධ බයිබලය උත්පත්ති 2: 15

  **(ඒදන් උයන වගා කර එය රැකබලා ගැනීම පිණිස දෙවිසමිඳාණන්වහන්සේ මිනිසා රැගෙන ඔහු එහි පදිංචි කරවූ සේක.)**

  **පැළ කළ හැකි කුඩා මල් ඉති හෝ පලා වර්ග ගෙන ඒමට මීට පෙර සතියේ ම දැනුම් දෙන්න.**
- අත්වැස්මක් (Gloves), අත පිසදැමීමට අත් පිස්නයක්, කතුරු, ගම්, මල් බඳුන නිර්මාණය කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය සූදානම් කරගන්න. (ඇමුණුම 1)

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**ක්‍රියාකාරකම 1**

**පියවර 1**

- සිසුන්ට තමන් ආදරය කරන දෙයක් හෝ කෙනෙක් මතක් කර ගන්න කියන්න.
- ඔබ වගේ ම ආදරය කරන දෙයක්, මමත් මතක් කරගන්නම්..... යනුවෙන් ගුරුවරයා ද පවසන්න.

**පියවර 2**

- සිසුන්ගෙන් තමා ආදරය කරන දේ පිළිබඳ ව විමසා සාකච්ඡා කරන්න. ඉහත ලබා දුන් සිසුන්ගේ පිළිතුරු පිළිබඳ ගුරුතුමිය තම අදහස් ප්‍රකාශ නරන්න.

  උදා:- මමත් ඔබ කියූ හැමදෙයට ම ආදරය කරනවා. මේ පරිසරයට මම ගොඩාක් ආදරෙයි. ඒත් විශේෂ ලෙස ආදරය කරන දෙයක් තිබෙනවා. ඒ තමයි අප ජීවත්වන මේ **පොළොව.**
- මේ පොළොව අපට තෑගි කරන දේ ඉතා වටින බව පවසමින් විසිතුරු ගල් වර්ග, පස් වර්ග, රත්තරන්, මිනිරන්, තඹ, මැණික් ආදිය ගැන සිසුන් දැනුවත් කරන්න. මේ පොළොව ආදරයෙන් රැක බලා ගන්න කැමති දැයි විමසන්න.
- හැකි නම් සිසු සිසුවියන් සමග පරිසරය බැලීමට එළිමහනට යන්න. එසේ නැත්නම් පින්තූර පෙන්වන්න. සාකච්ඡාවක් මෙහෙයවන්න.

  උදා:- ලස්සනට පිළිවෙලට අපේ පාසලේ පරිසරය තියෙනකොට අපි ගොඩාක් ආසයි නේද?
  බලන්න මේ පාසලට ඇතුල් වෙන පැත්තනම් පිළිවෙළට ලස්සනට තියෙනවා නේද?
  අපි යමු ඇතුළට, මේ හරිය පිරිසිදු මදි නේද? පිළිවෙළක් නැහැ වගේ නේද?
  මල්/එළවළු පැළ තිබුනට වතුර දාලත් නැහැ, පුංචි වුණත් මල් පැළයකට වතුර ටිකක් දාලා රැක බලා ගන්න ඔබටත් පුළුවන්. අපි අපේ පාසලේ හැම තැන ම අලංකාර ව තබා ගනිමු. පරිසරයට ආදරය කරමු.

■ අප ජීවත් වන පරිසරයට ආදරය නිසා, අපි පරිසරයට තෑගි දෙන්න අවශ්‍ය බව පවසන්න. තෑගි ලෙස මල්, එළවළු, පළතුරු ආදිය සිටුවීම, වතුර දැමීම, පිරිසිදු කිරීම, පිළිවෙළකට තබා ගැනීම කළ යුතු බවත් පහදන්න.

පියවර 3

■ ශුද්ධ බයිබලය උත්පත්ති 2: 15 මතක් කර දෙන්න.

''ඒදන් උයන වගා කර එය රැකබලා ගැනීම පිණිස දෙවිසමිඳාණන්වහන්සේ මිනිසා රැගෙන ඔහු එහි පදිංචි කරවූ සේක.''

පියවර 4

**අද අපි පොළවට තෑගි කරමු. ඉවත ලන භාජනයකින් මල්, පලා වර්ග වැනි අලංකාර බඳුනක් හදමු.**


■ ගුරුතුමිය ඉවත ලන බඳුන අවශ්‍ය ලෙස සූදානම් කර ගන්න.

■ ගෙනවිත් තිබෙන භාජනය සිසුන් ඉදිරියේ තබමින් එයට පොහොර දමා, පැළය සිටුවීමට සිසුන් සහභාගි කරවා ගන්න.

ඇමුණුම 1


**අවශ්‍ය ද්‍රව්‍ය (ගුරුවරයාගේ සූදානම සඳහා)**


■ වැලි, පස්, කොම්පෝස්ට් පොහොර සහ පොල් ලෙලි කැබලි කිහිපයක් (තෙත මිශ්‍රණයක්) කම්බි, වර්ණ ගැන්වීමට අවශ්‍ය දේ ආදිය සපයා ගන්න. බෝතලය වර්ණ ගැන්වීමට ඒ මත වැලි තවරා හෝ අලංකාර කර ගත හැකි ය.











තක්සේරු කිරීම

| කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක අංකය. | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | මට්ටම 4 | මට්ටම 3 | මට්ටම 2 | මට්ටම 1 |
| 8.1 තමා අවට පරිසරය පිරිසිදු කිරීමට දායක වෙයි. | 8.1.1 | පරිසරය පිරිසිදුව හා පිළිවෙළට තබා ගැනීමට දායකත්වය ලබා දෙයි. | පරිසරය පිරිසිදුව හා පිළිවෙළට තබා ගැනීමට තව සිසුවකු සමඟ ක්‍රියාකරයි. | පරිසරය පිරිසිදුව හා පිළිවෙළට තබා ගැනීමට මැළි කමක් දක්වයි. | පරිසරය පිරිසිදුව හා පිළිවෙළට තබා ගැනීමට දායකත්වය නො දක්වයි. |
| 8.2 අවට පරිසරය අලංකාර ව පිළිවෙළකට තබා ගැනීමට කටයුතු කරයි. | 8.2.2 | පැළයක් සිටුවීමට ඉදිරිපත් වී නිර්මාණශීලීව සකසයි | පැළයක් සිටුවීමට තව සිසුවෙකු සමඟ කටයුතු කරයි. | පැළයක් සිටුවීමට දායකත්වය ලබා දීමට මැළි වෙයි. | පැළයක් සිටුවීමට දායකත්වය ලබා නො දෙයි. |

# සංකල්පය සංකල්පය ආචාරධර්ම, සාරධර්ම හා සම්මතයන්
## 07 පාඩම - බෙදා ගැනීම

යහපත් ගුණගරුක දරුවකු ලෙස තමා සතු දේ බෙදා ගැනීමේ ගුණාංගය ප්‍රගුණ කිරීමට මග සලසා දීම මෙම පාඩමේ අරමුණ වේ.

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්යසාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 7. යහපත් දරුවෙකු ලෙස පිළිපැදිය යුතු ගුණ ධර්ම/ සිරිත්විරිත් අනුගමනය කරයි. | යහපත් වටිනාකම් | 7.1 යහපත් දරුවෙකු ලෙස පිළිපැදිය යුතු ගුණ ධර්ම හඳුනා ගනියි. | 7.1.1 නිවැරදිව හඳුනා ගැනීම |
| | | 7.2 යහපත් දරුවෙකු ලෙස පිළිපැදිය යුතු සිරිත් විරිත් හඳුනා ගනී. | 7.2.1 නිවැරදිව හඳුනා ගැනීම |
| | | 7.3 යහපත් දරුවෙකු ලෙස කටයුතු කරයි. | 7.3.1 නිවැරදි හැසිරීම |

**ඉගෙනුම් සම්පත් :**
- ශුද්ධ බයිබලය ශු.ජොහාන් 6 : 1 13
- පිදුරු/වියළි හෝ අමු පොල් කොළ
- පින්තූර, පාට පැන්සල්, 4 පාට කොළ, කතුරු, ගම්,
- මැටි/ක්ලේ/ පිටි, වතුර, කුඩා භාජනයක්, කඩදාසි පිඟන් (පේපර් පේලේට්), කුඩා කවර (බෑග්), බ්‍රිස්ටල් බෝඩ්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**
**ක්‍රියාකාරකම 1**
**පියවර 1**
- බෙදා ගැනීමට අදාල වන සුදුසු කෙටි කතන්දරයක් හෝ ක්‍රීඩාවක් සිසුන්ට කියා දෙමින් පාඩමට පිවිසෙන්න.

**පියවර 2**
- සිසු ප්‍රතිචාර තුළින් ශු. බයිබල් ශු.ජොහාන් 6 : 1-13 පාඨය ඇසුරෙන් සකසන ලද කෙටි නාට්‍යය රඟ දක්වන්න.

ජේසුතුමා : මේ සෙනඟට කෑමට දෙන්න. රොටි මිලයට ගන්නේ කොතැනින් ද?
පිලිප් : එකිනෙකාට ටිකක්වත් දීමට රිදී කාසි 200ක වත් රොටි මදි වේවී.
ඇන්ඩෘ : යවරොටි පහයි මසුන් දෙදෙනෙකු ද ඇති ළමයෙක් මෙහි ඉන්නවා. ඒත් ! (පුදුමයෙන්) මේච්චර සෙනඟකට ඒක ඇති වෙයි ද?
ජේසුතුමා : මිනිසුන්ව හිඳවන්න.
ඇන්ඩෘ : (ජේසුස්වහන්සේ වෙතට ළමයාව ගෙන එන ලදි) ස්වාමිනි මෙන්න ඒ ළමයා) ජේසුස්වහන්සේ රොටිවලට ආශිර්වාද කරමින් බෙදා දුන් සේක.
ජේසුතුමා : කිසිවක් නාස්ති නොවන පිණිස කැබලි එකතු කරන්න.

**පියවර 3**
- නාට්‍ය රඟ දක්වමින් පසු සිසුන්ගෙන් කෙටි සාකච්ඡාවක් කරන්න.
- එහි චරිත ගැන සිසුන්ගෙන් විමසන්න.

- සිදු වූ සිදුවීම ගැන සිසුන් සමග සාකච්ඡා කරන්න.
- ඔවුන් එවැනි බෙදාගැනීමක් කළ අවස්ථාවක් පිළිබඳ අදහස් අසා දැනගන්න.
- ඔවුන් ළඟ ඒ අවස්ථාවේ ඇති දෙයක් බෙදා ගැනීමට අවස්ථාව දෙන්න.
- පන්දහසකට කෑම දීමේ කතාවට අදාළ පින්තූර සිසුන්ට පෙන්වන්න.




- එය මනා ලෙස නිරීක්ෂණය කරන්න අවස්ථාව දෙන්න.
- එම පින්තූර හා තමන් දුටු කෙටි නාට්‍යයෙන් තමන් කැමති අවස්ථාවක් චිත්‍රයට නැගීමට මග පෙන්වන්න.

පියවර 4


**කූඩයක් හා රොටි 5ක් හා මසුන් 2ක් සෑදීම.**

- පිදුරු/වියළි හෝ අමු පොල් කොළ, පාට පැන්සල්, A4 පාට කොළ, කඩදාසි පිඟන්, කුඩා කවර (බෑග්), බ්‍රිස්ටල් බෝඩ් භාවිතා කර කුඩා කූඩයක් නිර්මාණය කරන්න උපදෙස් දෙන්න.
- මැටි/ ක්ලේ/ පිටි/ ඇසුරෙන් රොටි හා මසුන් සදාගන්නට මගපෙන්වන්න.
- සිසුන්ට තමන් සාදන දේවල් පිළිබඳ ව අද්දැකීම් විඳින්නට අවස්ථාව දෙන්න.
- එසේ නොමැති නම් පාට පැන්සල්, පාට කොළ, බ්‍රිස්ටල් බෝඩ්වලින් කූඩය, රොටි හා මසුන් නිර්මාණය කිරීමට උපදෙස් දෙන්න.







පියවර 5

- පහත දැක්වෙන කෙටි ගීතය රඟ දක්වමින් ගායනා කරන්න.

    රොටි පහයි මාළු දෙකයි - පොඩි ළමයෙක් අතේ
    තිබී එදා දුන්නා - ජේසු අතට සන්තොසේ
    ආශිර්වාද කළාට පසු කෑලි කඩාලා
    පන්දහසක් දෙනාගේ කුසගින්න නිවාලා

- මෙම සියලු ක්‍රියාකාරකම් පන්තියට ඉදිරිපත් කළ පසු අගය කරන්න.

**සිසු ක්‍රියාකාරකම් පොත සඳහා උපදෙස් :**

- රැගෙනවිත් ඇති ද්‍රව්‍යය අනුව සිසු සමග ක්‍රියාකාරකම්වල නිරතවන්න.
- යම් සිසුවකු යමක් ගෙනත් නොමැති නම් බෙදාගෙන සමගියෙන් ක්‍රියාකාරකම්වල නිරතවීමට සිසුන්ව යොමු කරන්න. බෙදා ගන්නා දේවල් ඇඳිමට අවස්ථාව දෙන්න.
- බෙදාගැනීම හුරු කරවන්න මෙය ද අවස්ථාවක් කර ගන්න.

**තක්සේරු කිරීම**

| කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක අංකය. | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | මට්ටම 4 | මට්ටම 3 | මට්ටම 2 | මට්ටම 1 |
| 7.1 යහපත් දරුවෙකු ලෙස පිළිපැදිය ගුණ ධර්ම හඳුනා ගනියි. | 7.1.1 | කිතුනු දරුවෙක් ලෙස බෙදා ගැනීම කළ යුතු බව පවසයි. | කිතුනු දරුවෙක් ලෙස බෙදා ගැනීම කළ යුතු බව තරමක් දුරට පවසයි. | කිතුනු දරුවෙක් ලෙස බෙදා ගැනීම කිතුනු ගුණාංගයක් ලෙස පවසයි. | කිතුනු දරුවෙක් ලෙස බෙදා ගැනීම කිතුනු ගුණාංගයක් ලෙස නො පවසයි. |
| 7.2 යහපත් දරුවෙකු ලෙස පිළිපැදිය යුතු සිරිත් විරිත් හඳුනා ගනී. | 7.2.1 | යහපත් කිතුන දරුවෙකු ලෙස තමාට බෙදා ගතහැකි දේ විස්තර කරයි | යහපත් කිතුන දරුවෙකු ලෙස තමාට බෙදා හදා ගතහැකි දේ උදව් ඇතිව විස්තර කරයි | යහපත් කිතුන දරුවෙකු ලෙස තමාට බෙදා හදා ගැනීමට හැකි දේ විස්තර කිරීමට පසු බට වෙයි | යහපත් කිතුන දරුවෙකු ලෙස තමාට බෙදා හදා ගැනීමට හැකි දේ විස්තර කිරීමට අපෙහෙසත් වෙයි. |

# සංකල්පය මානසික, සෞඛ්‍ය සහ යහපැවැත්ම
## 08 පාඩම - ජේසුස්වහන්සේට බැති සිතින් ළං වෙමු

කිතුනු දරුවෙක් ලෙස දෛනික ක්‍රියාකාරකම්වල යෙදීමේදී මනා සිහියෙන් යුතු ව, හිතකර චර්යා රටා සඳහා යහපත් සෞඛ්‍ය පුරුදු අනුගමනය කිරීමට යොමු කිරීම මෙම පාඩමේ අරමුණ වේ.

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්යසාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 11. දෛනික ක්‍රියාකාරකම්වලදී මනා සිහියෙන් යුතු ව කටයුතු කරයි. | ඇවිදීමේදී මනා සිහියෙන් යුතු ව ඇවිදියි. | 11.2 ඇවිදීමේදී යටි පතුලට දැනෙන රලු - සිනිඳු, නෙත - වියළි, උණුසුම - සිසිල් බව හඳුනා ගනිමින් ඇවිදියි. | 11.2.1 රලු - සිනිඳු, නෙත - වියළි, උණුසුම - සිසිල්බව හඳුනා ගැනීම |
| | | 11.3 සරල භාවනාවක (Meditation) යෙදෙයි. | 11.3.1 නිවැරදි ඉරියව් |

**ඉගෙනුම් සම්පත් :**

- "මිහිරි සුවඳක් ලෙසින් ...." ගීතිකාවේ හඬ පටයක් හෝ මිහිරි හඬින් ගායනය
- අභ්‍යාස පොතක්/සුදු ඒ 4 කොළයක්, පාට කූරු හෝ පාට පැන්සල්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**ක්‍රියාකාරකම 1**

**පියවර 1**

- සිසුන්ව ඉඩ සහිත ව වාඩිවිය හැකි එළිමහන් ස්ථානයකට ගෙනයන්න.
- සිසුන් නිශ්චල පරිසරයක ගීතයට සවන් දීමට සලස්වන්න.
  උදා: මිහිරි සුවඳක් ලෙසින් ගීතිකාව.......

**පියවර 2**

- සිසුන්ට ඇවිදීමට සුදුසු ස්ථානයකට ගෙනයන්න.
- සිසුන්ට පාදයේ කොටස් වන විළුඹ, යටි පතුල, කකුලේ ඇඟිලි යන කොටස් නම් කර පෙන්වීම හා සිසුන්ටත් නම් කරමින් පෙන්වීමට කියන්න.
- දෑත් ඉදිරියට හෝ පසුපසට කර බැඳ පහසු සේ සිට ගැනීමට පවසන්න.
  - තමා ඉඳ ගන හෝ නිදා ගෙන නැති බවත් සිට ගෙන සිටින බවත් සිතීමට කියන්න.
- සාමාන්‍ය වේගයෙන් ඇවිදීමට උපදෙස් දෙන්න.
- වටපිට ශබ්දවලට ඇහුම්කන් නොදී බෙල්ල මදක් නමා, තමා ඇවිදින බව පමණක් සිතමින් ඉදිරියට පියවර 10 ක් ඇවිදීමට පවසන්න.
- ඇවිදින විට තමා ගේ පාද පොළොවේ වැදෙන බවත්, එවිට ගෝරෝසු බවක්, සිනිඳු බවක්, උණුසුමක්, සීතලක් දැනේ ද යන්න ගැන පමණක් සිතීමට කියන්න.
- පාද තබන විට මේ ආකාරයෙන් සිතීමට යොමු කරන්න.
  විළුඹට, යටි පතුලේ මැද, යටි පතුලේ ඇඟිලිවලට දැනෙන්නේ මොනවා ද?
  ඇගේ බර පාදයෙන් පාදයට වම හා දකුණ ලෙස මාරුවෙන ආකාරය
- පොළොවේ පැගෙන වෙන කිසිම දෙයක් ගැන නොසිතීමට පවසන්න.
- පියවර 10ක් ගොස් හැරෙන විට දෙපා එක ළඟට ගෙන මොහොතක් සිට ආපසු හැරෙන්න.
- මෙලෙස 3, 4 වතාවක් ගමන් කරන්න.

පියවර 3

- සිසුන්ව පහසුවෙන් වාඩිවිය හැකි තැනට ගෙන ගොස් පහසු ලෙසකට වාඩිවෙන්න කියන්න.
- ගීතිකාව ගයන විට එහි වචනවලට හොඳින් ඇහුම්කන් දීමටත් එම වචන පිළිබඳවම සිතන ලෙසටත් නිතර උපදෙස් දෙන්න.
- දෙවි පියා අපට දී තිබෙන වටිනා ම දෙයක් ලෙසට දෙමාපියන්ව සිහි කිරීමට පවසන්න.
- දෙමාපියන් සිහි කර ගයන ගීතිකාවට දෑස් පියා ගෙන සවන් දීමට පවසන්න.

1) මගෙ අම්මා හරි ම හොඳයි
කිරි දීලා මා හැදුවා
මූණ මගේ සෝදාලා
මේ (කමිසේ/ගවුමත්) ඇන්දෙව්වා

2) තාත්තා මගේ හරි ම හොඳයි
මා සනසා මා හැදුවා
කඳුළු මගේ පිස දමලා
උකුලෙ හොවා නිදි කෙරුවා

3) දේව පියා හරි ම හොඳයි
අපහට ආදරය නිසා
පෙම් ඇති මව්පියන් ලවා
අප රැකුමට සැලසූවා.

- ශුද්ධ වූ බයිබලයේ "1 කොරින්ති" පොතේ 2 : 16 වන පදය සිසුන්ට ඇසෙන සේ කියවන්න.

**"මක්නිසාද ස්වාමීන්වහන්සේට උගන්වන පිණිස උන්වහන්සේගේ සිත දැනගත්තේ කවුද? නමුත් අපට ක්‍රිස්තුස්වහන්සේගේ සිත ඇත්තේය."**

- ජේසුස් වහන්සේ අපට සෑම දෙයට ම මග පෙන්වන බවත් එතුමන්ට සැමදා ම කතා කිරීමට හා ගෞරව කිරීමට, ස්තුති කිරීමට පුරුදු විය යුතු බවත් නිතර මතක් කරන්න.

**සිසු ක්‍රියාකාරකම් පොත සඳහා උපදෙස් :**

- සිසු ක්‍රියාකාරකම් පොතෙහි අදාල ක්‍රියාකරකම් දෙක කිරීමට උපදෙස් ලබා දෙන්න.
- සිසුන් අභ්‍යාස පොත ගෙන එහි එක මුල්ලක සිට අනෙක් මුල්ලට ඇඟිල්ල ගෙන යන අතර, හුස්ම ඉහළට ගෙන පහළට දමන අතර

**"මම ජේසුස්වහන්සේට ආදරෙයි" කියා පමණක් සිතීම.**

- මෙලෙස ඊළඟ මුල්ලේ සිට අනෙක් මුල්ලටත්, එතන සිට ඊළඟ මුල්ලටත් ඒ ගැන පමණක් සිතමින් ඇඟිල්ල පොත වටේට ගෙන යාමට කියන්න.
- මෙලෙස 5 වතාවක් කිරීමට ඉඩ දෙන්න.

පහත දී ඇති ආකාරයට සුළං බඹරයක් සාදා ගැනීමට මග පෙන්වන්න.

- හරි හතරැස් සුදු කොළයක් (16 සෙ.මී.X 16 සෙ.මී.)
- එක පැත්තක කොන් යා කර කතිරයක් අඳින්න.
- සිසුන් කැමති පාට හතරකින් කොටස් හතර පාට කිරීමට පවසන්න.
- කතිරයේ මැදට අඟලක් තබා ඉරි දිගේ කතුරෙන් කැපීමට යොමු කරන්න.
- එක මුල්ලක් හැර එකක් කතිරයේ මැදට ළං කිරීමට පවසන්න.
- මුලු හතර එක් කර ඇමුණුම් කටුවක්, බොත්තමක් තබා අමුණා පැන්සලේ හෝ බීම බටයකට සවි කිරීමට පවසන්න.
- බඹරයට පිඹින අතර "ජේසුස්වහන්සේ පුංචි මම කළ වැරදිවලට සමාවෙන්න" යනුවෙන් සිතීමට කියන්න.
- මෙලෙස පස් වතාවක් කරන්න.

**තක්සේරු කිරීම**

| කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක අංකය. | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | මට්ටම 4 | මට්ටම 3 | මට්ටම 2 | මට්ටම 1 |
| 11.1 ඇවිදීමේදී මනා සිහියෙන් යුතුව ඇවිදියි. | 11.1.1 | දෙන ලද උපදෙස් සියල්ලම පිළිපදිමින් සතිමත් ව ඇවිදියි. | දෙන ලද උපදෙස් කීපයක් පිළිපදිමින් සතිමත් ව ඇවිදියි. | දෙන ලද උපදෙස් කීපයක් පිළිපදිමින් සතිමත් ව ඇවිදීමේ දුෂ්කරතා පෙන්වයි. | දෙන ලද උපදෙස් කීපයක් පිළිපදිමින් සතිමත් ව ඇවිදීම ප්‍රතික්ෂේප කරයි. |
| 11.2 ඇවිදීමේදී යටි පතුලට දැනෙන රලු - සිනිඳු, නෙත - වියළි, උණුසුම - සිසිල්බව හඳුනා ගනිමින් ඇවිදියි. | 11.2.1 | සතිමත් ව ඇවිදීමෙන් ලත් අද්දැකීම් දෙකක් ප්‍රකාශ කරයි. | සතිමත් ව ඇවිදීමෙන් ලත් අද්දැකීමක් ප්‍රකාශ කරයි. | සතිමත් ව ඇවිදීමෙන් ලත් අද්දැකීමක් ප්‍රකාශ කිරීමට අපහසුතා දක්වයි. | සතිමත් ව ඇවිදීමෙන් ලත් අද්දැකීමක් ප්‍රකාශ නො කරයි. |

# අන්තර්ගතය

## තුන්වන වාරය

**සංකල්පය  චරිත සංවර්ධනය**

1 පාඩම - සත්ගුණවත් මිනිසෙකු වූ නෝවා 43

2 පාඩම - නැති වූ පුත්‍රයාගේ උපමාව 45

**සංස්කෘතිය, ශිෂ්ටාචාරය සහ සමාජසංස්කෘතික සංවේදීතාව**

3 පාඩම - නත්තල සමරමු 48

**සංකල්පය  පරිසර සංවේදිතාව**

4 වන පාඩම - කුරුල්ලන් හා ජලයේ සිටින සතුන් සුරකිමු 51

**සංකල්පය  ආචාර ධර්ම, සාරධර්මයන් හා සම්මතයන්**

5 වන පාඩම - කමාව දුන් ස්තේපන්තුමා 53

**සංකල්පය  මානසික සෞඛ්‍ය හා යහපැවැත්ම**

6 වන පාඩම - දෙවිඳුන් අද්දකිමින් ක්‍රියාශීලි වෙමු 55

# සංකල්පය චරිත සංවර්ධනය

## 01 පාඩම - සත්ගුණවත් මිනිසෙකු වූ නෝවා

නෝවාගේ කතාවට සවන්දී ඒ ගැන අවබෝධයක් ලබාගෙන නෝවාගේ සත්ගුණවත් චරිත ලක්ෂණ තම ජීවිතයට අදාල කරගැනීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්යසාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 2. ආගමික ශාස්තෘවරයා/ නිර්මාතෘවරයා පිළිබඳ කතන්දර හා උපදේශ කාව්‍ය ඇසුරෙන් චරිත සංවර්ධනයට අදාළ සුවිශේෂ ගුණාංග හඳුනා ගනියි. | පැරණි ගිවිසුමේ චරිත | 2.1 ආගමික කතාන්දර වලට කැමැත්තෙන් සවන්දෙයි. | 2.1.1 ආගමික කතාන්දර වලට සවන් දීම. |
| | | 2.3 ආගමික කතාන්දර ඇසුරෙන් ලබා ගත හැකි ආදර්ශ ප්‍රකාශ කරයි. | 2.3.1 ආදර්ශ ප්‍රකාශ කිරීම. |

**ඉගෙනුම් සම්පත් :**

- ශුද්ධ බයිබලය උත්පත්ති 6: 8-10 සිට 7: 6 දක්වා
- පාඩමට අදාළ පින්තූර අවශ්‍ය පරිදි සූදානම් කරගන්න.
- වර්ණ ගැන්වීමට අවශ්‍ය ද්‍රව්‍ය
- කහ සහ දුඹුරු වර්ණ කඩදාසි, යෝගට් හැඳි, ගම්, කතුරු, පාට

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**ක්‍රියාකාරකම 1**

**පියවර 1**

නෝවාගේ කතාවට පසුබිම සකස් කරනුවස්, බයිබලයේ උත්පත්ති 6: 8-10 දක්වා කියවා පහත කරුණු ඉස්මතු කරන්න.

- නෝවා ජීවත් වූ රටෙහි මිනිසුන් වැරදි ක්‍රියාවල යෙදුන ද නෝවා සත් ගුණවත් මිනිසෙකි.
- කිසිම වරදක් නොකළ නිදොස් මිනිසා ද නෝවාය.
- ඔහු දෙවියන්වහන්සේ සමඟ සුහදතාවයෙන් හැසුරුණේය.
- නෝවාගේ දැහැමිකම නිසා ඔහුට දෙවියන්වහන්සේ ඉදිරියේ කරුණාව හිමිවිය.

**පියවර 2**

නෝවාගේ කථාව පින්තූර භාවිතා කරමින් සරලව ඉදිරිපත් කරන්න. පහත කරුණු අවධාරණය කරන්න.

- නෝවා යහපත් (දැහැමි) මිනිසෙකි.
- ඔහුට භාර්යාව සහ ෂෙම්, හාම්, ජපෙත් යනුවෙන් පුතුන් තිදෙනෙක් සිටියේ ය.
- දෙවියන් වහන්සේ නෝවාට නැවක් සාදන ලෙස අණ කළ සේක.
- ඔහු එම අණට කීකරුව දෙවියන්වහන්සේ කී පරිදි විශාල නැවක් සාදා සෑම සතුන්ගෙන් දෙදෙනා බැගින් නැවට එකතු කර ගත්තේය.
- ඔහුගේ කීකරුකම නිසා ඔහුගේ පවුලේ සියළු දෙනාවම ද බේරා ගැනීමට දෙවියන්වහන්සේ කැමති වූ සේක.
- ඉන් පසු මහා වැස්සක් ද වැස්ස නිසා, මහා ජල ගැල්මක් ද ඇති විය.
- ජල ගැල්ම පැතිරෙන විට නෝවාගේ වයස අවුරුදු 600 ක් වූ බව බයිබලයේ සඳහන් ව ඇත. (කියවන්න උත්පත්ති 7: 6 පදය)

පියවර 3

- නෝවා තුළ තිබූ සත්ගුණවත්කම හා කීකරුකම දුටු දෙවියන්වහන්සේ, ඔහු සමඟ සිටි සෙනඟ සහ සතුන් මෙම විනාශයෙන් බේරා ගත් බව පැහැදිලි කර දෙන්න.
- නැවත මෙවැනි ජලගැල්මක් එවන්නේ නැති බවට සළකුණක් ලෙස දෙවියන්වහන්සේ අහසේ දේදුන්නක් තැබූ බව කියන්න.

පියවර 4

නෝවාගේ කතාවෙන් අපට ගත හැකි ආදර්ශ ලෙස පහත කරුණු අවධාරණය කරන්න.

- ඔබත් දෙවියන් වහන්සේ සමඟ විශ්වාසවන්තව යහපත් සබඳතාවයක් ගොඩනගා ගනිමින්, නිහතමානී සත්ගුණවත් දරුවෙකු වන්න.
- නෝවා මෙන් දේව වචනයට කීකරුවන්න.
- කිතුනු දරුවෙකු ලෙස තම නිවසේදී, පාසලේදී, අසල්වැසියන් සමඟ ආදරයෙන් කටයුතු කරන්න. තම මිතුරන් අගය කරන්න.
- බයිබලයේ සඳහන් පරිදි කිසි වරදක් නොකරන යහපත් කෙනෙකු වන්න උත්සාහ කරන්න.
- එසේ නම් ඔබටද දේව කරුණාව හිමි වනු ඇත.
- ඔබගේ දැහැමිකම දෙවියන්වහන්සේ ඉදිරියේ කරුණාව ලබන සේක.

පියවර 5

- නෝවාගේ සුවිශේෂී ලක්ෂණ කිහිපයක් සිසුන්ට ප්‍රකාශ කිරීමට අවස්ථාව දෙන්න.
- නෝවාගේ කතාව ඇසුරෙන් වාචික ප්‍රශ්න 5ක් අසන්න.

**සිසු ක්‍රියාකාරකම් පොත සඳහා උපදෙස් :**

- නෝවාමෙන් මමත් ක්‍රියාකාරකම ආදලව තමාගේ පින්තූර ඇඳිමට හෝ ඇලවිමට උපදෙස් දෙන්න.
- නෝවාගේ කථාව සම්බන්ධ පින්තූර පෙන්වමින් සිසුන්ටද කතාව ගොඩනගන්න උදව් කරන්න.
- එම කථාවෙහි පින්තූර පාවිච්චි කරමින් ඔබ නිවසේ කෙනෙකුට හෝ යහළුවෙකුට නෝවාගේ කීකරුකම ගැන කථාව කියන්න මග පෙන්වන්න.
- නෝවාගේ නැව සෑදීමට ඇති උපදෙස් පිළිපදිමින් සිසුන්ට නැව සෑදීමට උදව් කරන්න, මඟපෙන්වන්න

**තක්සේරු කිරීම**

| කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක අංකය | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | මට්ටම 4 | මට්ටම 3 | මට්ටම 2 | මට්ටම 1 |
| 2.3 ආගමික කතාන්දර ඇසුරෙන් ලබා ගත හැකි ආදර්ශ ප්‍රකාශ කරයි. | 2.1.1 ආගමික කතන්දරවලට සවන් දීම | වාචික ප්‍රශ්න 4කට හෝ 5කට නිවැරදි පිළිතුරු ලබා දේ. | වාචික ප්‍රශ්න 2ක හෝ 3 නිවැරදි පිළිතුර ලබා දේ. | වාචික ප්‍රශ්න දෙකකට හෝ තුනකට තවත් සිසුවෙක්ගේ සහය ඇතුව පිළිතුරු දේ. | කිසිවෙකට පිළිතුරු දීමට අපහසු වේ. |
| 2.1 ආගමික කතාන්දර වලට කැමැත්තෙන් සවන්දෙයි. | 2.3.1 ආදර්ශ ප්‍රකාශ කිරීම | නෝවාගේ සුවිශේෂී ගුණාංග 03ක් ප්‍රකාශ කරයි. | නෝවාගේ සුවිශේෂී ගුණාංග 02ක් ප්‍රකාශ කරයි. | නෝවාගේ සුවිශේෂී ගුණාංග 01ක් ප්‍රකාශ කරයි. | නෝවාගේ සුවිශේෂී ගුණාංග ප්‍රකාශ නොකරයි. |

# සංකල්පය චරිත සංවර්ධනය

# 02 පාඩම - නැති වූ පුත්‍රයාගේ උපමාව

ජේසුස්වහන්සේ පැවසූ නැති වූ පුත්‍රයාගේ උපමා කතන්දරයට සවන් දී එහි අර්ථය හා ආදර්ශ අවබෝධ කර ගනිමින් ඒවා තම ජීවිත ආදර්ශයට ගැනීම මෙම පාඩමේ අරමුණ වේ.

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්යසාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 2. ආගමික ශාස්තෘවරයා/ නිර්මාතෘවරයා පිළිබඳ කතාන්දර හා උපදේශ කාව්‍ය ඇසුරෙන් චරිත සංවර්ධනයට අදාළ සුවිශේෂ ගුණාංග හඳුනා ගනියි. | උපමා හා ආදර්ශ කතා | 2.1 ආගමික කතාන්දර වලට කැමැත්තෙන් සවන්දෙයි | 2.1.1 ආගමික කතාන්දර වලට සවන් දීම |
| | | 2.3 ආගමික කතාන්දර ඇසුරෙන් ලබා ගත හැකි ආදර්ශ ප්‍රකාශ කරයි | 2.3.1 ආදර්ශයක් ප්‍රකාශ කරයි |

**ඉගෙනුම් සම්පත් :**
- ශු: බයිබලයේ ලූක් 15 :11 - 32
- ප්ලැනල් පුවරුව
- නැති වූ පුත්‍රයාගේ උපමාවට අදාල රූප.
- පාට පැන්සල්
- කතුරු
- ගම්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**
**ක්‍රියාකාරකම 1**
**පියවර 1**

- නැති වූ පුත්‍රයාගේ උපමා කතාව ප්ලැනල් පුවරුව ආධාරයෙන් රූප අලවමින් කියා දෙන්න.
- මෙම කතාව දීර්ඝ කතාවක් හෙයින් ගුරුවරයා ආකර්ෂණීයව සිසු සිත් දිනා ගනිමින් ඉදිරිපත් කරන්න.

එක තාත්තෙකුට පුතාලා දෙන්නෙක් සිටියා.
ඔවුන් දෙදෙනා අතරින් බාල පුතා පියාගේ දේපළ වලින් තම කොටස ඉල්ලා ගත්තා.
ටික දවසකින් බාල පුතා ඒ සියල්ල රැගෙන දුර රටකට ගියා.
එම රටේ විවිධ ක්‍රියාවල යෙදෙමින් තමාගේ සම්පත නාස්ති කර දැම්මා.
සියල්ල වියදම් කළ පසු එම රටේ සාගතයක් ඇති වුණා.
එවිට මේ බාල පුත්‍රයාට අගහිඟකම් දැනෙන්නට වුණා.
එවිට ඔහු ගොස් ඒ රටේ පුරවැසියෙකුට මෙහෙවර කරන දාසයෙක් බවට පත්වුණා.
ඔහුට ගොවිපලක ඌරන් බලන්නට සිදුවුණා.
මේ බාල පුතාට එහිදී ඌරන්ට කන්නට දෙන කෑම කන්න සිදුවුණේ
කිසිවෙක් ඔහුට කිසිවක් නොදුන්න නිසයි .
එවිට මේ බාල පුතා හරි සිහිකල්පනාවට පැමිණුනා.
ඔහුට ඔහුගේ පියා ව සිහි වුණා.
ඔහුගේ පියාගේ කුලීකාරයන්ට ඕනෑවටත් වැඩිය කෑම තිබෙන බව සිහියට ආවා.
ඒත් තමාට සාගින්නේ ආහාර නැතිව මැරෙන්නට සිදු වන බව කල්පනාවට ආවා.

ඔහු නැගිට පියා වෙත ගොස් මේ ලෙස කීමට සිතා ගත්තා.
**"පියාණෙනි, දෙවියන්වහන්සේට විරුද්ධ ද ඔබට විරුද්ධව ද පව් කෙළෙමි.**
**මින් මතු ඔබගේ පුත්‍රයා යයි කියනු ලබන නොවටිමි.**
**ඔබගේ කුලීකාරයන්ගෙන් එකෙකු මෙන් මා තබා ගත මැනව."**
යැයි කියන්නෙමි සිතා ,තම පියාව සොයාගෙන ගියා.
ඔහුගේ පියා දුර තියාම තම පුතාව හඳුනාගෙන ,
අනුකම්පාවෙන් දුවගෙන ගොස් ,
දැතින් ඔහුගේ ගෙල වැළඳ ගෙන සිප ගත්තා,
පුතා තමා සිතා සිටි ආකාරයට පියාට වදන් පැවසුවා.
**"පියාණනි ඔබේ පුත්‍රයා යයි කියනු ලබන්නට නොවටිමි."**
**එහෙත් පියා තම මෙහෙකරුවන් කැඳවා**
**වහාම හොඳම සළුව ගෙන ඇවිත් අන්දවන්න"** කිව්වා.
ඔහුගේ ඇඟිල්ලේ මුදුවක් පළඳවන්න කිව්වා
පාදවල වහන් ද දමන්න කිව්වා
තර කළ වස්සා මරා, උත්සවයක් සංවිධානයය කරන්න කිව්වා.
"මේ මාගේ පුත්‍රයා නැතිවී සිට සම්බ විය. අපි කා බී ප්‍රීති ප්‍රමෝද වෙමු" පියා කිව්වා.

පියවර 2
- මෙම කතාව බයිබලයේ සඳහන්ව ඇති බවත්, මෙය ජේසුස්වහන්සේ ජීවත්ව සිටි කාලයේ උන්වහන්සේ විසින් කියා දුන් කතාවක් බවත්, සිසුන්ට කියා දෙන්න.
- මෙම කතාවේ පියා - දේව පියාට සමාන කරමින් අප වැරදි මාර්ගවල යාමේදී අපේ වරද අපට වැටහුන විට නැවත හරි සිහියට පැමිණ දෙවිපියාණන්වහන්සේ වෙතට ගොස් අපේ වරදට කමාව ඉල්ලා සිටිය යුතු බව පවසන්න.
- දෙවියන්වහන්සේ අප නැවත හැරී ඒම තුළ ඉතාම සතුටු වන බවත්, අප ව ඉතාම ආදරයෙන් පිළිග න්නා බවත්, එවිට අපේ වරදට සමාව ලැබෙන බවත්, සිසුන්ට අවබෝධ වන ආකාරයෙන් සරල බසින් කියා දෙන්න.

පියවර 3
මෙම කතාවෙන් අපේ ජීවිතයට ලබා ගත හැකි ආදර්ශ සිසුන් සමග සාකච්ඡා කරන්න.
- දෙමව්පියන්ට කීකරු වීම.
- ඔවුන්ගේ සිත් නොරිදවන ලෙස හැසිරීම, ජීවත් වීම.
- අප අතින් සිදුවන වැරදි තේරුම් ගත් කළ නැවත නොකිරීම සහ වැරදිවලට කමාව ඉල්ලා නිවැරදි මගට පැමිණීම.
- දෙමව්පියන්ට ආදරය දක්වමු, කීකරු වෙමු
- දේවපියාට ආදරය දක්වමු කීකරු වෙමු

පියවර 4
සිසු ක්‍රියාකාරකම් පොතේ රූපවල අංක අනුව රූපය බලමින් කතාව කීමට එක් එක් සිසුවාට අවස්ථාව සපයා දෙන්න.

පියවර 5
වාචික ප්‍රශ්න කිහිපයක් අසමින් සිසුන්ගේ දැනුම විමසන්න.
- කතාවේ සඳහන් පියාට දරුවන් කීදෙනෙක් සිටියේ ද?
- පියාගෙන් තමාට අයිති කොටස ඉල්ලා සිටියේ වැඩිමල් පුතා ද? බාල පුතා ද?
- පුතා තමාගේ කොටස රැගෙන කුමක් කළේ ද?
- තමා සිටි රටේ සාගතය ඇති වූ විට පුතාට කරන්න සිදු වූ රැකියාව කුමක් ද?
- පුතාට තම වරද අවබෝධ වූයේ කොතැනක සිටිද්දී ද?
- ඔහු කුමක් කළේ ද?
- පියා පුතාව කෙලෙස පිළිගත්තේ ද ?
- මේ කතාවෙන් ඉගෙන ගත හැකි පාඩම කුමක් ද ?

**තක්සේරු කිරීම**

| කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක අංකය | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | මට්ටම 4 | මට්ටම 3 | මට්ටම 2 | මට්ටම 1 |
| 2.1 ආගමික කතාන්දර වලට කැමැත්තෙන් සවන්දෙයි. | 2.1.1 ආගමික කතන්දරවලට සවන් දීම. | ප්‍රශ්න සියල්ලටම නිවැරදිව පිළිතුරු දෙයි. | ප්‍රශ්න පහකට නිවැරදිව පිළිතුරු දෙයි. | ප්‍රශ්න තුනකට නිවැරදිව පිළිතුරු දෙයි. | ප්‍රශ්න කිසිවකට නිවැරදිව පිළිතුරු දීමට නොහැකි වෙයි. |
| 2.3 ආගමික කතාන්දර ඇසුරෙන් ලබා ගත හැකි ආදර්ශ ප්‍රකාශ කරයි. | 2.3.1 ආදර්ශ ප්‍රකාශ කිරීම. | උපමා කතාවෙන් තමාට ගත හැකි ආදර්ශ ප්‍රකාශ කරයි. | උපමා කතාවෙන් තමාට ගත හැකි ආදර්ශ තරමක් දුරට ප්‍රකාශ කරයි. | උපමා කතාවෙන් තමාට ගත හැකි ආදර්ශ තවත් සිසුවෙකුගේ සහය ඇතිව ප්‍රකාශ කරයි. | උපමා කතාවෙන් තමාට ගත හැකි ආදර්ශ ප්‍රකාශ කිරීමට අපොහොසත් වෙයි. |

## සංකල්පය සංස්කෘතිය, ශිෂ්ටාචාරය සහ සමාජ සංස්කෘතික සංවේදීතාවය

# 03 පාඩම - නත්තල සමරමු

කිතුනුවන් සමරන නත්තල් උත්සවය ජේසුස්වහන්සේ මෙලොවට ජනිත වීම සිහි කරන බව අවබෝධ කරගෙන එය අර්ථාන්විතව සැමරීමට යොමු කරවීම මෙම පාඩමේ අරමුණ වේ.

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්යසාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 4. ආගමික හා සංස්කෘතික උත්සව වලට සහභාගි වී අත්දැකීම් ලබයි. | අපේ ආගමික උත්සවය | 4.1 සුවිශේෂ ආගමික උත්සවයකට ක්‍රියාකාරීව සහභාගිවෙයි. | 4.1.1 ක්‍රියාකාරීව සහභාගී වීම |
| | | 4.3 සුවිශේෂි ආගමික උත්සව හෝ සංස්කෘතික උත්සවයක් ආදර්ශනය කරයි. | 4.3.1 ක්‍රියාකාරකමවල නිරත වීම |

**ඉගෙනුම් සම්පත් :**
- ගවලෙනක්
- අත් රූකඩ දෙකක්. (ගුරුතුමිය සහ ළමයෙකුගේ)
- පාට කඩදාසි, ලියුම් කවර, රතුපාට කඩදාසි, බිත්තර කටු, පුළුං, කතුර,

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**
**ක්‍රියාකාරකම 1**
**පියවර 1**
ගවලෙන ගුරු මේසය මත තබා අදාල සිද්ධිය හා චරිත ඉතා සංක්ෂිප්තව ඉදිරිපත් කරන්න.
නත්තල යනු කිතුනුවන්ගේ ආගමික උත්සවයක් බව කියා දෙන්න.

- නත්තල ලෙස සමරන්නේ ජේසුස්වහන්සේ මෙලොව පහල වූ දිනය බව කියා දෙමින් පහත කරුණු මතක් කර දෙන්න.
  - ජේසුස්වහන්සේ මව හා පියා - මරියා හා ජෝසෙප් බව
  - උන්වහන්සේ ඉපදුනේ - ගවලෙනක බව උන්වහන්සේගේ යහන වූයේ ගවඔරුවක් බව, උපන් ස්ථානයට ඉහළින් අහසේ වලිග තාරකාවක් පැයූ බව, එදින දේව දූතයන් පැමිණ ගීතිකා ගයමින් ප්‍රශංසා කළ බව
  - උන්වහන්සේ නැමදීමට එඬේරුන්ද, පඬිවරුන්ද පැමිණි බව,
  - පඬිවරුන් - තෑගි රැගෙන ආ බව - රත්තරන්, සුවඳලාටු, කට්ට කුමංජල් බවත් මතක් කර දෙන්න.
  - මෙහිදී ගවලෙනේ එක් එක් චරිත හඳුන්වා දීම යෝග්‍ය වේ.

**පියවර 2**
ගුරුතුමිය අත් රූකඩය අතේ දමා ගෙන මෙතැන් සිට දෙබසක් ලෙස පාඩම මෙහෙයවීම යෝග්‍ය වේ. (ගුරුතුමිය විසින් ගුරුතුමියගේ දෙබස් ද ආසිරිගේ චරිතයේ දෙබස් ද කටහඬ වෙනස් කරමින් රූකඩ අතැතිව කියනු ලබයි.)

ආසිරි :- ටීචර් එතකොට අද අපි නත්තල පවත්වනකොට ගොඩක් දේවල් කරනවා නේද?

ගුරුතුමිය :- ඔව්, ආසිරි නත්තල් දින දෙව් මැදුරේ විශේෂ දේව මෙහෙයක් පවත්වනවා. නත්තල් දින දෙව්මැදුරට ගොස් ඒ දේවමෙහෙයට සහභාගීවීම හැම කිතුනුවෙක්ම වගේ කරන දෙයක්.

ආසිරි :- ඒ මෙහෙයෙන් පස්සේ හැමෝම සුභ පතනවා මම දැකලා තියෙනවා. ටීචර්

ගුරුතුමිය :- ඔව් නත්තල කිතුනුවන් සමරන උත්සවයක් ඕනෑම උත්සවයකට සුභ පැතීමේ දී අපි සාමාන්‍යයෙන් සුභ පතන විට ආචාර කරන අන්දමට අතට අතදීම, සිඹ ආචාර කිරීම, දෑත් එකට තබා ආචාර කිරීම වැනි ඕනෑම ක්‍රමයක් භාවිතා කොට නත්තල් උත්සවය සඳහා සුභ පතන්න පුළුවනි. නත්තල් උත්සවයට මුහුණට මුහුණ මුණනොගැහෙන අයට සුභ පැතුම් පත් Christmas card මගින් සුභ පතන්න පුළුවන්.

ආසිරි :- මට මතකයි අම්මා මට අළුත් ඇඳුම් නත්තලට අරන් දුන්නා.

ගුරුතුමිය :- ඔව් ආසිරි නත්තල් දින දේව මෙහෙයට යාමේදී හුඟක් අය අලුත් ඇඳුම් අඳිනවා තමයි. ඒ වුනාට ඒක අවශ්‍යම දෙයක් නොවේ. අලුත් ඇඳුමක් ගන්න බැරි අය ගැනත් අපි හිතන්න ඕනා.

ආසිරි :- නත්තලට අපේ අම්මා කේක් හදනවා. ටීචත් හදනවද?

ගුරුතුමිය :- නත්තල් උත්සවයට නෑදෑයින්, අසල්වාසීන්, යහළුවන් ගෙවල් වලට ඇවිදින්න යන එක සාමාන්‍ය සිරිතක් ලෙස කරනවා. එහෙම එන අයට සංග්‍රහ කරන්න ආහාරපාන රසකැවිලි හදනවා. දුවලා පුතාලා දන්නවද? පළමු නත්තල් දවසේ ජේසු කුමරු ලොව පහළ වීම හේතුවෙන් දේවදූතයන් ගීතිකා කරමින් ප්‍රශංසා කළා. ඒක සිහිගන්වමින් අදටත් දේවස්ථානවල හා පාසල් වල රැකියා ස්ථානවල නත්තල් කැරොල් ගීත සංදර්ශන පවත්වනවා.

ආසිරි :- ටීචර්, අපි නත්තල් ගහ හදන්නත් හරි ආසයි.

ගුරුතුමිය :- ඔව් ඔව් නත්තල් උත්සව සමයේ නිවෙස් වල වගේම විවිධ ස්ථානවලත් නත්තල් ගස් ප්‍රදර්ශනය කරනවා. නත්තල් උත්සවය වෙනුවෙන් සැරසිලි යොදා නිවෙස් අලංකාර කරනවා. හරියට විවාහ මංගල උත්සවයක් උපන් දින සාදයක් සංවිධානය කරන කොට අපි ඒ ස්ථානය සැරසිලි වලින් අලංකාර කරනවා වාගේ.

ආසිරි :- මම නම් වැඩියෙන්ම ආස නත්තල් සීයාට තමයි. මොකද නත්තල් සීයා අපට තෑගි දෙනවානේ.

ගුරුතුමිය :- ඔව් ඔව් ඒ බව මම දන්නවා. පුංචි ළමයි නත්තල් උත්සවයට වැඩියෙන්ම ආසා කරන්නේ නත්තල් සීයාගෙන් තෑගි ගන්න තමයි. හැබැයි, දුවලා පුතාලා ටිකක් හිතලා බලන්න නත්තල කියන්නේ ජේසුස්වහන්සේගේ උපන්දිනයි. එහෙනම් අපි නත්තල සමරන්න ඕනා උපන් දිනය හිමිකාරයාව සතුටු කරවන අන්දමට නේද? ජේසුස්වහන්සේ උන්වහන්සේ මේ ලෝකයට පහළවූ දිනය අපි කුමන ආකාරයෙන් සමරනවාට උන්වහන්සේ සතුටු වෙයි ද? උන්වහන්සේ මේ ලෝකයේ සිටිය දී පැවසූ දේ කුමක් ද?

පියවර 3

- නත්තලේ සැබෑ අර්ථය මතුවන සේ සාකච්ඡාවක් මෙහෙයවන්න.
- නත්තල් ගීතිකාවක හඬ පටියකට සවන් දීමට ඉඩ ලබා දෙන්න.

උදා - මුතු මුතු පිණිකැට පොළොවට වැටෙන වෙලේ
සිතු සිතු විලසට ගහකොළ වැනෙන රඟේ
තරුමල් අහසේ දිලි දිලි නිවෙන පැයේ
දෙව්පුතු ඉපදීලා සුභ මංගල්ලේ

නත්තල් කාලේ ලෝකය බබළවමු
සාමය සමගිය සිත්තුළ පුබුදුවමු
සිතෙහි කැත කුණු අද සෝදා ගනිමු
ජේසු බබා නළවන්නට ගී කියමු

පියවර 4

- නත්තල් සුභ පැතුම් පත නිර්මාණය කිරීමට යොමුකරවන්න.
- කිතුනු දරුවන් ලෙස පන්තියේ අන් ආගමික සිසුන් ද සහභාගී කරගෙන ඔවුන් සතුටු කිරීම පිණිස කුඩා නත්තල් උත්සවයක් සංවිධානය කරන්න. නත්තල් ගීතයක් ගැයීම, තමන් සැදූ නත්තල් සැරසිලිවලින් පන්තිය සරසන්න, හැකිනම් කුඩා සංග්‍රහයක් ද කරන්න.

පියවර 5

- නත්තල් සියාගේ මුහුණ සැදීමට යොමු කරන්න.
- තම තමන්ගේ මට්ටමින් නත්තල් උත්සවය අර්ථාන්විතව සැමරීමට කළ හැකි දේවල් සිසුන් සමග සාකච්ඡා කරන්න.
- යෝජනා :- පාසල ආසන්නයේ පිහිටි ළමා නිවාසයක් වැඩිහිටි නිවාසයක් හෝ සුදුසු ස්ථානයක් තෝරා ගෙන නත්තල වෙනුවෙන් ඔවුන්ට දිය හැකි කුඩා ත්‍යාගයක් (සබන් කැටයක්, තුවායක්, ලේන්සුවක්, .....) ඔතා එය රැගෙන එන ලෙස පවසන්න. හැකිනම් සිසුන් සමග පාසල් වේලාව තුළදී චාරිකාවක් සූදානම් කරන්න. නොඑසේ නම් හැකි සිසුනට තම දෙමාපියන් සමග නත්තල වෙනුවෙන් සමාජයෙන් වෙන්වූ කොන් කරනු ලැබූ අන් අය සතුටු කිරීමට යමක් කිරීමට පවසන්න.

තක්සේරු කිරීම

| කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක අංකය | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | මට්ටම 4 | මට්ටම 3 | මට්ටම 2 | මට්ටම 1 |
| 4.1 සුවිශේෂ ආගමික උත්සවයකට ක්‍රියකාරීව සහභාගි වෙයි. | 4.1.1 ක්‍රියාකාරීව සහභාගී වීම. | නත්තල් උත්සවය වෙනුවෙන් පන්තියේ කුඩා උත්සවයක් සංවිධානය කර සහභාගී වෙයි. | නත්තල් උත්සවය වෙනුවෙන් පන්තියේ උත්සවයට දායක වෙයි. | නත්තල් උත්සවය වෙනුවෙන් කරන පන්ති උත්සවයට සිසුන්ගේ උදව් ඇතිව සහය දෙයි. | නත්තල් උත්සවය වෙනුවෙන් කරන උත්සවයට සහභාගී වීමට පැකිලෙයි. |
| 4.3 සුවිශේෂී ආගමික උත්සව හෝ සංස්කෘතික උත්සවයක් ආදර්ශනය කරයි. | 4.3.1 ක්‍රිය-ාකාරකම්වල නිරත වීම. | තමන් නත්තල අර්ථාන්විතව සැමරීමට උද්යෝග යෙන් ඉදිරිපත් වෙයි. | තමන් නත්තල අර්ථාන්විතව සැමරීමට ඉදිරිපත් වෙයි. | තමන් නත්තල අර්ථාන්විතව සැමරීමට තවත් සිසුවෙකුගේ සහය ඇතිව ඉදිරිපත් වෙයි. | තමන් නත්තල අර්ථාන්විතව සැමරීමට අපොහොසත් වෙයි. |

## සංකල්පය පරිසර සංවේදීතාවය

## 04 පාඩම - කුරුල්ලන් හා ජලයේ සිටින සතුන් සුරකිමු

දෙවියන්වහන්සේ මැවූ ආකාශ පක්ෂීන් සහ ජලජ සතුන්ගේ ප්‍රයෝජන සොයා බලා උන්ට ආදරය දක්වමින් රැක බලා ගැනීමට යොමු වීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්යසාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 9. ආගමික ශාස්තෘන් වහන්සේලා සොබාදහමේ වටිනාකම ඉස්මතු කළ ආකාරය පිළිබඳව දැනුවත් වෙමින් ක්‍රියා කරයි. | දේව නිර්මාණ | 9.3 සතුන්ට ආදරය කරයි. | 9.3.1 ආදරය කිරීම. |
| | | 9.4 සතුන්ට ආහාරපාන ලබා දෙයි. | 9.4.1 ආහාර පාන ලබා දීම. |

**ඉගෙනුම් සම්පත් :**

- ශුද්ධ බයිබලයේ උත්පත්ති 1:20 - 23 දක්වා.
- විවිධ පක්ෂීන්ගේ රූප රාමු විඩියෝ පට
- විවිධ ජලජ ජීවීන්ගේ රූප රාමු වීඩියෝ පට.
- ළමා බයිබලය (රූප ඇතුළත්)
- A4 කොළ, සඟරා කොළ, හෝ පාට කොළ.
- ගම්, කතුරු

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**ක්‍රියාකාරකම 1**

**පියවර 1**

සිසුන් පාසල් වත්තේ කුරුල්ලන් ගැවසෙන ස්ථානයකට ගෙන යාම. අවට පරිසරයට නිහඬව ඇහුම්කන් දීමට යොමු කිරීම. කුරුල්ලන්ගේ හඬ හඳුනා ගැනීමට හා ප්‍රකාශ කිරීමට අවස්ථාව දීම.

- එළිමහනේ ඉඳ ගන්න සලස්වන්න.
- කුරුල්ලන්ගෙන් අපට ඇති ප්‍රයෝජන ගැන විමසන්න.
- අපෙන් කුරුල්ලන්ට ඇති වාසි හා අවාසි ගැන විමසන්න.
- මෙහිදී පරිසරයේ අලංකාරයට, මානසික සුවයට කුරුල්ලන් අපට මහත් වූ උදව්වක් කරනා බව පවසමින්, එය රස විඳීමට අවස්ථාව දෙන්න.
- විවිධ කුරුළු වර්ගවල පින්තූර රාමු පෙන්වමින් ඒවා ගැන කතා කරන්න.

**පියවර 2**

- පාසලේ මාළු ටැංකියක් හෝ, පොකුණක් මසුන් සහිත තිබේ නම් නැරඹීමට ගෙන යමින් එය වටා ඉඳගෙන හොඳින් ඒ දෙස නිරීක්ෂණය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ඒ අතරට මාළුන් එහෙ මෙහෙ පීනන හැටි, කතාබහ කරන හැටි දරුවන්ට නැරඹීමට මග පෙන්වන්න.
- මාළුවන් හැර ජලයේ ජීවත්වන වෙනත් සතුන් ගැන විමසන්න. පින්තූර පෙන්වමින් ඉස්සන්, දැල්ලන්, පොකිරිස්සන්, කකුළුවන්, බූවල්ලන්, මුහුදු සිංහයන්, මුහුදු අශ්වයන්, කැස්බෑවන් ආදී වශයෙන් ලොකු කුඩා, ඇසට නොපෙනෙන තරම් ජලජ ජීවීන් ජීවත් වන බවත්, ඒවායේ රූප රාමු දරුවන්ට පෙන්වන්න.

**පියවර 3**

- සිසුන්ට කුරුල්ලන්ගේ හා ජලජ ජීවීන්ගේ වීඩියෝ පටයක් නැරඹීමට අවස්ථාව ලබා දෙන්න.
- දෙවියන්වහන්සේ මැවූ මේ සුන්දර ලෝකයේ පක්ෂීන් හා ජලජ ජීවීන්ගෙන් පරිසරය අලංකාර වන හැටිත් ඔවුන් පරිසරයට සිදු කරන සේවාවන් (පරිසර සමතුලිත භාවය පවත්වා ගැනීමට, ඒකාකාරී බව බිඳීමට) මිනිසුන් වන අපට ලබා දෙන මානසික සුවය ගැනත් කතා කරන්න. සාකච්ඡා කරන්න.
- බයිබලයේ උත්පත්ති 1: 20-23 දක්වා කියවන්න. ළමා බයිබලයේ රූප සහිත එම අවස්ථා සිසුන්ට බැලීමට දෙන්න.

පියවර 4

- දරුවන් සමග එකතු වී පාසලේ කුරුල්ලන් ගැවසෙන ස්ථානයේ කුරුළු ලැල්ලක් සෑදීම. කුරුල්ලන්ට, ජලජ ජීවීන්ට කන්න බොන්න දීමෙන් උන්ගේ බඩ පිරෙන බවත් ඉන් තමන්ගේ සිත් සතුටු ලබන ආශිර්වාද ලැබෙන බවත් ප්‍රකාශ කරන්න.
- නිවසේද කුරුළු ලැල්ලක් සෑදීමට දරුවන්ට මග පෙන්වන්න.
- දෙවියන්වහන්සේ මැවූ මේ සුන්දර පක්ෂීන් (කුරුල්ලන්) හා සියළුම ජලජ ජීවීන් ගැන ස්තුති වන්ත වෙමින් යාච්ඤාවක් කරන්න.
- සිසුන් සෑදූ කුරුල්ලා හා මාළුවා තම නම ලියා පන්තියේ එල්ලන්න.

**සිසු ක්‍රියාකාරකම් පොත සඳහා උපදෙස් :**

- ක්‍රියාකාරකම් පොතෙහි සඳහන් කැමති කුරුල්ලා හා ජලයේ සිටින සතුන් දෙදෙනා බැගින් ඇඳීමට මගපෙන්වන්න.
- සමාන වෘත්ත 3ක් සහ කුඩා වෘත්තයක් පාට කඩදාසියකින් කපා සිසු ක්‍රියාකාරකම් පොතේ පෙන්වන ආකාරයට කුරුල්ලා සහ මාළුවා නිර්මාණය කරන්න.
- හොට හා ඇස් අලවන්න.

**තක්සේරු කිරීම**

| කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක අංකය | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | මට්ටම 4 | මට්ටම 3 | මට්ටම 2 | මට්ටම 1 |
| 9.3 සතුන්ට ආදරය කරයි. | 9.3.1 ආදරය කිරීම. | සතුන්ට ආදරය කර අවස්ථාවක් විස්තර කරයි. | සතුන්ට ආදරය කර අවස්ථාවක් තරමක් විස්තර කරයි. | තවත් සිසුවෙකුගේ උපකාර ඇති ව සතුන්ට ආදරය කළ අවස්ථාවක් ප්‍රකාශ කරයි. | සතුන්ට ආදරය කළ අවස්ථාවක් ප්‍රකාශ කිරීමට අපොහොසත් වේ. |
| 9.4 සතුන්ට ආහාරපාන ලබා දෙයි. | 9.4.1 ආහාරපාන ලබා දීම. | සතුන්ට ආහාරපාන ලබා දෙන ආකාරය ප්‍රකාශ කරයි. | සතුන්ට ආහාරපාන ලබා දෙන ආකාරය තරමක් දුරට ප්‍රකාශ කරයි. | සතුන්ට ආහාරපාන ලබා දෙන ආකාරය තවත් සිසුවෙකුගේ උපකාර ඇතිව ප්‍රකාශ කරයි. | සතුන්ට ආහාරපාන ලබා දෙන ආකාරය ප්‍රකාශ නොකරයි. |

# සංකල්පය ආචාර ධර්ම, සාරධර්ම හා සම්මතයන්

## 05 පාඩම - කමාව දුන් ස්තේපන්තුමා

තමාට විරුද්ධවාදීන්ට කමාව දුන් ස්තේපන් තුමා ආදර්ශයට ගනිමින් ශුද්ධවත් ජීවිතයක් ගත කිරීමට පෙළඹවීම මෙම පාඩමේ අරමුණ වේ.

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්යසාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 2. ආගමික ශාස්තෘවරයා/ නිර්මාතෘවරයා පිළිබඳ කතාන්දර හා උපදේශ කාව්‍ය ඇසුරෙන් චරිත සංවර්ධනයට අදාළ සුවිශේෂ ගුණාංග හඳුනා ගනියි. | අලුත් ගිවිසුමේ චරිත | 2.2 ආගමික කතාන්දර ඇසුරෙන් ආගමික ශාස්තෘවරයාගේ සුවිශේෂ ගුණාංග ප්‍රකාශ කරයි. | 2.2.1 සුවිශේෂ ගුණාංග ප්‍රකාශ කිරීම. |
| | | 2.3 ආගමික කතාන්දර ඇසුරෙන් ලබා ගත හැකි ආදර්ශ ප්‍රකාශ කරයි. | 2.3.1 ආදර්ශයක් ප්‍රකාශ කිරීම. |

**ඉගෙනුම් සම්පත් :**

- ස්තේපන් තුමන්ට ගල් ගසන ඡායාරූපයක්
- සොයාගත හැකි නම් වීඩියෝ පටයක්
- ස්තේපන්තුමාගේ පින්තූරයක්
- තරමක් විශාල ගල්, තරමකට කපාගත් කළු කඩදාසි රූප එක සමාන
- කෝටු 2ක්
- ගම්
- ශුද්ධ බයිබලය ක්‍රියා 7 : 54 - 60

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**ක්‍රියාකාරකම** 1

**පියවර** 1

- සිසුන්ට ස්තේපන්තුමන් ගැන ඉතා කෙටියෙන් අත්‍යාවශ්‍ය දේ කියා දෙන්න. (ක්‍රියා 7:54-60) ස්තේපන් තුමන්ගේ පින්තූරයක් පෙන්වා, දෙවියන්වහන්සේටත් එතුමන්ගේ එකම පුත්‍රාවන ජේසුස්වහන්සේටත් ගොඩක් ආදරය ගෞරව කළ අයෙක් බවත් පහදා දෙන්න.
- ස්තේපන්තුමන් ශුද්ධාත්මයෙන් හා විශ්වාසයෙන් පිරුණු පුද්ගලයෙක්. එතුමන් හැමදෙනාටම උදව් වුණා, දෙවියන්වහන්සේ ගැන, ජේසුස්වහන්සේව කුරුසිපත් කළ බවත්, එතුමන් මරණින් උත්ථාන වූ බවත් දැන සිටියා. එය නොබියව ප්‍රකාශ කළා. එනිසා ඔහුව අත්අඩංගුවට ගනු ලැබූ බව සිසුන්ට කියා දෙන්න.

**පියවර** 2

- ස්තේපන්තුමාට ගල් ගසන පින්තූරය පෙන්වන්න. (ක්‍රියා 7:55-57) මෙම කොටස කියවන්න. ස්තේපන්තුමාට ගල් ගසා පීඩා කරන අවස්ථාවේ එතුමා දෙවියන්වහන්සේට යාච්ඤා කරමින් "ස්වාමිනි මේ පාපය මොවුන් පිට නොතැබුව මැනවි" කියා පැවසුවා. ස්තේපන් තුමාට ඒ අවස්ථාවේදී ස්වර්ගයේ ජේසුස්වහන්සේ සිටින අයුරු දර්ශනය වූ බව සරලව විස්තර කරන්න.

**පියවර** 4

ස්තේපන්තුමාගේ ජීවිතයෙන් ගතහැකි ආදර්ශයන් සිසුන් සමග සාකච්ඡා කරන්න.

- ජේසුස් තුළ තිබි ඇදහිල්ල
- උන්වහන්සේ ගැන නොබියව ප්‍රකාශ කිරිම
- ජේසුස්වහන්සේ මරණ මොහොතේ කුරුසියේ දී තමාට පීඩා කළ අයට කමා වූවා සේ, ස්තේපන් තුමාද තමාට ගල් ගසා පීඩා කළ අයට සමාව දීම.

**සිසු ක්‍රියාකාරකම් පොත සඳහා උපදෙස් :**

- ස්තේපන්තුමන්ට ගල් ගසන පින්තූරය සිසුන්ට පාට කිරීමට දීම. ඉන්පසු එය කෝටුවක කොඩියක් සේ රැඳවීම.
- මැද සිසුන්ට මෙම වාක්‍ය ලිවීමට දීම. හිස්තැන පිරවීම (තමාගේ නම යොදා)
- "ගල් ගසන මිනිසුන්ට ස්තේපන් තුමා කමාව දුන්නා වගේ ............ (සිසුවාගේ නම) මට වරද කරන අයට කමාව දෙයි"
- ඒ වටා ලස්සනට සිසුන්ට සැරසීමට දීම.
- එයද කොඩියක් සේ සෑදීම.
- මෙම කොඩි දෙකම තරමක් විශාල ගල් දෙකක් මත ඇලවීම. ඒ සඳහා සුපර් ග්ලූ වැනි ගම් වර්ගයක් භාවිතය. (ගුරුවරයා විසින් එය රැඳවීම.)
- ස්තේපන්තුමාගේ ගුණාංගයන් වටා රවුමක් අඳින්න.

**තක්සේරු කිරීම**

| කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක අංකය | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | මට්ටම 4 | මට්ටම 3 | මට්ටම 2 | මට්ටම 1 |
| 2.2 ආගමික කතාන්දර ඇසුරෙන් ආගමික ශාස්තෘවරයාගේ සුවිශේෂ ගුණාංග ප්‍රකාශ කරයි. | 2.2.1 ආදරය කිරීම | ස්තේපන් තුමන් ළඟ තිබූ උතුම් ගුණාංග ප්‍රකාශ කරයි. | ස්තේපන් තුමන් ළඟ තිබූ උතුම් ගුණාංග කිහිපයක් ප්‍රකාශ කරයි. | ස්තේපන් තුමන් ළඟ තිබූ උතුම් ගුණාංග තවත් සිසුවෙකුගේ උදව් ඇතිව ප්‍රකාශ කරයි. | ස්තේපන් තුමන් ළඟ තිබූ උතුම් ගුණාංග ප්‍රකාශ කිරීමට අපොහොසත් වෙයි. |
| 2.3 ආගමික කතාන්දර ඇසුරෙන් ලබා ගත හැකි ආදර්ශ ප්‍රකාශ කරයි. | 2.3.1 ආදර්ශයක් ප්‍රකාශ කිරීම | ස්තේපන් තුමන්ගේ ජීවිතයෙන් ලබා ගත හැකි ආදර්ශ ප්‍රකාශ කරයි. | ස්තේපන් තුමන්ගේ ජීවිතයෙන් ලබා ගත හැකි ආදර්ශයක් ප්‍රකාශ කරයි. | ස්තේපන් තුමන්ගේ ජීවිතයෙන් ලබා ගත හැකි ආදර්ශයක් තවත් සිසුවෙකුගේ උදව් ඇතිව ප්‍රකාශ කරයි. | ස්තේපන් තුමන්ගේ ජීවිතයෙන් ලබා ගත හැකි ආදර්ශයක් ප්‍රකාශ කිරීමට අපොහොසත් වෙයි. |

## සංකල්පය පාරිසරික සංවේදීත්වය
## 06 පාඩම - දෙවිඳුන් අද්දකිමින් ක්‍රියාශීලි වෙමු

දෙවිඳුන් දුන් ජීවිතය යහපත්ව හොඳ පුරුදු සහිතව ජීවිතය ගෙවීමට යොමු කිරීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්යසාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 10. හිතකර දෛනික චර්යා රටාවක් සඳහා යහපත් සෞඛ්‍ය පුරුදු අනුගමනය කරයි. | යහපත් වටිනාකම් | 10.2 යහපත් සෞඛ්‍ය පුරුදු අනුගමනය කරයි. | 10.2.1 යහපත් සෞඛ්‍ය පුරුදු අනුගමනය කිරීම. |
| 11. දෛනික ක්‍රියාකාරකම්වලදී මනා සිහියෙන් යුතුව කටයුතු කරයි. | | 11.3 සරල භාවනාවක යෙදෙයි. | 11.3.1 නිවැරදි ඉරියව් අනුගමනය කිරීම. |

**ඉගෙනුම් සම්පත් :**
- පාසල තුළ, දේවස්ථානයක හෝ එළිමහනක, නිශ්චල ස්ථානයක් නම් වඩා සුදුසු යි.
- සුදු රෙදි කඩකින් ඔතන ලද බෝනික්කෙක්
- ගව ඔරුව සඳහා කාඩ්බෝඩ් පෙට්ටියක්
- ගුරුතුමිය (මරියතුමිය ලෙස) ලා නිල් හෝ සුදු පැහැති රෙද්දකින් හිස වැසෙන සේ සැරසී සිටින්න.
- වර්ණ ගැන්වීමට අවශ්‍ය ද්‍රව්‍ය

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**
**ක්‍රියාකාරකම 1**
**පියවර 1**
පන්ති කාමරයෙන් බැහැර එළිමහනේ සුදුසු නිශ්චල ස්ථානයකට සිසුන් රැගෙන යන්න.
නැගිට ශරීරය සැහැල්ලුවෙන් තබාගෙන තම හුස්ම ඉහළ පහළ වැටෙන ආකාරයට සිත් යොමු කරන්න සිසුන්ට උපදෙස් දෙන්න.

- දැන් නාස් පුඩුවලින් හුස්ම ඉහළට ගැනීම හා මුඛය විවෘත කර හුස්ම පිට කිරීමේ ව්‍යායාමයට යොමු කරවන්න.
- ඉන්පසු පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලබා ගැනීම පිණිස සාකච්ඡාවකට යොමුවන්න.
    - පවුලක පුංචි බබෙකුගෙ උපත ඔබ දැක තිබේද?
    - ඒ වට පිටාව කෙසේද?
    - අලුත උපන් දරුව ඉන්න තැන පිරිසිදුයි නේද?
    - පිළිවෙලකට හැම දේම තියෙනවා නේද?. මොනවද ඒ?
    - බාබාගෙ ඇඳුම් එක් පසෙක. වතුර/ කිරි බෝතලය .......... සිසුන්ට පිළිතුරු දෙන්න ඉඩ හරින්න.
    - කිරි බීල ඉවර වුනහම මොනවාද ඇහෙන්නෙ? ඔව්. අම්මා බබා නලවනවා. අම්මා දරු නැළවිලි ගී ගයනවා.
    - බබාට නිද ගන්න නිශ්ශබ්දතාවය අවශ්‍යයි නේද? 'ශබ්ද කරන්න එපා බබා හොඳටම නිදි.' යනුවෙන් ගුරුතුමිය පවසමින් නව දරුවෙකු නිවසට ගෙනෙන ලද අවස්ථාවට අවතීර්ණ වීමට සිසුන්ට ඉඩ ප්‍රස්ථාවක් සලස්වා දෙන්න.
    - 'ශබ්ද කරන්න එපා' - අපි එවැනි ඉල්ලීම් වලට කීකරු විය යුතුයි.

පියවර 2

ජේසුස්වහන්සේගේ උත්පත්තිය සිහි ගන්වන ආකාරයේ පහත සඳහන් ප්‍රශ්න අසමින් සිසුන් සමග තවදුරටත් සාකච්ඡා කරන්න.

- දෙසැම්බර් මාසෙ කිතුනු අපට වැදගත් ඇයි?
- දෙසැම්බර් මස කිතුනු අපි සිහිපත් කරන විශේෂ උත්සවය මතකද? ඔව්, නත්තල
- නත්තල කියන්නෙ ජේසු බිළිඳුගෙ උපන් දිනයයි. දැන් අපි සියලු දෙනාම නිශ්චල වෙමු.
- සරල භාවනාවකට සූදානම් වෙමු. නිශ්චලව ගීතයට සවන් යොමු කරවන්න.

(මෙම ගීත අතරින් ඔබට සුදුසු ගීතයක් හෝ කොටසක් හඬ පටිය මගින් සිසුන්ට ඇසෙන්නට සලස්වන්න හෝ ගුරුතුමිය ගායනා කරන්න.)

උදා - 01.

දොයි දොයි දොයි පුත - බයි බයි බයි පුත
මා පුත නැලවෙන්නා
දොයි දොයි නැලවෙන්නේ - බයි බයි
නැලවෙන්නේ.

රන්වන් මුහුණක - රන් රැස් විහිදෙන
රන් පුත නැලවෙන්නා - දොයි දොයි..........

දෙව් හඬ නගමින - දෙව් දූතු නමදින
දෙව් පුතු නැලවෙන්නා - දොයි දොයි..........

සුරලොව නරලොව - දෙලොවම පිනවන
සුර පුතු නැලවෙන්නා - දොයි දොයි..........

උදා - 02.

සඳ මඬලින් වැඩිය පුතේ
වලාකුලින් පැමිණි පුතේ
මගෙ පාළුව මකා ගන්න
සුර දෙව්දූන් එවූ පුතේ

කුස පිරුණේ නැතත් සොඳින්
මගෙ සිත ඇත පිරී නිතින්
මගෙ පුතු මා ළඟ ඇත්නම්
මුළු ලෝකෙම මගේ වගේ

පියවර 3

සිසුනට සිතුන දේ විමසමින් සාකච්ඡා කරන්න.

- දෙමව්පියන් අලුත උපන් දරුවා වන ඔබවද මේ ආකාරයෙන්ම ආදරයෙන්, හොඳ සිහි කල්පනාවෙන් යුතුව. හොඳ පුරුදු අනුගමනය කරමින්, රැකබලා ගත් බව පැහැදිලි කරන්න.
- පිරිසිදුකම, පිළිවෙලට වැඩ කිරීම, වැඩිහිටි අයට හා අන් අයට උදව් උපකාර කිරීම දිනෙන් දින වැඩි වර්ධනය කර ගත යුතු බව පහදන්න.

පියවර 4

යහපත් හොඳ පුරුදු යනු කුමක්ද? සාකච්ඡා මගින් උදාහරණ සහිතව පාඩම ඉදිරියට ගෙනයන්න.

- පිරිසිදුකම - දත් මැද පිරිසිදුව තබා ගැනීම. කෑමට පෙර දෑත් සේදීම. පිරිසිදු ඇඳුම් භාවිතය. හොඳ සිහියෙන් යුතුව ආහාර ගැනීම. කෑමට පසු එම භාජන සෝදා පිරිසිදු කිරීම.
- පිරිසිදු සමබර ආහාර පාන ගැනීම.
- ශරීරියට හා මනසට අවශ්‍යය සුවය - නින්ද, විවේකය, භාවනාව, ව්‍යායාම, සිත ප්‍රබෝධමත් කරන ක්‍රියාවන්

**පියවර 5**

- ශරීරයට ආහාර අවශ්‍ය වගේම මනසටත් අවශ්‍ය දේ බොහොමයි. සාකච්ඡා කරන්න.
- පොත් පත් කියවීම, චිත්‍ර ඇඳීම, ගීත ගායනය, නර්තනය හා ක්‍රීඩා දක්ෂතා වැඩි වර්ධනය කිරීමෙන් තම මනසට මහත් සුවයක් ලැබෙන බව පැහැදිලි කරන්න.
- විනෝදාංශ වලට යොමු වීම - උදාහරණයක් ලෙස අම්මට තාත්තට මල් පැල හෝ බෝගයක් සිටුවන්න උදව් කිරීම, සතුටින් විනෝදයෙන් කළ හැකි බව පවසන්න.

**පියවර 6**

ජේසුස්වහන්සේ කුඩා කල ජීවත් වූ ආකාරය තම ජීවිතාදර්ශය කර ගැනීමට සිසුන්ට කියා දෙන්න.

- ජේසුස්වහන්සේ කුඩා කල දෙමව්පියන්ට වැඩිහිටියන්ට කීකරුව වැඩුන බව.
- ජේසුස්වහන්සේ කුඩා කල ඉතා සතුටින් දෙමව්පියන්ට උදව් කළ බව.
- ඒ හැම දේම පිළිවෙලට ඉටුකළ බව පැහැදිලි කරන්න.
- ඔබත්, කුඩා කල සිට සරල භාවනාවකට සිත යොමු කරමින්, එදිනෙදා ක්‍රියාකාරකම්වල දී මනා සිහියෙන් යුතුව කටයුතු කරන්න.
- ඔබ ක්‍රියාශීලි දරුවෙක් මෙන් අන් අයට උදව් කරන්න.

**සිසු ක්‍රියාකාරකම් පොත සඳහා උපදෙස් :**

- සිසුන් දෙමව්පියන්ට, වැඩිහිටියන්ට උදව් කරන ආකාරය දැක්වෙන වර්ණ චිත්‍රය බලා ඔවුන් කරන දේ හඳුනා ගන්න මග පෙන්වන්න.
- ඔබත් කඩිසර දරුවෙක් මෙන් අන් අයට උදව් කිරීමට ඉදිරිපත් විය යුතු බව කියන්න.
- බයිබල් පාඨය සිසුන් සමග කියවන්න.

**තක්සේරු කිරීම**

| කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක අංකය | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | මට්ටම 4 | මට්ටම 3 | මට්ටම 2 | මට්ටම 1 |
| 11.3 සරල භාවනාවක යෙදෙයි. | 11.3.1 නිවැරදි ඉරියව් අනුගමනය කිරීම. | ආගමික වතාවත්වල නිරතවීමේදී නිවැරදි ඉරියව් ප්‍රදර්ශනය කරයි. | ආගමික වතාවත්වල නිරතවීමේදී තරමක් දුරට නිවැරදි ඉරියව් ප්‍රදර්ශනය කරයි. | ආගමික වතාවත්වල නිරතවීමේදී තවත් සිසුවෙකුගේ සහය ඇතිව නිවැරදි ඉරියව් ප්‍රදර්ශනය කරයි. | ආගමික වතාවත්වල නිරතවීමේදී නිවැරදි ඉරියව් ප්‍රදර්ශනය කිරීමට අපොහොසත් වෙයි. |
| 10.2 යහපත් සෞඛ්‍ය පුරුදු අනුගමනය කරයි. | 10.2.1 යහපත් සෞඛ්‍ය පුරුදු අනුගමනය කිරීම. | යහපත් සෞඛ්‍ය පුරුදු ප්‍රකාශ කරයි. | යහපත් සෞඛ්‍ය පුරුදු තරමක් දුරට ප්‍රකාශ කරයි. | යහපත් සෞඛ්‍ය පුරුදු තවත් සිසුවෙකුගේ සහය ඇතිව ප්‍රකාශ කරයි. | යහපත් සෞඛ්‍ය පුරුදු ප්‍රකාශ කිරීමට අපොහොසත් වෙයි. |

**ක්‍රිස්තියානි ධර්මය ගුරු මාර්ගෝපදේශය (සි)**
**1 ශ්‍රේණිය**